# වියට්නාම් විප්ලවය ආරක්ෂා කරව්!

රෝහණ විජේවීර

**සකල දේශවාසී නිර්ධනයිනි සමගිවව්!**

# වියට්නාම් විප්ලවය ආරක්ෂා කරව්!

රෝහණ විජේවීර

**1978 සැප්තැම්බර් 06 වෙනි දින**
**රෝහණ විජේවීර සහෝදරයා විසින්**
**කොළඹ නව නගර ශාලාවේදී**
**"වියට්නාම් විප්ලවය ආරක්ෂා කරව්"**
**යන මැයෙන් පවත්වන ලද දේශනය**

නියමුවා ප්‍රකාශන

වියට්නාම් විප්ලවය ආරක්ෂා කරව්! - රෝහණ විජේවීර

© නියමුවා ප්‍රකාශන

ISBN 978-955-8696-27-9

පළමු මුද්‍රණය -2012 අප්‍රේල්

ප්‍රකාශනය - නියමුවා ප්‍රකාශකයෝ
464/20, පන්නිපිටිය පාර,
පැලවත්ත,
බත්තරමුල්ල.

දුරකතන - 011-2785612
ෆැක්ස් - 011-2786050

විද්‍යුත් තැපෑල - niyamuwanews@gmail.com
වෙබ් - www.jvpsrilanka.com

මුද්‍රණය - ටී.ඩී.එල්. ප්‍රින්ටර්ස් ප්‍රයිවට් ලිමිටඩ්,
43/43, වලව්වත්ත පාර,
ගංගොඩවිල,
නුගේගොඩ.

## වචනයක්

වියට්නාම් විප්ලවය ආරක්ෂා කරව්! යන මැයෙන් ජනතා විමුක්ති පෙරමුණේ නිර්මාතෘ අපේ සදාදරණීය නායක රෝහණ විජේවීර සහෝදරයා 1978 සැප්තැම්බර් 06 වැනිදා කොළඹ නව නගර ශාලාවේදී පැවැත්වූ දේශනය ඒ ආසන්නයේදීම පොත් පිංචක් ලෙස මුද්‍රණය කොට බෙදා හැරීමට ජනතා විමුක්ති පෙරමුණේ ප්‍රකාශන අංශය පියවර ගත්තේය.

ජීවිතාන්තය දක්වා සිර දඬුවමකට යටත් කරනු ලැබ සිටි රෝහණ විජේවීර සහෝදරයා ඇතුළු දේශපාලන සිරකරුවන් සියලු දෙනා ශ්‍රී ලංකාවේ වැඩකරන ජනතාව, ශිෂ්‍ය පරපුර හා ජනතාව විසින් දියත් කරන ලද ප්‍රබල උද්ඝෝෂණ හේතු කොටගෙන 1977 අගදී කොන්දේසි විරහිතව නිදහස් කරන්නට එවකට බලයේ සිටි එක්සත් ජාතික පක්ෂ ආණ්ඩුවට බල කෙරිණි. එතැන් සිට ජනතා විමුක්ති පෙරමුණේ දේශපාලන කටයුතු වඩා වැඩි ජවයකින් යුක්තව ඉදිරියට යන්නට විය.

එම වකවානුව තුළදී ඇමරිකා එක්සත් ජනපදය ප්‍රමුඛ අධිරාජ්‍යවාදය පිට පිට දරුණු පරාජයන්ට මුහුණ දෙමින් තිබුණි. 1975 අප්‍රේල් මස 30 වැනිදා වීරෝදාර වියට්නාම් ජනතාව එක්සත් ජනපද අධිරාජ්‍යවාදයට බරපතළ ලජ්ජා සහගත පරාජයක් ලබාදී අධිරාජ්‍යවාදී හමුදා වියට්නාමයෙන් පළවා හැරීමට සමත් විය. අධිෂ්ඨාන සහගත ජනතාවකට අතිශයින්ම කෲර අයුක්ති සහගත දැවැන්ත යුද බලයක් අභිබවා සිටිය හැකි බව එදා ඔප්පු වූයේ, ලොව පුරා වෙසෙන සමාජවාදීන්, ප්‍රජාතන්ත්‍රවාදීන්

හා මානව හිතවාදීන් අසීමිත ලෙස සතුටට පත් කරමින්ය; මානව වර්ගයාගේ අංක එකේ සතුරා වන අධිරාජ්‍යවාදයේ ඉක්මන් අවසානය පිළිබඳ විශ්වාසය තහවුරු කරමින්ය.

වියට්නාම් ජනතා ජයග්‍රහණයෙන් පසුව 1979 දී ඉරානයේදීත්, නිකරගුවාවේදීත් ඇමරිකා එක්සත් ජනපද අධිරාජ්‍යවාදය පිට පිට දැවැන්ත පරාජයන්ට මුහුණ දුන්නේය.

කෙසේ වෙතත් අධිරාජ්‍යවාදය යළි හිස එසවීමට සමත් විය. එසේ වූයේ අධිරාජ්‍යවාදය එය සතුව තිබූ දැවැන්ත ආර්ථික-දේශපාලන-යුදමය ශක්තිය නැවත මානව වර්ගයාට එරෙහිව ඒකරාශි කර ගැනීමට සමත් වූ නිසා පමණක් නොවේ. අධිරාජ්‍යවාදය මහ පොළොව මතින් අතුගා දැමීම දක්වා සිදුවිය යුතුව තිබූ ලෝක පරිමාණයේ ජනතා අරගලයට නායකත්වය දියහැකි ශක්තිමත් ජාත්‍යන්තර අධිරාජ්‍යවිරෝධී ව්‍යාපාරයක් ලෝකයට අහිමිව තිබූ නිසාය. වියට්නාමයේ පැරණි මිතුරන් වියට්නාමයට කඩා වදින්නේ, එවන් කණගාටුදායක තත්වයක් තුළය.

අධිරාජ්‍යවාදයට එරෙහිව යෝධ මිටකට ඒකරාශි විය යුතුව තිබූ මිතුරු බලවේග බෙදා වෙන්කරලීමට, සතුරන් කරලීමට තරම් අධිරාජ්‍යවාදය උපාය-උපක්‍රම අතින් ප්‍රබල විය; සිය අබල දුබල යුද යන්ත්‍රය අසීමිත ලෙස නවීකරණය කර ගන්නටද අධිරාජ්‍යවාදය පමා නොවීය.

අනික් අතට අධිරාජ්‍යවාදය එහි අලුත්ම මුහුණුවර වූ නව ලිබරල්වාදී ධනවාදය මගින් ලෝකයේ සෑම අස්සක් මුල්ලක්ම සිය ප්‍රාග්ධනයට යට කිරීම ඇරඹීය. එක්සත් ජනපද අධිරාජ්‍යවාදය ප්‍රකාශයට පත් කළ පරිදිම නව ලෝක රටාවක් ස්ථාපිත විය. සෝවියට් දේශය ප්‍රමුඛ නැගෙනහිර යුරෝපයේ සමාජවාදී රාජ්‍ය පද්ධතිය කඩා වැටුණි.

එහෙත් මේ වන විට අධිරාජ්‍යවාදය ආර්ථික මූල්‍යමය, දේශපාලනමය, සමාජමය හා සදාචාරමය වශයෙන් බංකොළොත්භාවයට වැටී ඇත. මේ තත්වය තුළ අධිරාජ්‍යවාදය මානව වර්ගයාගේ අවසානය සනිටුහන් කිරීමට තරම් සාහසික වී ඇත; අමානුෂික වී ඇත.

මේ විනාශය වැළැක්වීම ලොව පුරා වෙසෙන අධිරාජ්‍යවිරෝධී, පරිසරහිතකාමී සියලු ජනතාවන්ගේ පරම යුතුකම විය යුතුය.

මෙම පොත්පිංච තුළ අඩංගුවන්නේ 1978 සමයේ පැවති ජාත්‍යන්තර හා ජාතික දේශපාලනය තුළ පැවති ගැටලු පිළිබඳ රෝහණ විජේවීර සහෝදරයා කළ විග්‍රහයකි. ජාත්‍යන්තර වශයෙන් සමාජවාදී කඳවුර චීන සෝවියට් ලෙස කඳවුරු දෙකකට බෙදී සිටි අතර එය වියට්නාම් විප්ලවයටද හානි කරමින් තිබිණ. ජාතික වශයෙන් ලංකාවේ පැරණි වමේ ව්‍යාපාරයද ඉහත බෙදීමට අනුව බෙදී කටයුතු කරමින් ලාංකේය

විප්ලවයේ ගමන් මගට බාධාකරමින් තිබිණ. රෝහණ සහෝදරයා සිය විග්‍රහය ඉදිරිපත් කරන්නේ එම තත්වය තුළය. මේ වන විට ලෝක දේශපාලනය තුළ මෙන්ම ලාංකේය දේශපාලනය තුළද පවතින්නේ එදා පැවති තත්වයට වඩා වෙනස් තත්වයකි. එහෙත් ලෝක විප්ලවය සඳහාත් ලාංකේය විප්ලවය සඳහාත් විවිධ පන්නයේ වෙස් මුහුණු ලා සිටින අවස්ථාවාදීන් පැරදවිය යුතුය යන්න අදටද සත්‍යයකි. මෙම පොත් පිංච එම සත්‍යය වඩා හොඳින් අවධාරණය කරයි.

අධිරාජ්‍යවිරෝධී, අරගලයේදී ජනතාවට එරෙහිව පෙළ ගැසෙන ජාතික හා ජාත්‍යන්තර බලවේග හඳුනා ගැනීමටත් ඒවාට එරෙහිව සංවිධානය වීමටත්, සටන් කිරීමටත් විජයග්‍රහණයන් අත්පත්කර ගැනීමටත් මෙම පොත් පිංච ඉවහල් වේ යයි අපි සිතමු.

**නියමුවා ප්‍රකාශකයෝ**
**2012 අප්‍රේල් 05**

ආදරණීය ගමනායක සහෝදරයාගෙන් අවසරයි,

ගෞරවණීය භික්ෂූන් වහන්සේලාගෙන් අවසරයි,

ආදරණීය සහෝදර සහෝදරියනි,

ගමනායක සහෝදරයා කීවා වගේම මේ ස්ථානයේදී අපි 1970 අගභාගයේදී අවසානයට කරපු දේශනය පැවැත්වූයේත් වියට්නාම් විප්ලවය ආරක්ෂා කිරීම පිළිබඳවයි. එදා අපට වියට්නාම් විප්ලවය ආරක්ෂා කරන්න වුණේ වෙනස් තත්ත්වයන් යටතේ. අදත් අපි මේ දේශනය කරන්නේ, මේ රැස්වීම පවත්වන්නේ වියට්නාම් විප්ලවය ආරක්ෂා කිරීමට. අද වියට්නාම් විප්ලවය ආරක්ෂා කරන්න වෙලා තියෙන්නේ එදාට වඩා වෙනස් තත්ත්වයන් යටතේ. සහෝදරවරු දන්නවා, අපි හිරගෙවල්වල ඉන්දෙද්දි තිබුණා කෑවේ බීවේ නැතිව උඩ පැන පැන හිටපු දවසක්. 1975 අප්‍රේල් මාසෙ 30 වෙනිදා. බොහොම සන්තෝසයක් තිබුන හිරගෙවල්වල. ඇයි? වියට්නාම් විප්ලවය දිනුවා. සහෝදරවරු දන්නවා, රූකඩ ඇමරිකන් ආණ්ඩුවේ සයිගොන් නුවර තිබුණ ජනාධිපති මන්දිරයට සෝවියට් දේශයේ හදාපු වියට්නාම් ජාතික හමුදාවට අයත් යුද්ධ ටැංකියක් ඒ ගේට්ටු දෙකම දෙබෑකරගෙන ගිහිල්ලා වියට්නාම් ජාතික විමුක්ති කොඩිය ඒ රූකඩ ජනාධිපති

මන්දිරයේ එසවුවා. එදායින් ඇමරිකන් අධිරාජ්‍යවාදයට විරුද්ධව අවුරුදු ගණනාවක් තිස්සේ ගෙනගියපු, ලෝක ඉතිහාසයේ අද්විතීය නමක් දරන වියට්නාම් විමුක්ති සටන තීරණාත්මක ජයග්‍රහණයක් අත්පත් කර ගත්තා.

ඒ ජයග්‍රහණය අත්පත් කරගන්නට ඉස්සර වෙලා ඇමරිකන් අධිරාජ්‍යවාදයට විරුද්ධව වියට්නාම් ජනතාව සන්නද්ධ අරගලයක් ගෙනයන අවස්ථාවේදී වියට්නාම් ජනතාවට සහයෝගය දෙන්න ලෝකය පුරාම ඉන්න විප්ලවවාදීන් සංවිධානය වුණා. සහෝදරවරුන්ට මතක ඇති, එදා 1960 ගණන්වලත්, 1970 ගණන්වල මුල් භාගයේත් මුළු ලෝකය පුරා ඇමරිකන් විරෝධී පෙළපාලි පැවැත්වූව. කම්කරු පංතිය, තරුණ තරුණියෝ, වෙනත් පීඩිත පංති ජනතාව වියට්නාමයට සහයෝගය දක්වන්න. ඇමරිකාවෙ නගර සියල්ලක්ම මේ විදියෙ පෙළපාලිවලින් වැහිලා ගියා. එංගලන්තයේ, ප්‍රංශයෙ වැනි ධනපති රටවලත් එහෙමයි තිබුණ තත්ත්වය. ඒ දවස්වල වියට්නාමය ආරක්ෂා කරගන්න සමිති සංවිධාන හැම තැනම හැදුවා. 1975 අප්‍රේල් 30 වෙනිදා වියට්නාම් විප්ලවය ලබාපු ඒ තීරණාත්මක යුද්ධමය හා දේශපාලන ජයග්‍රහණයෙන් පස්සෙ ලෝකයේ සෑම විප්ලවවාදියෙකු විසින්ම සිතුවෙ වියට්නාම් විප්ලවය ආරක්ෂා කිරීමේ කටයුතු මෙතැනින් නවත්තල දාන්න සිද්ධවෙනවා කියලා, තවත් අවශ්‍ය නෑ කියලා. බොහෝ දෙනා ඒ විදියට තමයි හිතුවෙ. නමුත් කණගාටුවට මෙන් නැවතත් එම සමිති සංවිධාන යළිත් පණ ගන්වලා, යළිත් සංවිධානය කිරීමේ අවශ්‍යතාවය වියට්නාම් විප්ලවය ආරක්ෂා කරන්න අද ලෝකය පුරාම අති මහත් වැදගත් සාධකයක් බවට පත්වෙලා පෙරට එමින් තියෙනව. මෙන්න මේ තත්ත්වය යටතේ තමයි, අපිත් කල්පනා කළේ තමුන්නාන්සේලාත් එක්ක මෙන්න මේ ප්‍රශ්නය කතා කරන්න ඕනැයි කියල.

සහෝදරවරු දන්නවා පසුගිය මාස තුනක් විතර මම පක්ෂය වෙනුවෙන්, එක පැත්තකින් මගේ ලෙඩට බේත් ගන්නත් අනෙක් පැත්තෙන් පක්ෂය විසින් මට පවරපු වගකීම් කීපයක් ඉෂ්ඨ කරන්නත් යුරෝපයෙත් වෙනත් රට වලත් විප්ලවවාදී ව්‍යාපාර සමග සාකච්ඡා කිරීමේ නිරතවෙලා හිටිය. ඒ හැම තැනකදිම දක්නට ලැබුණ දෙයක් තමයි, ඒ කව්රුත් සියලු දෙනාම තේරුම් අරං හිටිය ලෝකයෙ විප්ලවවාදීන් වශයෙන් ආයෙත් සැරයක් වියට්නාම් විප්ලවය ආරක්ෂා කිරීම සඳහා අපට විශාල ප්‍රයත්නයක් දරන්න වෙනවයි කියල. ඇයි?

සහෝදරවරුන් දන්නවා ඇමරිකන් අධිරාජ්‍යවාදීන් 1975 තීරණාත්මක දේශපාලනමය හා යුද්ධමය පරාජයකට පත්වුණා. නමුත් පරාජය භාර අරගෙන, වියට්නාම් ජනතාවට නිදහසේ සාමකාමී ලෙස සමාජවාදී සමාජයක් වියට්නාමයේ ගොඩ නගන්න දීලා පැත්තකට වෙලා දෑත් බැඳගෙන බලාගෙන ඉන්න ඇමරිකන් අධිරාජ්‍යවාදීන් සූදානම් නැහැ. ඒ වෙනුවට ඇමරිකන් අධිරාජ්‍යවාදීන් දැන් අලුත් සෙල්ලමක් පටන් අරන්. ඇමරිකන් අධිරාජ්‍යවාදීන්ට දෙවන ලෝක යුද්ධයෙදි පාවිච්චි කළා වාගෙ දෙතුන් ගුණයක් බෝම්බ ටොන් ගණනින් හෙළුවත් යටපත් කරන්න බැරි වෙච්ච, විනාශ කරන්න බැරි වෙච්ච, දස දහස් ගණන් මිනිස් ඝාතන කරලා, ලක්ෂ ගණන් මිනිස් ඝාතන කරල උපාය මාර්ගික ගම්මාන හදලා, යටත් කරගන්න බැරි වෙච්ච වියට්නාම් විප්ලවය අද වෙනත් ආකාරයකින් විනාශ කරන්නට වැඩකටයුතු සූදානම් කරමින් තියෙනවා. සහෝදරවරු දන්නවා ඇති මේ දවස් වල ලංකාවෙත් තිබුණ වියට්නාමයට විරුද්ධව හොල්මන් කිරීම්. මම ලංකාවට ඇවිල්ලා දවස් දෙකකින් නැත්නම් තුනකින් ''කාම්බෝජයට අත නොතබව්'' කියලා රැස්වීමක් තිබුණලු. ඒක රැස්වීමක් කියන්න බෑ. හතර පස් දෙනෙක් එක්කහු වුනාලු. මේ හැම තැනකදිම වියට්නාම් විප්ලවයට විරුද්ධව කතා කරල තියෙනවා.

ඇයි වියට්නාම් විප්ලවය විනාශ කරන්න අද අවශ්‍ය වෙලා තියෙන්නෙ කාටද? වියට්නාම් විප්ලවය විනාශ කරන්න අවශ්‍ය වෙලා තියෙන්නෙ කාටත් වඩා ඇමරිකන් අධිරාජ්‍යවාදීන්ට. ඇමරිකන් අධිරාජ්‍යවාදීන් වියට්නාම් විප්ලවය විනාශ කරන්න අවුරුදු ගණනාවක් තිස්සේ යුද්ධමය හා දේශපාලනමය අරගලයක් කරගෙන ගියා. ඒක ඒ ආකාරයෙන් කරගන්න බැරි බව ඒගොල්ලන්ට ඔප්පු වුණා. දැන් ඇමරිකාව අලුතින් දිනාගත්ත මිත්‍රයින්ගේ මාර්ගයෙන් වියට්නාම් විප්ලවය විනාශ කරන්න කටයුතු කරනවා. එදා අපි වියට්නාම් විප්ලවය ආරක්ෂා කරනකොට වියට්නාම් විප්ලවයේ උවමනාවන් වෙනුවෙන් කටයුතු කරනකොට ඇමරිකන් අධිරාජ්‍යවාදය ඊට විරුද්ධව කටයුතු කෙරුවා. අද ඇමරිකන් අධිරාජ්‍යවාදය කෙලින්ම තමන්ගේ අත දාන්නෙ නැතිව බළලුන් ලවා කොස් ඇට බෑවීමේ ප්‍රතිපත්තියක් අනුගමනය කරමින් වියට්නාම් විප්ලවය විනාශ කරන්න හදනවා. ඒ කොහොමද? සහෝදරවරු මේ පහුගිය දවස්වල දකින්න ඇති ධනපති පත්තරවල තිබුණ ඒව. වියට්නාමයයි කාම්බෝජයයි අතර දේශසීමා අරගලයක්

කෙරෙනව. අපි හිරගෙදර ඉන්දෙද්දිත් ඕව ධනපති පත්තරවල තිබුනම අපි විශ්වාස කළේ නෑ. මේක කොහොම වෙන්න පුළුවන් එකක්ද? මේ ළඟකදී චීනෙන් බෙදාහැරල තිබුන පත්‍රිකා ප්‍රකාශන ගණනාවක්. අපි ගාවත් ඒවා තොගයක්ම තියෙනවා. වියට්නාම් විප්ලවයට විරුද්ධව, වියට්නාමයට විරුද්ධව. වියට්නාමය- වියට්නාමය ඇතුළෙ ඉන්න චීන ජාතිකයින්ට තාඩන පීඩන කරනවලු, ගහනවලු, මරනවලු, පන්නවලු, විනාශ කරනවලු, හිරිහැර කරනවලු. අනේ! මේ අසාධාරණයට විරුද්ධව චීන ජාතිකයින් බේරගන්නලු.

මොකක්ද මේ හැබහින්ම වෙලා තියෙන්නෙ. වෙන්නෙ මොනවද? සහෝදරවරු දන්නව වියට්නාමයෙ උතුර සමාජවාදය ගොඩනගද්දි, දකුණ ඇමරිකන් ගැති රූකඩ පාලනයක් යටතේ තිබුණෙ. ධනවාදී සමාජයක් එහි තිබුනෙ. මේ ධනපති දකුණු වියට්නාමයෙ විශාල වෙළඳ ව්‍යාපාරිකයො හිටිය. විශාල ජාවාරම්කාරයො හිටියා. චීන ජාතිකයො. සහෝදරවරු දන්නව ඇති මුළු ගිණිකොනදිග ආසියාවෙම හුඟක් රටවල ඉන්නවා, චීන විප්ලවයට ඉස්සර වෙලා ඉඳල, චීනෙන් සංක්‍රමණය වෙලා ඇවිල්ලා මේ රටවල ඉන්න වෙළඳ ව්‍යාපාරිකයො හා කූට ජාවාරම්කාරයො, චීන ජාතිකයො. ලංකාවෙත් ඔය තියෙන්නෙ චීන හෝටල් එහෙම. හෝටල් පවත්වා ගෙන යන්නේ චීන ජාතිකයො. ඉන්දුනීසියාවෙ ඉන්නවා. කාම්බෝජයෙ හිටිය. වියට්නාමයෙ හිටිය. මේ වාගෙ හැම රටකම හිටියා. මේ රටවල දකුණු වියට්නාමය නිදහස් කරගත්තයින් පස්සෙ වියට්නාම් සමාජවාදී ජනරජය දකුණු වියට්නාමය ධනවාදය නැති කරලා සමාජවාදී සමාජයක් ගොඩනැගීම සඳහා අත්‍යාවශ්‍යක තීරණාත්මක පියවරයන් ගත්ත. ඒ අනුව ධනේශ්වර දේපළ ක්‍රමය අහෝසි කරන්න පියවර ගන්නවා. ඒ පියවර ගන්න තමයි වියට්නාම් ජනතාව සටන් කළේ. වියට්නාමයෙ දකුණු කොටසෙත් උතුරු කොටසෙ වගේම ධනවාදය නැති කරන්න.

අන්න ඒ පියවර ගත්තම අර චීන මුදලාලිලා, චීන බිස්නස්කාරයින්, චීන ව්‍යාපාරිකයින් ඒ ගොල්ලන්ගෙ අර ධනෝපායන නිෂ්පාදන මාර්ග අහිමිවෙලා ගියා. ඒ ගොල්ල ටිකක් කලබලයට පත්වුණා. මෙන්න මේ වගේ කොටසුත්, මෙන්න මේ කොටස්වල අසහනකාරී තත්ත්වය ප්‍රයෝජනයට අරගෙන උසිගැන්වීමක් කරල තියෙනවා වියට්නාමයට විරුද්ධව, එක පැත්තකින්. ඊට අමතරව සහෝදරවරු තේරුම් ගන්න ඕන, වියට්නාමය මුළු මහත් ජනගහනය

කෝටි පහක් විතර ඇති. මේ කෝටි පහෙන් දොළොස් ලක්ෂයක් විතර මම අර කීව විදියට චීනයෙ ඉඳලා සංක්‍රමණය වෙලා ඇවිල්ල වියට්නාමයෙ පදිංචි වෙලා ඉන්න උතුරු හා දකුණු වියට්නාමයෙ පදිංචි වෙලා හිටපු වියට්නාම් ජාතිකයින් ගෙන් සමන්විත වෙලා ඉන්න දොලොස් ලක්‍ෂෙ. මේ දොළොස් ලක්‍ෂෙ අතර දකුණු වියට්නාමයෙ වෙළඳ ව්‍යාපාරිකයො, බිස්නස්කාරයො, කොම්පැනිකාරයො, කර්මාන්තශාලා හිමියො හිටිය වගේම උතුරු වියට්නාමයෙ හිටිය ඉංජිනේරුවො වෙනත් ශිල්පීන්, වෛද්‍යවරු වගේ උදවිය. ඇත්ත වශයෙන්ම කියනවනම් උතුරු වියට්නාමයේ ආකර, පතල් කර්මාන්තෙ අද නවත්තල තියෙනවා. වැඩ කරන්නේ නෑ. පතල් එකක්වත්. ඇයි, මේ පතල්වලට සම්බන්ධ ඉංජිනේරුවො ශිල්පීන් හුඟ දෙනෙක් හිටියෙ මේ හුවා ජාතීන් කියලා වියට්නාම් සහෝදරවරුන් හඳුන්වන චීන ජන්මයක් ඇති ජනතාව. මේ කොටස් තුළ උසිගැන්වීමක් කරල තියෙනවා පහුගිය කාලෙ, චීනයත් වියට්නාමයත් අතර යුද්ධයක් අනිවාර්යය කියලා. ඒ නිසා එහෙම යුද්ධයක් වුනොත් අර චීන ජාතිකයින්ට වියට්නාම් ජනතාවගෙන් අතවර වෙයි කියලා. ඒ නිසා කොයි එකටත් නුවණට හුරුය, එහෙම පැනලා යන එක කියලා. මෙන්න මේ තත්ත්වය යටතේ, ගෙන ගියපු කඩාකප්පල්කාරී උද්ඝෝෂණ ව්‍යාපාරයක ප්‍රතිඵලයක් වශයෙන් මෙතෙක් කල් චීනෙ හිටපු චීන ජාතිකයින් වියට්නාමයෙ හිටපු චීන ජාතිකයින්ගෙන් කොටසකට බල කරලා උසිගැන්වීමක් කරල තියෙනව චීනයට පැනලා යන්නයි කියල. ඇත්ත වශයෙන්ම අද ඉංජිනේරුවන් හා ශිල්පීන් ගණනාවක් වියට්නාමය අතහැරල චීනයට පැනල ගිහින් තියෙනව. මෙන්න මේ පැනල ගියපු තත්ත්වය යටතේ තමයි අද වියට්නාමයෙ නිෂ්පාදන මාර්ග කඩාකප්පල් වෙලා ගිහිල්ල තියෙන්නෙ.

සහෝදරවරුන් දන්නව මේක අලුත් දෙයක් නොවෙයි. ඇල්බේනියාව මේ ළඟදි ප්‍රකාශයට පත් කලා චීනෙත් ඇල්බේනියාවත් අතර තියෙන මතවාදී වෙනස්කම් උඩ ඇල්බේනියාවට දීපු ණය, ආධාර සේරම නැවැත්තුව. ඒ විතරක් නොවෙයි. ගොඩනගමින් හිටපු කර්මාන්ත සේරම බාගෙට නවත්තල, චීනයෙ විද්‍යාඥයින් සහ සියලු දෙනාම- ශිල්පීන්- අස්කර ගන්නයි කියල. මෙතෙන්දි ඊට වඩා වෙනස් තත්ත්වයකින් කඩාකප්පල්කාරී වැඩ කරල තියෙනව. මේ විදියට වියට්නාමයේ හිටපු චීන ජාතිකයින් අතරම චීන තානාපති කාර්යාලය වියට්නාමයට විරුද්ධව ඒ රටේ උසිගැන්වීමක් කරගෙන ගිහිල්ල

තියෙනව. ඊට අමතරව ජගත් පරිමාණයෙන් පටන් ගත්ත වියට්නාම් විප්ලවයට විරුද්ධව උසිගැන්වීමක්. ඇයි මේ? සහෝදරවරු කල්පනා කරන්න පුළුවන්, මේ චීනෙයි වියට්නාමයයි දෙකම විප්ලව දෙකක් දිනපු, විප්ලව දෙකක් ජයග්‍රහණය කරපු ජාතීන් දෙකක්. ඇයි මේ චීනය වියට්නාමයත් එක්කල මෙච්චර කල් හොඳින් නේද හිටියෙ? ඒක තමයි ප්‍රශ්නෙ. වියට්නාම් සහෝදරවරු අපට හමුවුණා. හවානා නුවරදි. අපි හවානා නුවරදි වියට්නාම් සහෝදරවරු සමග දවස් ගණනාවක් සාකච්ඡා කළා මේ ගැන. වියට්නාම් සහෝදරවරු අපට පැහැදිලි ලෙස පෙන්නල දුන්න මොකද වුනේ, මොකද වෙන්නෙ කියල. චීනය උත්සාහ කරල තියෙනව, වියට්නාමයට නොයෙක් ආකාරයෙන් බලපාන්න, වියට්නාම් යුද්ධය කරගෙන යද්දි, වියට්නාමය ඇමරිකන් විරෝධී විමුක්ති සටන කරගෙන යද්දි, ඒ බලපෑම් මගින් වියට්නාමය යටපත් කරගන්න බැරිවුණ තැන තමයි වියට්නාමයට විරුද්ධව කඩාකප්පල්කාරී වැඩ පටන් අරගෙන තියෙන්නෙ.

සහෝදරවරු දන්නවා, 1971 ජූලි මාසෙ මතක්කර ගන්න. 1971 ජූලි මාසෙදි ජාත්‍යන්තර දේශපාලන ක්ෂේත්‍රයේ පෙනුමෙන් මහා පෙරළියක් ඇතිවුණා. පේන්න තියෙන පෙරලියක්. සහෝදරවරු දන්නව, කාටත් හොරෙන් පකිස්ථානයට ඇවිල්ල, පකිස්ථානෙ ඉඳලා චීනෙට ගියා. මුළු ලෝකෙටම හොරෙන් එදා ඇමරිකාවෙ හිටපු රිචඩ් නික්සන්ගෙ විදේශ කටයුතු පිළිබඳ උපදේශකවරයා හෙන්රි කීසිංගර්-කීසිංගර් චිනෙට ගිහිල්ල රහස් සාකච්ඡාවක් කලා චෞ-එන්ලායි එක්ක 1971 ජූලි මාසෙ. ඔයිට ඉස්සර කෑම්ප් ඩේවිඩ් වල කෘෂෙප් සාකච්ඡාවක් කළා, අයිසන්හවර් එක්ක. අයිසන්හවර් එක්ක 1960 ගණන් වල කෘෂෙප් සාකච්ඡා කලාම චීන කොමියුනිස්ට් පක්ෂ නායකයො කීව ''අන්න හොරෙන් ලෝක විප්ලවය දෙගොල්ලක් ඒකකහු වෙලා සාකච්ඡා කරල පාවල දුන්න'' කියල. එතන්දි මොනවද කතා කළේ. අපිත් ඒ කාලෙ චීන නායකයොත් එක්ක එකඟ වුණා. ඔව්! වැරදියි කියල. මෙන්න මේ වැරදියි කියාපු චීන නායකයොම දැන් මෙදා කීසිංගර් හොරෙන් ගෙන්නගෙන ලෝකයටම හොරෙන්, අධිරාජ්‍යවාදී නියෝජිතයෙක් ගෙන්නගෙන සාකච්ඡා කළා. සාකච්ඡාවක් කරල ටික දවසකට පස්සෙ මොකද වුණේ දන්නවද? ඒ සාකච්ඡාවෙ මොනව කතා කලාද කියලා කවුරුවත් දන්නෙ නෑ. ලෝක ජනතාවට ප්‍රගතිශීලි මිනිස් වර්ගයාට නම් කීවෙ නෑ.

හැබැයි ඊට ටික කලකට පස්සෙ මෙන්න මේ දේ වුනා. හැනෝයිවලටයි හයිපොංවලටයි ඇමරිකන්කාරයො බෝම්බ දාන්න ගත්ත මතකද? හැනෝයි නුවරටයි ඒ කියන්නෙ උතුරු වියට්නාමෙ අගනුවරට. හයිපොං නගරෙ, හයිපොං වරාය, වියට්නාමෙ තිබුන ප්‍රධානතම වරාය. ඒ වරායට බෝම්බ තැන්පත් කරා මුහුදෙ, වරාය වටේ. හැනෝයි වලට බෝම්බ දැම්මා. කිසි කෙනෙක් තීරණාත්මක විරුද්ධකම් පෑමක් කළේ නෑ. ඊට ටික කාලෙකට පස්සෙ 1973 ජනවාරි මාසෙ 27 වෙනිද වියට්නාම් සාම සම්මුතිය පැරිස්වලදි අත්සන් කළා. අත්සන් කෙරුව එක්කම චීනය වියට්නාමයට දුන්න යුද්ධ ආධාර නැවැත්තුව සේරම. ආර්ථික ආධාර විතරක් මේ මෑතක් වනතුරු දුන්න. චීනය එදා දකුණු වියට්නාමය නිදහස් කරල නොතිබිච්ච තත්ත්වය යටතේ යුද්ධාධාර නැවැත්තුව කියන්නෙ මොකක්ද ඔයගොල්ලොම කල්පනා කරන්න බලන්න. ඒ කියන්නෙ දකුණු වියට්නාමය නිදහස් කිරීමේ අවශ්‍යතාවය අතහැරල දැම්මයි කියන එකනෙ. එදා දකුණු වියට්නාමය සම්පූර්ණයෙන් නිදහස් කරල තිබුණෙ නැහැ. 1975 අප්‍රේල් 30 වෙනිදා තමයි නිදහස් කරගත්තෙ සම්පූර්ණයෙන්. මේ කාලය තුළ කාම්බෝජයෙත් ඇමරිකන් විරෝධී විමුක්ති සටන ගියා. කාම්බෝජයත් වියට්නාමයත් අතර දේශ සීමා ප්‍රශ්නය අධිරාජ්‍යවාදීන් විසින් ඉතිරි කරල ගිය එකක්. සහෝදරවරු දන්නව, කාම්බෝජයයි ලාඕසයයි වියට්නාමයයි තුනම ප්‍රංශ අධිරාජ්‍යවාදයට යටත් වෙලා හිටියෙ. අධිරාජ්‍යවාදීන්ට මේ දේශ සීමා වැට කඩොලු කියන ඒව තියෙන්නේ කොහේද කියලා වැඩක් නෑ. දේශ සීමාවක් වැට කඩුල්ලක් නැතිව අල්ලන්න පුළුවන් තරම් භූමිය අල්ලන එක තමයි ඒගොල්ලන්ගෙ ප්‍රතිපත්තිය, ක්‍රියාමාර්ගය. ඒ විදියට අල්ලලා හැම යටත් විජිත රටකම හැම අධිරාජ්‍යයක් විසින්ම ඉතුරු කරල ගිහිල්ල තියෙන ප්‍රශ්නයක් තමයි මේ දේශ සීමා ප්‍රශ්නය. මේ දේශ සීමා ප්‍රශ්නය කාම්බෝජයයි වියට්නාමයයි අතරෙත් තිබුණා. මේ ප්‍රශ්නය සාමකාමී ලෙස, සාකච්ඡා මඟින් විසඳන්න ඕනෑයි කියන තැනක මුලින් හිටිය, කාම්බෝජ විප්ලවවාදිනුත් වියට්නාම් විප්ලවවාදිනුත්. සහෝදරවරු දන්නව 1970 සැප්තැම්බර් මාසෙට ඉස්සර වෙලා කාම්බෝජෙ තිබුන ක්මීර් ජනතා විප්ලවකාරී පක්‍ෂය කියල පක්‍ෂයක්. ඔය පක්‍ෂය 1970 සැප්තැම්බර් මාසෙදි නම වෙනස් කළා කාම්බෝජ කොමියුනිස්ට් පක්‍ෂය කියලා. මෙන්න මේ කාම්බෝජ කොමියුනිස්ට් පක්‍ෂයත්, අද වියට්නාම් කොමියුනිස්ට් පක්‍ෂය කියන නම දරන එදා වියට්නාම් කම්කරු පක්‍ෂයත් දොගොල්ලො අතර

මේ පිළිබඳ දිගින් දිගටම සාකච්ඡා ඇති වුණා. සාකච්ඡා ඇතිවෙල ඇතැම් අවස්ථාවල පිළිඅරගෙන තියෙනව දොගොල්ලම දැනට තියෙන දේශසීමා පිලිඅරගෙන ඒ අනුව කටයුතු කරන්න ඕනෑයි කියල. ඔහොම තියෙද්දි වියට්නාම් විප්ලවෙත් කාම්බෝජ විප්ලවෙත් බොහොම ආසන්න වකවානුවක එකිනෙකා ජයග්‍රහණයන් අත්පත් කරගත්ත. ඇමරිකන් විරෝධී අරගලයෙන් ජයග්‍රහණයන් අත්පත් කරගත්ත. මෙන්න මේ ජයග්‍රහණය අත්පත් කරගත් ගමන්ම මොකද සිද්ධ වුනේ? 1975 අප්‍රේල් මාසෙ 30 වෙනිදා වියට්නාමය සම්පූර්ණයෙන් නිදහස් කර ගත්තට දවස් කීපයකට පස්සෙ, හරියටම දවස් පහකට පස්සෙ මැයි 4 වෙනිදා කාම්බෝජ සන්නද්ධ හමුදා වියට්නාමයට පහර දීල පූක්වොක් කියන දූපත අල්ලගත්ත. අප්‍රේල් 30 වෙනිද තමයි නිදහස් කරගත්තෙ හැත්ත පහේ මැයි 4 වෙනිද වියට්නාම් භූමියට පහර දීල කාම්බෝජ හමුදා පුක්වොක් කියන දූපත අල්ලගත්ත. හැබැයි මේ දූපත අල්ලගන්න මීට වඩා පෙරගාමී නායකත්වයක් සපයල තියෙනව චීනෙ.

සහෝදරවරු දන්නව වියට්නාමයට නැගෙනහිරින් ශාන්තිකර සාගරයෙ තියෙනව දූපත් වළල්ලක්. මේ දූපත් වළල්ල උතුරෙන් තියෙන දූපත් සාමාන්‍යයෙන් හඳුන්වනව පාර්සල් දූපත් කියල. වියට්නාම් භාෂාවෙන් ඒ දූපත්වලට කියනව වියොංසා වන්සා දූපත් කියල. මෙන්න මේ වියොසා වන්සා දූපත් වියට්නාමය නිදහස් කරගන්න ඉස්සර වෙලා ඉතිහාසයෙ දීර්ඝ වකවානුවක් පුරාම තිබුනෙ වියට්නාමය සන්තකව. මේ වියට්නාමය සන්තකව තිබූ දූපත් දකුණු වියට්නාමයේ යැංකි රූකඩ ආණ්ඩුව තමයි පාලනය කළේ. යැංකි රූකඩ ආණ්ඩුව පෙරළා දැමීම සඳහා තීරණාත්මක අරගලයක් කරන්නට 1974 සහ 1975 වකවානුවෙදි වියට්නාම් ජාතික විමුක්ති පෙරමුණ සූදානම් වුනා. වියට්නාම් ජාතික විමුක්ති පෙරමුණ මේ ආකාරයෙන් චීන මහජන විමුක්ති හමුදාව කලේ මොකක්ද? මේච්චර කල් වියට්නාම් පාලනය යටතේ තිබ්ච්ච මේ දූපත් ටික තමන්ගේ හමුදා ඇරල අත්පත් කරගත්ත. දකුණු වියට්නාම් පාලනයෙන්. ඒ කියන්නෙ ඒක වියට්නාම් විමුක්ති හමුදාව විසින් අත්පත් කරගන්න ඉස්සර වෙලා ඒගොල්ල අල්ලගත්ත. දැනට ඒගොල්ලන්ගෙ පාලනේ යටතෙ ඒ දූපත් තියෙන්නෙ. ඒ කියන්නෙ වියට්නාමයට අයිති ප්‍රදේශ චීනෙ විසින් අත්පත් කරගත්ත 1974දි. මේ අනුව යමින් කාම්බෝජයත්, වියට්නාමයට අයිති භූමි ප්‍රදේශයක් අල්ලගත්ත. මෙන්න මේ ආකාරයෙන් වියට්නාම් විප්ලවයේ ජයග්‍රහණයට පෙර

ඉඳලම ඊළඟට වියට්නාම් විප්ලවයේ ජයග්‍රහණයත් එක්ක ඉඳලම - කාම්බෝජය පැත්තෙන් ගත්තම - වියට්නාමයට විරුද්ධව සන්නද්ධ අතපෙවීම් කරන්න පටන් ගත්තා. මේ සන්නද්ධ අතපෙවීම් කෙරෙන අවස්ථාවෙදි වියට්නාමය ප්‍රසිද්ධියෙම ඉල්ලීම් කළා සාකච්ඡා මාර්ග යෙන් මේ ප්‍රශ්නය විසඳමු කියල. සාකච්ඡා මාර්ගයෙන් ප්‍රශ්න විසඳමු කීවට ප්‍රශ්න විසඳුනේ නෑ. ඒ වෙනුවට පහුගිය අවුරුදු කීපය තුළම ප්‍රකාශයට පත් නොකෙරුණු දේශසීමා අරගලයක් දේශසීමා යුද්ධයක්, කාම්බෝජයත් වියට්නාමයත් අතර කෙරීගෙන ගියා. මේක තවදුරටත් මේ ආකාරයෙන් කෙරෙන්න බැරි තත්ත්වයකට කරුණු සිද්ධ වුණා. ඒ එක්කම කාම්බෝජය පැත්තෙන් මේ අරගලයට චීනය මැදිහත් වීමක් සිද්ධ වුණා. චීනයත් වියට්නාමයත් අතර යුද්ධයක් අනිවාර්යය කියල ඒ උඩ වියට්නාමෙ ඉන්න චීන ජාතිකයින්ට ආපසු චීනයට යන්න කියල උසිගැන්වීමක් කරල. අද වියට්නාමෙ ඉන්න චීන ජාතිකයින්ගෙ න් වැඩි දෙනෙක් දේශ සීමා ළඟට ඇවිල්ල. දේශ සීමාව ළඟ තෙරපි තෙරපි ඉන්න තත්ත්වයක් ඇතිවුණා. ඊළඟට මේ චීන ජාතිකයින් උසිග න්වල පසුගිය මාස කීපය තුළ චීන වියට්නාම් දේශ සීමාවේ වියට්නාම් මුරකරුවන්ට පහරදීම් කරල තියෙනව. ඊට අමතරව හැනෝයි නුවර පොලිස් ස්ථාන කීපයකට චීන ජාතිකයින් විසින් පහරදීල තියෙනව. එක පැත්තකින් වියට්නාම් විරෝධී ප්‍රචාරයක් කරන ගමන් ඇමරිකන් අධිරාජ්‍යවාදීන් ඇතුළු අධිරාජ්‍යවාදීන්ගෙ ආධාරය පිටුබලය ලබමින්, අනික් පැත්තෙන් වියට්නාම් විප්ලවය විනාශ කිරීම අරමුණු කරගෙන විශාල ප්‍රකෝපකාරී කැලඹීම් ඇති කරගෙන යනව. වියට්නාමය තුළ මෙන්න මේ තත්ත්වය කොච්චර දුරට ඉදිරියට යයිද කියන ප්‍රශ්නය තියෙනව. ඇයි අපි පැහැදිලි ලෙසම දන්නව වියට්නාමයෙ දේශපාලන හා යුද්ධමය පරාජයත් ලබපු ඇමරිකන් අධිරාජ්‍යවාදීන් සූදානම් නෑ වියට්නාම් සමාජවාදී විප්ලවය සාමකාමීව ඉදිරියට වර්ධනය වෙන්න ඉඩදීල දෑස් පියාගෙන දෑත් හකුළාගෙන බලාඉන්න. ඒගොල්ලන්ගෙ උවමනාව තියෙන්නෙ අද වියට්නාම් විප්ලවය විනාශ කරල දාන්න. මොන විදියකින් හරි. ඇයි වියට්නාම් ජයග්‍රහණය ඓක ඓතිහාසික වශයෙන් වගේම ජාත්‍යන්තර පරිමාණයෙන් වැදගත් ජයග්‍රහණයක්. සහෝදරවරු දන්නව, වියට්නාමයට අපි සියලුම දෙනා සහයෝගය දැක්වූයේ ඇයි? එකක් වියට්නාමය සටන් කළේ වියට්නාමය වෙනුවෙන් විතරක් නොවෙයි. වියට්නාමය සටන් කළේත් ජයග්‍රහණය අත්පත් කරගත්තේත් මුළු ලෝකයේම විප්ලවවාදී ව්‍යාපාර වෙනුවෙන්. සහෝදරවරුනි,

ඒගොල්ලො සටන් කළේ අපත් වෙනුවෙන්. අනික් රටවල විප්ලවවාදී ව්‍යාපාර වෙනුවෙන්. ඒ නිසා තමයි චේ එදා කීවෙ ''වියට්නාම් දෙකක් තුනක් බොහෝ ගණනක් බිහිකරව්'' කියල. ඇයි! මේ වියට්නාමය, පුංචි වියට්නාමය තනියෙම ඉඳගෙන ඇමරිකන් බෝම්බ පහර වලට බී-52 නවීනතම ගුවන්යානාවල පහරවලට තනියෙම ඔරොත්තු දීගෙන ඉඳගෙන, විශාල ඇමරිකන් බල හමුදා ප්‍රමාණයක් වියට්නාමය තුළ ගබඩා කරගෙන ඉඳගෙන ඒවත් එක්ක සටන් කරල ඒව පරාජයට පත් කළා. ඒ අවස්ථාව මහගු අවස්ථාවක් වුණා. ලෝකය පුරා විප්ලවවාදීන්ට නැගී සිටින්න. ඇයි? වියට්නාම් යුද්ධය විසින් ධනේශ්වර ක්‍රමය තුළ විශාල ආර්ථික, දේශපාලන අර්බුදයක් ඉස්මතු කෙරෙව්ව. සහෝදරවරු දන්නව මේ වියට්නාම් යුද්ධය නිසා ඇමරිකන් අධිරාජ්‍යවාදයේ මව් රට වෙච්ච, ඇමරිකාව තුළත් අනෙකුත් අධිරාජ්‍යවාදී මව් රටවල් තුළත් විශාල සමාජ ආර්ථික දේශපාලනමය අර්බුදයන් මේරුව. මේක විප්ලවීය දෘෂ්ටි කෝණයකින් බලනකොට ලෝක විප්ලවයේ ප්‍රගතිය සඳහා විශාල වැඩ කොටසක් වියට්නාම් සහෝදරවරු කළේ. මෙන්න මේ විදියට විශාල බලසම්පන්නම ඇමරිකන් අධිරාජ්‍යවාදය, ලෝකෙ තිබ්බ්ච මෙතෙක් අධිරාජ්‍යවාදවලින් ඉතාම නපුරුම අධිරාජ්‍යවාදය පරාජය කරල, විශාල ජයග්‍රහණයක් වියට්නාම් සහෝදරවරු අත්පත් කරගත්ත. මෙන්න මේ ජයග්‍රහණය උපන්ගෙයිදිම මරන්න ආයෙත් සැරයක් ඇමරිකන්කාරයො වලිකනව. කොහොමද?

සහෝදරවරු දන්නව. 1949 ඔක්තෝබර් 01 වෙනිද බොහොම වැදගත් දිනයක් වුණා ලෝකෙ විප්ලවවාදී ව්‍යාපාරවලට. චීන විප්ලවයේ ජයග්‍රහණය. චීන විප්ලවය ජයග්‍රහණය කළාම එක පැත්තකින් විප්ලවවාදීන් සන්තෝෂ වෙද්දි ඇමරිකාවෙ හිටපු රාජ්‍ය ලේකම් උග්‍ර කොමියුනිස්ට් විරෝධියෙක්. ජෝන් පෝස්ටර් ඩලස් මොකද කිව්වෙ ''කලබල වෙන්නෙ නෑ අපි, අපි බයවෙන්නෙ නෑ. චීනය කොමියුනිස්ට් පැත්තට ගියා. අපි විශ්වාස කරනව ඊළඟ පරම්පරාව තුළ චීනය අපේ පැත්තට ආයෙත් සැරයක් ගන්න'' කියල. ජෝන් පෝස්ටර් ඩලස් නම් උගුරෙ පිළිකාවක් හැදිල ඉක්මනින්ම මැරුණා. ජෝන් පෝස්ටර් ඩලස් ජීවත් වුනේ නෑ. චීනය ආයෙමත් සැරයක් ඇමරිකාව එක්ක එක්කහු වෙලා, ලෝක විප්ලවයට හතුරුකම් කරනව දකින්න. නමුත් පෝස්ටර් ඩලස්ගෙ කියමනේ පොඩි සංශෝධනයක් විතරයි කරන්න තියෙන්නෙ, එයා අද වෙනකම් හිටියනම්. ඒ ඊළඟ පරම්පරාව නෙමෙයි

මේ පරම්පරාවෙදිම චීනය අපේ පැත්තට, ප්‍රතිවිප්ලවයෙ පැත්තට, ඇමරිකන් අධිරාජ්‍යවාදයේ පැත්තට අපි දිනාගන්නව කියන එක විතරයි. දිනා ගත්තයි කියන එක. සහෝදරවරු දන්නව, ඊළග පරම්පරාව එන්න ඉස්සර වෙලා චීනය ඇමරිකන් අධිරාජ්‍යවාදයත් එක්ක ඇයි හොඳයිකම් කියන්න, ගනුදෙනු කරන්න, ලෝක විප්ලවයට විරුද්ධව කටයුතු කරන්න පටන්ගත්ත. අද වියට්නාම් විප්ලවයට විරුද්ධව ඇමරිකන් අධිරාජ්‍යවාදය වෙනුවෙන් කටයුතු කරනව පැහැදිලි ලෙස පේනව. ඒක පටන්ගත්තෙ වියට්නාම් විප්ලවයට විරුද්ධව නෙමෙයි. කියුබානු විප්ලවයට විරුද්ධව ඇමරිකන් අධිරාජ්‍යවාදීන් එක්ක හවුලෙ වැඩකටයුතු කරනව. ඊට ඉස්සර වෙලා චිලියෙ විප්ලවවාදී ව්‍යාපාරයට විරුද්ධව ඇමරිකන් අධිරාජ්‍යවාදීන් ඇතුළු උන්ගෙ සහචරයින් එක්ක. ජෙනරාල් පිනෝචෙට් එක්ක ගනුදෙනු කළා. බංගලි දේශයේ විමුක්ති සටනට විරුද්ධව කටයුතු කළා. පෘතුගාලයේ ප්‍රතිවිප්ලවයට පක්ෂව වැඩ කටයුතු කළා. ස්පාඤ්ඤයේ ප්‍රතිවිප්ලවවාදී ප්‍රැංකෝගේ පැත්ත අරගෙන වැඩකටයුතු කළා, විප්ලවවාදී ව්‍යාපාරයට විරුද්ධව, ඇංගෝලාවෙත් ඒදේම කළා.

සහෝදරවරු දන්නව. සී.අයි.ඒ ඒජන්ත කෙනෙක් තමයි පෙන්ටගන් එකයි සී.අයි.ඒ එකමත් පිළිගත්ත. ඒජන්ත කෙනෙක් තමයි රොබේර්ටෝ හෝල්ඩන්. රොබේර්ටෝ හෝල්ඩන්ට තමන්ගෙ උපදේශකයොයි යුද්ධාධාරයි දුන්න. ඇමරිකන් කාරයොත් යුද්ධාධාර දෙද්දි, චීනෙත් ඇංගෝලා විමුක්ති සටනට විරුද්ධව දකුණු අප්‍රිකානු කුලී හටයින් සමග එකට චීන ආධාර ලබන උදවිය වැඩ කටයුතු කළා, ඇංගෝලාවෙ ප්‍රතිවිප්ලවයෙදි. ආසියාවෙත් අප්‍රිකාවෙත් ලතින් ඇමරිකාවෙත් යුරෝපයෙත් හැම තැනකම පසුගිය කාලෙ ඇමරිකන් අධිරාජ්‍යවාදයත් එකක් එකට එක්කහු වෙලා, එකට පූට්ටු වෙලා තමයි චීනෙ ප්‍රතිවිප්ලවවාදී වැඩකටයුතු කළේ. (සභාවෙන් චීන අවස්ථාවාදය භංගවේවා! චීන අවස්ථාවාදය පරාජය කරව්! අත්පොළසන්) සහෝදරවරුනි, මේ විදියට අද මුළු මහත් ලෝකය පුරාම ඔප්පු වෙලා තියෙනව පැහැදිලි ලෙස අද චීනය කොහේද ඉන්නෙ කියල. මුළු මහත් ලෝකයෙම විප්ලවවාදීන් මම යුරෝපයට ගියාම දැක්ක චීනෙට පක්ෂව හිටපු උදවිය, අපිත් කාලයක් චීනෙට පක්ෂව හිටියෙ. අපි ඒ පිළිබඳව ස්වයං විවේචනයක් කරල අපේ වැරදි හරිගස්සගෙන තියෙනව, එදා චීනෙ කිව්ව දේවල් නොවෙයි අද කරන්නෙ කියල. චීන කොමියුනිස්ට්

පක්‍ෂ මධ්‍යම කාරක සභාව 1963 ජුනි 14 වෙනදා සෝවියට් කොමියුනිස්ට් පක්‍ෂ මධ්‍යම කාරක සභාවට ලියුමක් ඇරියා ''ජාත්‍යන්තර කොමියුනිස්ට් ව්‍යාපාරයේ පොදු ක්‍රියාමාර්ගය පිළිබඳව යෝජනාවක්. ඔන්න ඔය යෝජනාවත් එක්ක තමයි අපි එකඟ වෙලා ඒ ගොල්ල එක්ක හිටියෙ. ඒ යෝජනාවෙ කිව්වෙ නෑ ඒ ගොල්ලො සෝවියට් දේශය සමාජ-අධිරාජ්‍යවාදයක් කියල. ඒ ගොල්ලො ඒ යෝජනාවෙ කිව්වෙ නෑ ඒ ලිපියෙ, සෝවියට් දේශය සුපිරි අධිරාජ්‍යයක් කියල. ඒ යෝජනාවෙ ඒගොල්ලො කිව්වෙ නෑ සෝවියට් දේශය තමයි අංක එකේ හතුරා කියල. ඒ යෝජනාවෙ ඒගොල්ලො කිව්වෙ නෑ ඇමරිකන් අධිරාජ්‍යවාදය නෙමෙයි ලෝක ජනතාවගෙ අංක එකේ හතුර කියල. ඒ යෝජනාවෙ ඒ ගොල්ලො කිව්වෙ නෑ ඇමරිකන් අධිරාජ්‍යවාදයයි අනික් අධිරාජ්‍යවාදී බලවේගයයි එක්ක එක්කහුවෙලා සෝවියට් සංගමය කුඩුපට්ටම් කරල දාන්න ඕනැයි කියල. එහෙම කථාවක් ඒගොල්ලො කිව්වෙත් නැහැ. අපි ඒගොල්ල එක්ක එකඟ වුනෙත් නෑ. ඒ ගොල්ලො එදා පිලිගත්තෙ සෝවියට් දේශය සමාජවාදී රටක්. ඒ වුණාට මේ වැරදි ප්‍රතිපත්ති අනුගමනය කරනවයි කියල. ඒක වෙනස් කරන්න ඕනැයි කියල. එහෙම කියල 1963දි, ටිකින් ටික ගිහිල්ල ඒගොල්ලම වැරදියි කියපු දේ, ඒ ගොල්ලො කීව අධිරාජ්‍යවාදයත් එක්ක සාමකාමී සහපැවැත්මක් නෑ කියල. එම ලියවිල්ලෙ.

ඔව්! අපිත් කීව ඔව් අධිරාජ්‍යවාදයත් එක්ක සාමකාමී සහපැවැත්මකට අපටත් එකඟ වෙන්න බෑ කියල, අපි ඒ ගොල්ලන් එක්ක එකඟවුණා. මෙන්න අධිරාජ්‍යවාදින් එක්ක සහපැවැත්මක් නෑ කියපු චීනෙ අද තියෙන්නෙ සහපැවැත්මක්ද? කල්පනා කරල බලන්න. අද ප්‍රසිද්ධියෙම කියනව, සෝවියට් දේශය තමයිලු අංක එකේ හතුරා. සුපිරි අධිරාජ්‍යවාදය. ලෝක තුනක න්‍යායක් ඉදිරිපත් කරල තියෙනව. මේ ඇල්බේනියාවත් ඒගොල්ලොත් එක්ක යාළු වෙලා ඉඳල මෙච්චර කල්, ලෝක තුනේ න්‍යාය පිළිගන්නෙ නැහැයි කියලා කැඩිල ගියා. ලස්සන දෙයක් තියෙනව, අපි 1974 දි ලෝක තුනේ න්‍යායට පහර දුන්න. හිරගෙවල්වලදි. ඒ කාලෙ සමහර උදවිය අපි එක්ක එකගවුණේ නෑ. ''ඕ නෑ නෑ ලෝක තුනක් තියෙනව'' කියල. ඉතින් ඇල්බේනියාව කියනකොට -අපිට ආරංචියි- කියනවලු. ''ලෝක තුනේ න්‍යායක් නෑ''යි කියල. කොහොමහරි කමක් නෑ ලෝක තුනේ න්‍යායක් පිළිගන්නෙ නැත්නම් ඒ ගොල්ලන්, ඒකත් දෙයක්. සහෝදරවරුනි, දැන් තියෙන

තත්ත්වය මොකක්ද? දැන් සෝවියට් දේශය තමයි අංක එකේ හතුර. ඇමරිකන් අධිරාජ්‍යවාදය අංක එකේ හතුර නොවෙයි. ඒ නිසා චීනෙ කියනව නැටෝව ශක්තිමත් කරන්න ඕනලු. සෝවියට් දේශයට විරුද්ධව සහෝදරවරු දන්නව ඇති, නැටෝව කියන්නෙ උතුරු අත්ලන්තික් යුද්ධ සංවිධානය. ඒකෙ හාම්පුතා තමයි ඇමරිකන් අධිරාජ්‍යවාදය. ඇමරිකන් අධිරාජ්‍යවාදි මගපෙන්වීම යටතේ තමයි නැටෝව හදල තියෙන්නෙ. නැටෝව ශක්තිමත් කරන්න ඕනැයි කියන්නෙ, ආයිත් සැරයක් කවුරු ශක්තිමත් කරන්න ඕනැයි කියන එකද? ඇමරිකන් අධිරාජ්‍යවාදය ශක්තිමත් කරනවයි කියන එක. ඒ උඩ දැන් ඒගොල්ලො වැඩ කරගෙන යනව නැටෝව එක්ක හවුල් වෙලා. එක පැත්තකින් මේ ළඟදි ඇමරිකන් අධිරාජ්‍යවාදී ජෙනරාල් ඇලෙක්සැන්ඩර් හේග් නැටෝවෙ අණ දෙන නිලධාරිය, එයා ප්‍රසිද්ධියෙ කියල තියෙනව චීනය නැටෝවෙ එකොළොස්වැනි සාමාජිකයයි කියල. ඒ කියන්නෙ සාමාජිකත්වය අරන් නෑ. නමුත් ක්‍රියාවෙන් එකොළොස්වැනි සාමාජිකයයි කියල. ඇමරිකන් තානාපතිවරයා ටෝකියෝ නුවර ඉන්න මේ ළඟදි කියල තිබුණෙ ''පෙරදිග නැටෝව නම් චීනයයි'' කියල. සහෝදරවරුන්ට පේනව නේද ඇමරිකන් උවමනාවන් ඉෂ්ඨ කරනවද චීනය කියල. ඒ විතරක් නොවෙයි ගිය අවුරුද්දෙ හවානා නුවරදි ප්‍රසිද්ධියේ පුවත්පත් සාකච්ඡාවක් කරමින් පිදෙල් කස්ත්‍රො කිව්ව පැහැදිලි කරුණු ඔප්පු කරන්න කරුණු තියෙනවයි කියල. චීන ඔත්තු සේවාවනුයි, ඇමරිකන් බ්‍රිතාන්‍ය, ප්‍රංශ අධිරාජ්‍යවාදී ඔත්තු සේවාවනුයි එකට එක්කහු වෙලා සහයෝගයෙන් ක්‍රියාකරනවයි කියල. ලෝක විප්ලවයට විරුද්ධව හැම තැනම ආසියාවෙ , අප්‍රිකාවෙ, ලතින් ඇමරිකාවෙ මේ ගොල්ලො එකට එක්කාසු වෙලා ක්‍රියාකරනව දකින්න පුළුවන්. මේක අහම්බෙන් වෙච්ච දෙයක් නොවෙයි. සහෝදරවරුනි එහෙමත් කරල තමයි දැන් අද ඇවිල්ල වියට්නාම් විප්ලවයට විරුද්ධව ඒ ගොල්ල ඇමරිකන් අධිරාජ්‍යවාදින් වෙනුවෙන් ක්‍රියාකරන්න පටන් අරගෙන තියෙන්නෙ.

හැබැයි වියට්නාම් විප්ලවයට විරුද්ධව ක්‍රියාකරන්න යන එක ඒ තරම් ලෙහෙසි වැඩක් නොවෙයි. සහෝදරවරු දන්නව ජාත්‍යන්තර විප්ලවවාදී ව්‍යාපාරය තුළ මේ තරම් ආදරයක්, මේ තරම් භක්තියක්, මේ තරම් සහයෝගීතාවයක් දිනාගනිපු තවත් විප්ලවයක් මේ මෑත කාලෙ කෙරුණෙ නෑ. වියට්නාම් විප්ලවය තරම්. ඒ ගොල්ලන් කරපු පරිත්‍යාග වගේම, ඒ පරිත්‍යාගවලට සමාන වෙන්න පොදු

මහජන සහයෝගිතාවයක් ජාත්‍යන්තර විප්ලවවාදී ව්‍යාපාරය තුළ ඒගොල්ලො දිනාගෙන තියෙනව. මෙන්න මේ තත්ත්වය හින්ද තමයි ඒ ශ්‍රේෂ්ඨ වියට්නාම් විප්ලවවාදී ව්‍යාපාරයට මඩ ගැසීම සඳහා, අපකීර්තියට පත්කිරීම සඳහා ප්‍රයත්නයක් දරමින් තමයි ''අනේ අපේ චීන ජාතිකයින්ට තාඩන පීඩන කරනවෝ! '' කියල කෑගහන්නෙ. උතුරු වියට්නාමෙ හිටිය, ඔය චීන ජාතිකයින්ගෙන් වැඩි කොටසක් උතුරු වියට්නාමය නිදහස් කරගත්තට පස්සෙ වියට්නාම් පුරවැසියො බවට පත්වෙල සාමකාමී ජන දිවියක් ගෙවමින් හිටියෙ. ඒ මිනිස්සුන්ට කවදාවත් එහෙම චීනයට පැනල යන්න උවමනාවක් තිබුනෙ නෑ. දැන් වියට්නාමෙට මඩ ගහනව චීනය. ඔන්න සෝවියට් දේශයෙ පෙරදිග ඒජන්ත ධූරය බාරඅරගෙනය කියල. සහෝදරවරු දන්නව ඇති අපට පහර දීල තිබුන කේ.ජී.බී ඒජන්තලයි කියල. ඒ කියන්නෙ සෝවියට් රහස් ඔත්තු සේවයෙ ඒජන්තලයි කියල මේ ස්ථානෙදි නේද? ආයෙත් යටි උගුලක් අටවලා තියෙනව 'ශ්‍රී ලංකා ස්වාධීනතා ව්‍යාපාරය' කියල. සහෝදරවරුන්ට මතක ඇති අටපට්ටම් අත්වගයක් දාලා. 1971ට ඉස්සරවෙල හදල තිබුන සිකියුරිටි ගාඩ්ලගේ සංවිධානයක් මතකද? වෑන්ඩලුබේලගෙ මාතෘභූමි ආරක්ෂක සංගමය' කියල. ඔය මාතෘභූමි ආරක්ෂක සංගමය තමයි ඒ වෙලාවට කටුස්ස වගේ නමක් ගත්තෙ 'මාඕ තරුණ පෙරමුණ' කියල ඇමරිකන් තානාපති කාර්යාලයට පහර දෙන්න. ඒක උඩ එදාම රාත්‍රීයෙදි බණ්ඩාරනායක නෝනගෙයි, ඇන්.ඇම්.පෙරේරගෙයි, පීටර් කෙනමන් මහත්තයගෙයි ආණ්ඩුව හදිසි නීතිය දාල අපිට අත්අඩංගුවට ගන්න පටන් ගත්ත. එදාම මර්දනය පටන් ගත්ත. පැට්‍රල් බෝතල් ටිකක් විසිකරල ඇමරිකන් තානාපති කාර්යාලයට, පාරෙ ගිය පොලිස් නිලධාරියෙකුට පිහියෙන් ඇන්නා.

දැන් ආයිත් එකක් අටවල තියනව. ඒ අටෝපු එකේ නියෝජිතයො මෙතන ඇවිල්ල කියල තියෙනව වියට්නාමෙට බැනල වියට්නාමෙට මඩ ගහල යෝජනාවක් ඉදිරිපත් කරල විතරක් තියනව. ඒක අනුමත කරගෙනවත් නැහැ. ආපු මිනිස්සුන්ට කියල. කියුබාව නොබැඳී ජාතීන්ගෙන් පන්නන්න කියල යෝජනා කරල තියෙනව. සෝවියට් සමාජ අධිරාජ්‍යවාදයට විරුද්ධව සටන් කරන්නැයි කියල තියෙනව. ජනාධිපති උතුමාණන් වහන්සේට අනතුරු ඇඟවීමක් කරල තියෙනව (සභාවෙන් සිනා) මේ කේ.ජී.බී. කාරයින්ගෙන් ලංකාව බේරග න්න කියල , පරිස්සම් වෙන්න කියල, කේ.ජී.බී කාරයින්ගෙන්. (සභාවෙන්

එදා අපිට සී.අයි.ඒ කාරයො කිව්ව) ඔව්! දැන් හොඳ රහට ඔප්පු වෙලා තියෙනව සී.අයි.ඒ කාරයො කවුද කියල. සී.අයි.ඒ එක භයානක නැහැයි කීවලු. ඒක මැරිල යන එකක් කිව්වලු. දැන් ඉස්සරහට එමින් තියෙන්නෙ සී.අයි.ඒ එක යටපත් කරගෙන කේ.ජීබී එකයි කිව්වලු. (සභාවෙන් සිනා) ඉතින් කේ.ජී.බී එකෙන් වන අන්තරාව ගැන පංතියක් තියල තියෙනව ජනාධිපති උතුමාණන් වහන්සේට. (සිනා) ජනාධිපති උතුමාණන්ගෙ අග්‍රගණ්‍ය පුරෝහිතයන් බවට පත්වෙලා තියෙනව. මේ මාඕ වාදීන් කියාගන්න මිනිස්සු ටික. ඇයි බොහොම අන්තරාවයි මේකෙන් පරෙස්සම් වෙන්නෙයි කියල. ඔව් ඇමරිකන් අධිරාජ්‍යවාදීන් එක්ක ජාත්‍යන්තර වශයෙන්ම මේ කරන සෙල්ලමත් එකක් බැලුවම මෙහෙත් ඕක පුදුමයක් නොවෙයි. අපත් කීයටවත් ඕකට පුදුම වෙන්නෙ නැහැ. ඒ වුණාට එකක්, අපි මේ අවස්ථාවෙදිම කියනව විප්ලවවාදීන්ට පොඩි අනතුරු ඇඟවීමක්. හෙට දිහාවට තමන්ගෙ ගෙදර ඉස්සරහ පිට කළු කොඩි එල්ලන්නට පුළුවන් තමන් නැතිව වෙන අය ඇවිල්ල (සිනා) අන්න ඒ ගැන ගේ ඉස්සරහ, රෑට කව්රුත් කළුකොඩි එල්ලනවද කියල බලාගෙන ඉන්න. දැන් අර ඇමරිකන් තානාපති කාර්යාලයට ගැහුව වගේ දැන් මේ සහෝදරය කළු කොඩි එල්ලගෙන නැහැ එයාගෙ ගෙදර එයා වෙනුවෙන් වෙනින් කෙනෙක් ඇවිල්ල කළු කොඩි එල්ලන්න පුළුවන්, උදේට එයාව පොලිසියට දක්කන්න. මොකද කේ.ජී.බී එක භයානකයිනේ. සහෝදරවරුනි මෙතැන්දි කීවලු විජේවීර කේ.ජී.බී. කාරයෙක් කියල කියන්න අපිට හොඳට කරුණු තියෙනවයි කියල. මොකද මම මොස්කව්වල ඉගෙන ගනිපු නිසා. මම මොස්කව්වල ඉගෙන ගනිපු කෙනෙක් නිසා කේ.ජී.බී. කාරයෙක් නම් ලංකාවෙ ඉගෙන ගනිපු නිසා ඒ මිනිස්සු එම්.අයි. 5 ඔත්තුකාරයො වෙන්න ඕනෑ. ඇයි ලංකාවෙත් තියෙනවනෙ එහෙම එකක්. එම්.අයි.5 කියල දේශපාලන ඔත්තු සේවයක්. එතකොට ඇන්. ඇම් පෙරේරා එංගලන්තයෙ ඇම්.අයි පහේ එක්කෙනෙක් වෙන්න ඕන. ඇයි එයා එංගලන්තෙ ඉගෙන ගත්තනෙ. කොල්වින් ආර්. ද සිල්වත් එහෙමයි. පීටරුත් එහෙමයි. දොස්තර වික්‍රමසිංහත් එහෙමයි. ලස්සනයි තර්කෙ නේද! ඊළඟට දැන් ප්‍රශ්නයක් තියෙනව විජේවීර රුසියාවෙ ගියා. ඔව්! අපි හොරෙන් නොවෙයි ගියේ. පීටර් කෙනමන් උන්නැහේ කියල තියෙනව පැය 24ක් මිනිහ ගුවන්තොටුපලේ විතරක් ඉන්නව කියල. නෑ පැය 24ක් නොවයි මම දවස් 7ක් හිටිය. තමන්ගෙ පක්ෂ සාමාජිකයන්ටත් පච කෙළලා තියෙනව, නෑ නෑ බය වෙන්න එපා. එයාට එහෙම යන්න දෙන්න බෑ.

එයා එහෙම යන්නෙ නෑ. එයා මේ ගුවන් තොටුපළේ ඉඳල එයි කියල. නෑ, මම දවස් 7ක් හිටිය. දවස් දෙකක් මම ඉස්පිරිතාලෙටත් ගියා රුසියාවෙ දවස් 2ක් ඉස්පිරිතාලෙට ගියාම දවස් 7ක් රුසියාවෙ හිටියම කේ.ජී.බී කාරයෙක් වෙනවද?

සහෝදරවරුනි, මෙතන කරන සෙල්ලම හොඳටම පැහැදිලියි. ඇත්ත වශයෙන්ම ඒ මිනිස්සු එදා බොහොම විවෘතව කථා කරල තියෙනව ප්‍රතිවිප්ලවීය උවමනාවන් වෙනුවෙන් ලාංකීය ප්‍රතිවිප්ලවයෙත් ජාත්‍යන්තර ප්‍රතිවිප්ලවයෙත් උවමනාවන් වෙනුවෙන් අද ඔක්කොම එකට පෙල ගැහිල තියෙනව. කල්පනා කරලා බලන්න වියට්නාම් විප්ලවයට පක්ෂව මේ රටේ කරපු දේ මොකක්ද කියල 1975ට ඉස්සර වෙලා. අපිනම් වියට්නාම් විප්ලවය වෙනුවෙන් යම්කිසි දෙයක් කිරීම සඳහා අපේ රටේ සමාජවාදී සමාජ ක්‍රමයක් ගොඩනැගීම තමයි වියට්නාම් විප්ලවයට කරන්න තියෙන හොඳම දේ කියල, දෙන්න තියෙන හොඳම සහාය කියල, අපි ක්‍රියාකරගෙන ගියා. අපිවත් විනාශ කරල දැම්ම. වෙනත් රටවල කම්කරු පංතියට නායකත්වය දුන්නා, විප්ලවවාදීන්, ඇමරිකන් බඩු වර්ජනය කරවී කියල. ඇමරිකන් නැව් වලට තෙල් නොගසව්! ඇමරිකන් නැව් වලට බඩු පැටවීම හා බෑම වර්ජනය කරව්! කියල. ලංකාවෙ කොමියුනිස්ට් පක්ෂෙත් මොකුත් කළාද වියට්නාම් විප්ලවයට පක්ෂව ඔය වගේ? නෑ. හැබැයි දැන්නම් අම්............මේ සුභ පැතුම්වල දිග! දැන් මේ ඊයේ පෙරේදා දැක්ක නේද සුභ පතල වියට්නාම් කොමියුනිස්ට් පක්ෂෙට, වියට්නාම් ජනතාවට. ඔක්කොම මොකද, බඩවඩාගැනීම සඳහා පුළුවන්ද කියල උත්සාහයක් දරන්න. වියට්නාම් විප්ලවයට පක්ෂව නම් කරපු කිසි දෙයක් නෑ. පැයක ස්ට්‍රයික් එකක් මෙහෙයෙව්වද වියට්නාම් විප්ලවයට සහයෝගය දක්වන්න? නෑ වෙනත් රටවල විප්ලවවාදීන් ඔළු පලවගත්ත. කොමියුනිස්ට් පක්ෂ නායකයො වියට්නාම් විප්ලවයට සහයෝගයට පෙළපාලි ගිහිල්ල. මේ රටේ මොකද වුණේ. කිසිම දෙයක් උනේ නෑ. දැන් වියට්නාම් විප්ලවයට ප්‍රීතියට පැදුරු දිගට සුභ පැතුම්. අපිනම් බලාපොරොත්තු වෙන්නෙ නෑ එහෙම අපිට විප්ලවවාදී ව්‍යාපාරය බඩවඩා ගැනිමේ ව්‍යාපාරයක් නෙමෙයි. සහෝදරවරු දන්නව, චීනිසා මේ රුසියාවට අපි යනකොට බොහොම බයවුන උදවිය දැන් පෙළ ගැහිල ඉන්නව අනික් පැත්තට. මොකද ජාත්‍යන්තර වශයෙන් විප්ලවවාදී ව්‍යාපාරයට විරුද්ධව පාරිශුද්ධ සන්ධානයක් ඇතිවෙල තියෙනව වගෙ,

ඇමරිකන් අධිරාජ්‍යවාදයෙ ඉඳන් අන්තිම අවස්ථාවාදියා දක්වා මේ රටෙත් එහෙම තත්වයක් තියෙනව.

සහෝදරවරු කල්පනා කරල බලන්න, අද අපි මේ දේශනය පවත්වන්න යනවයි කියල දැනගෙන මේ දේශනය පවත්වන්න ප්‍රකාශයට පත්කළාට පස්සෙ ඇත්ත පත්තරේ හොඳ තොවිලයක් නටල තියෙනව. පසුගිය 4වෙනිද, මේ පෙරේදා මොකද (ඇත්ත පත්තරේ සභාවට පෙන්වමින් කියවයි) 'විජේවීර කතාකරන්නේ ජනතා විමුක්ති පෙරමුණේ ප්‍රතිපත්තිද? 'අලුත් ව්‍යාවස්ථාව විජේවීරට හොඳලු' (සභාවෙන් සිනා)මේ ඇත්ත පත්තරේට අනුව පසුගිය සිකුරාදා මම පුවත්පත් සාකච්ඡාවක් තියල තියෙනව කොළඹ. මම කොළඹ හිටියෙත් නෑ පහුගිය සිකුරාදා (සභාවෙන් සිනා) මායි වාස් සහෝදරයයි කොළඹින් පිට ගිහිල්ල එදා. හැබැයි අපි බ්‍රහස්පතින්දා නම් පුවත්පත් සාකච්ඡාවක් කළා. සහෝදරවරුනි, ඔය බ්‍රහස්පතින්දා පුවත්පත් සාකච්ඡාවට ඇත්ත පත්තරෙන්වත් ශ්‍රී ලංකා නිදහස් පක්ෂෙ දිනකරෙන්වත් ජනදිනෙන්වත් ආවෙත් නෑ. අපි ඒ පුවත්පත් සාකච්ඡාව මේ ධනපති පත්තරවලින් එන මිනිස්සුන්ගෙ හැටි දන්න නිසාම මුල ඉඳල අගට පටිගත කළා, පක්ෂෙ තීරණයක් අනුව. ඒ පුවත්පත් සාකච්ඡාවට බ්‍රහස්පතින්දා තියාපු 31 වෙනිද මායි බෝපගේ සහෝදරයයි වාස් සහෝදරයයි තුන්දෙනාම සහභාගි වුණා. හැබැයි ධනපති පුවත්පත් ඇහුව නොයෙකුත් ප්‍රශ්න. ඒගොල්ලන්ගෙම වුවමනාවටයි අපි ඒක පැවැත්තුවෙ. මොකද ඒගොල්ලන්ට හුඟක් ප්‍රශ්න අපෙන් දැනගන්න තියෙනවයි කියල. ඒ අහපු ප්‍රශ්නයි ප්‍රශ්නවලට දීපු උත්තරයි සේරම පටිගත කළා. ධනපති පත්තර හතරක ඒක දාලා තිබුණ කවදද? සෙනසුරාදා. සෙනසුරාද දාන්න තීරණය කළෙත් ඒගොල්ල අපිත් එක්ක කථා කරල. බ්‍රහස්පතින්දා සාකච්ඡාව තිබ්බෙ රෑ. සිකුරාදා උදේ නගරෙ මුද්‍රණයට විතරයි දාන්න වෙන්නෙ. ඒ නිසා අපි සෙනසුරාදා හැම පත්තරයකම දාන්නම් කියල. බොහොම හොඳයි කියල අපි කිව්ව. 'හැබැයි එකක්වත් විකෘති කරන්න එපා ඔහේලගෙ හැටි අපි දන්නව. නොදා අරිනව නම් ඊට වඩා හොඳයි' කියල. (සභාවෙන් සිනා) ඒ මිනිස්සු ඊළඟට දන්නවනේ ඔළුව කහ කහ කිය කිය යනව අතනයි මෙතනයි, අපි මොනව කරන්නද සහෝදරය අපි හරියට දුන්නට ලොක්ක කපනවනෙ කියල. ඒකත් ඇත්ත.

කොහොම හරි පත්තර හතරක විතරක් ඕක දැම්ම 'ඩේලි නිව්ස්' 'දිනමිණ' 'දවස' 'සන්' ඒ පත්තර හතරෙම තියෙනව වැරදි.

හැබැයි අඩු වැඩි වශයෙන්. සමහර පත්තර මේ තේරෙන්නෙ නැතිකමට වැරදි කරලයි කියල හිතන්න පුළුවන්. දැන් උදාරහණයක් වශයෙන්, දවස පත්තරේ ගත්තොත් , දවස පත්තරේ තියෙනව විප්ලවය ආයෙත් කොරන්නෙම නෑ....... යි කියල (සභාවෙන් සිනා) සහෝදරවරුනි මගෙන් අහපු ප්‍රශ්නෙ මේකයි. අපෙන් ඇහුව ප්‍රශ්නයක් 1971 මොකක්ද උනේ කියල. අපි කිව්ව 1971 වුන දේ ශ්‍රී ලංකා නිදහස් පක්‍ෂයයි සමසමාජයයි, කොමියුනිස්ට් පක්‍ෂයයි තුන්ගොල්ලන්ටම ඕනැ වුනා ජනතා විමුක්ති පෙරමුණ විනාශ කරන්න. අපි පළවෙනි රැස්වීම තියන කොට හයිඩ්පාක්වල 1970 අගෝස්තු 10 වෙනිදා, 9 වෙනිදා පත්තරේ දාලා තිබුන. පෝය දවසෙ පත්තරයක් එදා දාලා තිබුණ මුල් පිටුවල ලොකුවට සුභසිංහ මහත්තයයි, කෙනමන් මහතත්යයි, බර්නාඩ් සොයිසා මහත්තයයි ශ්‍රී ලංකා සමසමාජ- කොමියුනිස්ට් පක්‍ෂ තුන වෙනුවෙන් අත්සන් කරල ප්‍රකාශයක්, ජනතා විමුක්ති පෙරමුණ ප්‍රතිග ාමී සංවිධානයක් ය ඒක වහාම විනාශ කරල දාන්න කියල. මතකද? හැබැයි විනාශ කරල දාන්නයි කියල ඉල්ලුවත් 1970වෙම අගෝස්තු මාසෙ ජනතාව ඒක විනාශ කළේ නෑ. ඒක ආරක්‍ෂා කළා. ඉන්පස්සෙ ඒගොල්ල කළේ මොකක්ද? ඒ රැස්වීම තියල දවස් දෙකකට පස්සෙ අගෝස්තු 12 වෙනිද එදා ඒ තුන් හවුල් ආණ්ඩුවෙ හිටපු රාජ්‍ය ආරක්‍ෂක අමාත්‍යංශයේ ස්ථිර ලේකම් ආතර් රාජ් කුමාර් රත්නවේල් පත්තරවලට කිව්ව, දැන් මේ ඔළුව උස්ස ගෙන එන චේ ගෙවාරා සංවිධානය තමයි අපේ ආණ්ඩුවේ අංක එකේ හතුරා කියල. ඒ නිසා මේ අංක එකේ හතුරා හඹාගෙන ගිහිල්ල වහාම විනාශ කරල දාන්න ඕනැයි කියල. (සභාවෙන් සිනා) කිව්ව වගේම කරන්න ලෑස්ති වුණා. ඒගොල්ල ඒක කරන්න ගිය නිසා තමයි ජනතා විමුක්ති පෙරමුණට ආරක්‍ෂක පියවරයන් ගන්න උනේ. අපි කිව්ව ඒ ආරක්‍ෂක පියවරයන් ගැනීමේ ප්‍රතිඵලයක් වශයෙන් තමයි 1971 තත්ත්වය ඇති වුණේ කියල. ඕක අපි පැහැදිලි කළාම ඒ මිනිස්සු ඒක හරියි කියල පිළිගත්ත. හොඳයි ඊළඟට අපිට කියන්න සිද්ධවුණා. ඔය පුවත්පත් සාකච්ඡාවෙදි අපිට විරුද්ධව දැන් කරන දේවල් සහෝදරවරුනි, සමසමාජ පක්‍ෂයටයි, කොමියුනිස්ට් පක්‍ෂයටයි පංති තියෙනකොටයි සාකච්ඡා තියෙනකොටයි ඔන්න දැන් ඒ ගොල්ලන් පංති තියෙනව, සාකච්ඡා, තියෙනව-ඔළු පලන්නෙ නෑ ගහන්නෙ නෑ. නමුත් අපේ පක්‍ෂයෙ උදව්යට දැනුත්ඃ මේ යූ.ඇන්.පී ආණ්ඩුවක් රටපුරාම අපේ සහෝදරවරු මර්දනය කරනව. එකක් දෙකක් නොවෙයි.

අපි දැන් පෙත්සම කීයක්ද? හතරක්ද පහක්ද, හතරක් නැත්නම් පහක් ඇරල තියෙනව ආරක්ෂක අමාත්‍යංශයට, ජනාධිපතිට සේරටම දැන ගන්න. මොකද පසුගිය සැරේ අපරාධ යුක්ති විනිශ්චය සභාව ඇහුව උඹලව මර්දනය කළා නම් ඇයි කිව්වෙ නැත්තෙ කියල. මේ පාර අපි මෙච්චර ගොඩක් ලියල තියෙනව මර්දනය කරපුව. කරපුව, කරපුව, කරපුව. මේ ගිය සතියෙ වැලිමඩ උඩව පරණගම ආසනයෙ මැදගම කියන ගමටම ගිහිල්ල- චණ්ඩි පැනල ගහල එන්නෙ මිනිස්සුන්ට,-ඒ වගේ පොලිසියෙන් ගිහිල්ල ගහල ඇවිල්ල එහේ ප්‍රසිද්ධියේ ඉන්න ජනතා විමුක්ති පෙරමුණේ අයට. ඇයි ප්‍රසිද්ධ රැස්වීමක් සාර්ථකව තිබ්බට පස්සෙ ඉස්පිරිතාලෙ එක සහෝදරයෙක් ඇටයක් කැඩිල බදුල්ල රෝහලේ. ඒ.එස්.පී ට පැමිණිලි කළා. දැන් නඩු කියන්න යන්නෙ පොලිසියට විරුද්ධව, වැලිමඩ. මේ ආසන්නම සිද්ධිය. රටපුරාම හැම තැනම. ඉතින් අපි ඕව ඉදිරිපත් කළා. මෙන්න අපි ජනාධිපතිටත් ලියල තියෙනව. මෙන්න අපි ආරක්ෂක ඇමතිටත් ලියල තියෙනව. මෙන්න අපි පොලිස්පතිටත් ලියල තියෙනව. මේවා සේරම මෙහෙමයි කියල අපි ඉදිරිපත් කළා. ඉදිරිපත් කරගෙන යනකොට පත්තරකාරයො ඊළඟට ප්‍රශ්නෙ ඇහුව 'හොඳයි දැන් මේ ආණ්ඩුවත් ඔහෙලව මර්දනය කරගෙන යනවනෙ. ඔහෙල එතකොට ආයෙ සැරයක් ගියපාර වගේ ආයුධ සන්නද්ධ අරගලයක් කරනවාද කියල. (සභාවෙන් සිනා) තේරුණාද වැඩේ (සභාවෙන් සිනා) ඉතින් දෙයියනේ, මම කීව නෑ නෑ ගියපාර අපි පාඩමක්, හොඳ ඉගෙනගෙන තියෙනව. ඒක අපි කීයටවත් කොරන්නෙ නෑ කියල. වැරදිද? ඉතින් පත්තරේ දාල තියෙනව විප්ලවනම් කීයටවත් කොරන්නෙ නෑයි කියල. ඒක තමයි මේකෙ කියන්නේ. හරිද?

කොහොම වුණත් අපි ප්‍රශ්නෙ ගනිමු. මේ පත්තරේ, පත්තරකාරයො අපෙන් ඇහුව ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාව ගැන මොකද කියන්නෙ කියල. ඒක දවස පත්තරේ තියෙනව තියෙනව ඔන්න පොඩ්ඩක්. නව ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාව ධනේශ්වර දේපළ ක්‍රමය රකින ව්‍යවස්ථාවක් මං කිව්වයි කියල. අපි කිව්ව මේකත් ධනපති දේපල ක්‍රමය රකින එකක් ඉස්සෙල්ල තිබ්ච්ච එකත් ධනපති දේපල ක්‍රමය රකින එකක් කියල. තිබ්ච්ච එකත් ජනතාව මර්දනය කරන එකක්, මේකත් ජනතාව මර්දනය කරන එකක් කියල. අරගොල්ල හැදුවෙත් ජනතාව මර්දනය කරන එකක්, මේගොල්ලො හැදුවෙත් ජනතාව

මර්දනය කරන එකක්, ඒ ගොල්ලන්ගෙ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවටත් මහජන ආරක්ෂක පනත ඇතුල් කළා. මේගොල්ල හදපු එකටත් මහජන ආරක්ෂක පනත ඇතුල් කළා. ඒනිසා මේකට වඩා අරක හොඳයි කියන්න බෑ. අරකට වඩා මේක හොඳයි කියන්නත් බෑ. අපි මේ දෙකටම විරුද්ධයි කියලත් කීවා. ඒක විතරක් නොවෙයි සහෝදරය, අපි කිව්ව මේ දෙකම ප්‍රජාතන්ත්‍රවාදී ලෙස අනුමත කරපු දෙකක් නොවෙයි කියල. පහුගිය එකයි මේ පාර එකයි. ඇයි? ඒ ගොල්ලොත් ඡන්දෙදි කීවා ''ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් හදනු ලැබේ'' කියල. ඒ හදන එක මොනවගේද කියල කීවෙ නෑ. (සභාවෙන් සිනා) කිව්වද? නෑ. මෙන්න මේ වගන්ති වලට ඡන්දෙ දෙන්න කියල කිව්වද? ඒ නිසා අපි හිතනව ප්‍රජාතන්ත්‍රවාදය කියල කියනව වගේම කොරනව නම් ඒක හදාපු එක ජනමත විමසුමකට ඉදිරිපත් කළ යුතුයි කියල. අපි කිව්ව කියුබාවෙ හැදුව විප්ලවවාදී ආණ්ඩුව පිහිටෙව්වට පස්සෙ අලුත් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක්, පුද්ගලික දේපළ ක්‍රමය නැති කරල සාමූහික දේපල ක්‍රමය රකින්න ව්‍යවස්ථාවක් එතන හැදුවෙ. ඒක හදල හැම සංවිධානයකටම, හැම ගමක් ගානෙ, හැම වැඩපලක් ගානෙ හැම ආයතනයක් ගානෙ ඇරිය. ඇරල කල් දුන්න. ඉගෙන ගනිල්ල, අධ්‍යයනය කරපල්ලා කියල. අධ්‍යයනය කරලා යෝජනා එවාපල්ලා කියලා. එව්වා, යෝජනා ජනතාව විසින් එව්ව. ඊට පස්සෙ නැවත ඒව සේරම සලකලා බලලා, ඊට පස්සෙ ජනමත විමසුමක් කළා. සහෝදරවරුනි, සියයට අනූපහයි දශම ගණනක් ඒ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට ඡන්දෙ දීපු නිසා තමයි අද ඒක කියුබාවෙ වලංගු වෙන්නෙ, ක්‍රියාවට නගන්නේ, කියල අපි ඒ ගොල්ලන්ට පැහැදිලි කරල දුන්න. (අත්පොලසන්) පැහැදිලි කරල කිව්ව. ඒ විතරක් නොවෙයි. අපි කවද හරි අලුත් ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාවක් හදනව.

සහෝදරවරුන්ට මතක ඇති අපේ විප්ලවීය ප්‍රතිපත්ති ප්‍රකාශනේ පළමුවන වගන්තියේ තියෙන්නෙ ''නිර්ධන පංති රාජ්‍ය බලය ස්ථාපිත කරනු ලැබේ!'' කියල පළමුවෙනි වගන්තියේ පළවෙනි කොටස. දෙවන කොටසෙ තියෙන්නෙ නව සමාජවාදී ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් හදනු ලැබේ! කියල, නේද? තුන්වන කොටසෙ කියන්නේ මේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව ජනමත විමසුමක් සඳහා ඉදිරිපත් කරනු ලැබේ. කියල නේද? (අත්පොළසන්) ඉතින් එහෙමනම් ඇත්තකාරයට ඔල්මාදෙම තමයි ඇයි ආවෙත් නෑ (සභාවෙන් සිනා) දවල් හීන පේනව ඇති දැන් මං හිතන්නෙ පීටර්ලට. සහෝදරවරුනි, අපි මේ ධනපති ආණ්ඩුක්‍රම

ව්‍යවස්ථාවලට අපේ ආකල්පය ඉතාම පැහැදිලියි. සම්මන්ත්‍රණ ගණනක් අපේ සහෝදරවරු දේශපාලන මණ්ඩලයෙ කථා කරල තියනවනේ. මේ පහුගිය දවස්වල සම්මන්ත්‍රණ ගණනක්, අපේ ස්ථාවරය පැහැදිලි කරන්න. අපි මේ ධනපති ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවලට විරුද්ධයි, අපි ඒක මහජන විමසුමකට ඉදිරිපත් කරනවයි කියල, අලුත් එකක් හැදුවම කියල අපි කීවෙ. දවස පත්තරෙත් වාක්‍යයක් තියෙනව මේක ධනපති දේපල ක්‍රමය රකින ව්‍යවස්ථාවක් මේකෙ තියෙන්නෙ සියයට අනූ එකයි කියුබාවෙ ඡන්දය විමසලා ලැබුනෙ කියල. අනූඑක නොවේ අනූ පහක්. හරිද?

කොහොම වුණත් මේ ඇත්ත පත්තරකාරයයි, දිනකරකාරයයි මේව කොහෙන්ද ගත්තෙ? අපි පුවත්පත් සාකච්ඡාව තිබ්බෙ තිස්එක් වෙනිද. දෙවෙනිද පත්තර වල, ධනපති පත්තරවල අරක ගියා. හතරවෙනිද පත්තරේ තමයි මේ දෙගොල්ලො දාන්නෙ. දිනකර පත්තරේ තියෙනව 'යූ.ඇන්.පී ව්‍යවස්ථාව විජේවීරට ටොපේ ටොප්ලු' (සභාවෙන් සිනා) ඇයි දෙයියනේ, මේක මගේ බහුජාතික සමාගම් අපේ තියනවනේ ඒවා ගෙනල්ල ආයෝජනය කරන්න. ඇයි ටොපේ ටොප් වෙන්න ඕනැ එහෙමනෙ. නැද්ද? ගමනායක සහෝදරයට, වාස් සහෝදරයට, බෝපගේ සහෝදරයට, කෙලි සහෝදරයට, මට. අපිනේ මේ කොම්පැණිකාරයො මේ රටේ. දන්නෙ නැද්ද? (සභාවෙන් සිනා) කොම්පැනි අලුතෙන් හදන්නෙත් අපි, අක්කර සිය ගණනක් තිබුනෙත් අපිට, අක්කර දහස් ගණන් තියෙන්නෙත් අපටනේ. මේව කියල රෙදි ඇදන් යන්න මේ මිනිස්සුන්ට ලැජ්ජා නැතිකම, රෙදි ඇඳන් යනවනේ. අපි එක අභියෝගයක් කරනව කියාපල්ලා කොහෙන්ද ගත්තෙ මේක කියල. එතකොට තෙරෙනව උඹලගෙ ගුරුන්නාන්සෙල කවුද කියල. පීටර් කෙනමන් පුළුවන්නම් කියාපන් මේ පත්තරයට මේ වාර්තාව ගත්තෙ කොහෙන්ද කියල. (සභාවෙන් අවස්ථාවාදී පචපත්තර, අවස්ථාවාදී පච පත්තර හංගවේවා) සහෝදරවරුනි, ඇත්ත පත්තරේ ගුරා තමයි යූ.එන්.පී ආණ්ඩුවෙ පත්තර. ඇයි කොහෙන්ද මේවා හදල අලුතෙන් වැඩි කළේ? ඩේලි නිව්ස් කාරයයි, දිනමිණ කාරයයි දෙන්නගෙන් තමයි අරගෙන තියෙන්නෙ. තෙරුම් ගියාද? ඇත්තෙ ගුරුන්නාන්සෙ දිනමිණ, දිනකරේ ගුරුන්නාන්සේ දිනමිණ අපේ නම් නොවෙයි. මෙච්චර කල් අපට අවලාද ගැහුවෙ යූ.ඇන්.පී කාරයො කියලා. අපි දැන් හොයාගෙන තියෙනවා යූ.ඇන්.පී එකට සහාය දෙන

මිනිස්සු. අපි බව නැතුව කියනව. අපි කියන දේ වගකීමත් භාරග න්නවා. සහෝදරවරු කල්පනා කර බලන්න මේ අවස්ථාවේදි යූ.ඇන්.පී එකට විරුද්ධ මිනිස්සු යූ.ඇන්.පී එකට පක්ෂයි කියල කියන්න ඕනෑකම තියෙන්න ඕනැ කාටද? යූ.ඇන්.පී එකට නොවෙයිද ඒ ඕනෑකම තියෙන්නෙ? යූ.ඇන්.පී එකට විරුද්ධ උදවිය හා මෙන්න මේ ගොල්ලොත් අපිට පක්ෂයි කියල කියන්න ඕනැකම තියෙන්නෙ යූ.ඇන්.පී එකට නේද ජනතාව ඉදිරියේ? එහෙම නේද? මේ ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාවට විරුද්ධව ජනමතයක් ඇතිවෙද්දි මේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට පක්ෂයි කියල කියන්න ඕනෑකම තියෙන්නෙ යූ.ඇන්.පී එකට නොවෙයිද? යූ.ඇන්.පී එකට තමයි. අන්න ඇත්ත පත්තරේ ඒ උවමනාව ඉෂ්ඨ කරනව. කවුරුත් දන්නව ජනතා විමුක්ති පෙරමුණයි, කොමියුනිස්ට් පක්ෂයයි ගත්තම කොහොමද? සංසන්දනය කරන්න පුළුවන්ද? ඇත්තෙන්ම නෑ විදියක්, නේද? (සභාවෙන් සිනා).

කොමියුනිස්ට් පක්‍ෂ උදවිය හරි ලස්සනට කරුණු මවනව, ගොතනව, කිසිම පත්තරයක ධනපති පත්තරයක, පුවත්පත් සාකච්ඡාවකට ආපු තිබුනෙ නෑ. සමසමාජ පක්‍ෂයි, කොමියුනිස්ට් පක්‍ෂයි බලයට ඒම අපි වළක්වනවාමයි කියල කිව්වයි කියල. ඇත්ත පත්තරේ නම් ඒක තියෙනව. හැබැයි උසාවියෙදි මේවා හොයා ගන්න පුළුවන්. අපි දෙගොල්ලන්ටම. (සභාවෙන් සිනා) මොකද ජනතා විමුක්තිපෙරමුණේ දේශපාලන මණ්ඩලය තීරණය කරල තියෙනව සහෝදරවරු දන්නව, මේ සෙල්ලම කරන්න හැමදාම දෙන්න බෑ. ඒ නිසා මේගොල්ල ධනපති උසාවියටත් ගෙනහිල්ල එතනත් හෙළිදරව් කරන්න. ඒක නිසා අපි බාරදීල තියෙනව ඒක නීතිඥයින්ට. හොඳයි බලමු සමසමාජ කොමියුනිස්ට් පක්ෂ දෙකම හෝ ශ්‍රී ලංකා නිදහස් පක්‍ෂට බලයට එන්න දෙන්නෙ නැතෝ කියල කිව්වයි කියන කථාව. මේ සමසමාජ කොමියුනිස්ට් පක්ෂ දෙක දෙයියනේ බලයට එන්නත් කල්පනා කරනවද දැන්? (සභාවෙන් මහ හඬින් සිනා හා අත්පොලසන්) සහෝදරය, මමනම් හිතුවෙ නෑ කවදාවත් මං හිතනව ධනපති පත්තර කාරයොවත් හිතන්නෙ නෑ. ඒ නිසා මගෙන් එහෙම ප්‍රශ්නයක් ඇහුවෙත් නෑ. මං එහෙම දෙයක් කතා කළෙත් නෑ. (සිනා. සභාවෙන් ඔවුන් හැළි ගෑවිල යනව) හැළි ගෑවිල ඉවරයි. සහෝදරවරුනි, හැළි ගෑවිල ඉවරයි!! (දීර්ඝ අත්පොලසන්) මෙන්න ලස්සන කතාවක් හදලා ඔන්න බලයට එන්න හදනව, අපි එන්න දෙන්නෙ නෑ කියල. (සිනා) අපි නොවෙයි මේ

සේරම මිනිස්සු කරපු ජරමර වැඩ දන්නවනම් සහෝදරවරු දන්නව ඇති, ගමේ මිනිස්සු සර්පයෙක් දැක්කම මොකද කියන්නෙ ''අරගිය පොල්ල ගහපිය' කියලනේ (සභාවෙන් සිනා) සර්පයෙක් දැක්කම. මුන් කරල තියෙන දේවල්, කරන දේවල් හරියට දන්නවනම් හරිද- රටේ කම්කරු පංතිය කියන්නෙ 'අරගිය පොල්ල ගහපිය' කියල. (සභාවෙන් සිනා) සර්පයින්ට වගේ. මිනිස්සු තාම දන්නෙ නෑ. මුං කරපු දේවල්. කරන දේවල්. යූ.ඇන්.පී එකේ නිදහස් ඊනියා නිදහස් ධනේශ්වර සංවර්ධන ප්‍රතිපත්තියෙන් ගජරාමෙට ලාභ ලබන්නෙ මුන්. සහෝදරය අපි ඒක ප්‍රසිද්ධියේ කියනව. අපේ පක්‍ෂයෙ කිසිම කෙනෙක් නෑ පඩි ගත්තෙ දාස් ගණන්, මහාරාජාස්ලගෙන්, මහාරාජාස්ලගෙන් දහස් ගණනින් පඩි අරගෙන ධනපති කොම්පැනිකාරයින්ට සේවය කරන අය, ධනපති පංතියෙ ඒජනත්ලද? නැද්ද? මම කියනව ඇන්.ඇම්. අනිල් මුණසිංහ ඇවිල්ල කියාපන්. උඹලගෙ පක්‍ෂෙත් එහෙම අය ඉන්නවද නැද්ද කියල. (සභාවෙන් සිනා) සහෝදරවරුනි මේව අරගෙන මේ විදියට ධනපති පංතියෙන් යැපිල ඉඳගෙන, ධනපති පංතියට සේවය කරනව. අපි දන්නව ඇත්ත පත්තරේ උදවියත්, කොයි කොයි බිස්නස් කරනවද කියල. අපි ඒව හෙලිදරව් කරන්නම් ධනපති උසාවියෙදි. ඒක හොඳ තැනක් ඒවා හෙළිදරව් කරන්න. ඒගොල්ලන්ගෙම කටින් ගන්න. අපි නොකියා, ධනපති ක්‍රමය, දේපල ක්‍රමය රකින්න අද අවශ්‍ය වෙලා තියෙනව. මේ රටේ විප්ලවවාදී ව්‍යාපාරයට මඩ ගහන්න. විප්ලවවාදී ව්‍යාපාරයට විරුද්ධව වැඩ කරන්න. අද ඒකට ඒකාබද්ධ පෙරමුණකට ඇවිල්ල ඉන්නවා ඔය සියලු දෙනාම ජනතා විමුක්ති පෙරමුණට විරුද්ධව. සහෝදරවරු දන්නව යූ.ඇන්.පි ය ජනතා විමුක්ති පෙරමුණ මර්දනය කරගෙන යනව. පොලිසිය ලව්ව, රහස් පොලිසිය ලව්ව ශ්‍රී ලංකා නිදහස් පක්‍ෂය හෝ ගාලා මඩ ගහගෙන යනව. සමසමාජ පක්‍ෂය, කොමියුනිස්ට් පක්‍ෂය හෝ ගාලා මඩ ගහගෙන යනව. ඔය මාඕවාදී කල්ලි ටිකක් එහෙමයි. සේරම එකට එක්සත්ව එක් පෙරමුණක ඉන්නව. අර මාඕවාදියෙක් මෙතන කථා කරපු, ස්වාධීනතා ව්‍යාපාරයෙ කිව්වලු, දැන් ජනතාව විකල්පය හැටියට විජේවීරල තෝරනව. ඒක නිසා ඒක බොහොම භයානකයි කියල. ඒක නිසා ඒක නැති කරන්න ඕනැයි කියල. බළලා මල්ලෙන් එළියට පනිනව දැන්. ඒකයි කියන්න නොහිටිය දේවලුත් කියනව. දැන් හොඳ ලස්සන දෙයක් තියෙනව ඊට වඩා ඇත්තකාරයා ප්‍රවෘත්ති මැව්ව. ඇයි ආවෙත් නෑ. දන්නෙත් නෑ. කිව්ව දේකුත් නෙමේ කියන්නෙ. ඊළඟට ඒක උඩ කතුවැකියකුත් ලිව්ව.

විජේවීර කථාකරන්නෙ ජනතා විමුක්ති පෙරමුණේ ප්‍රතිපත්තිද අහනව. නෑ විජේවීර නෙමෙයි පීටර් කෙනමන්නෙ ජනතා විමුක්ති පෙරමුණේ ප්‍රතිපත්ති කථා කරන්නෙ. (සභාවෙන් සිනා)

සහෝදරවරුනි ඊළඟට කොහොමද කියල කියනවනම් අර ග්‍රීක් දාර්ශනිකයෙක් කියල තියෙනව 'ද්වේශය හා බිය නිසා මිනිස්සු අතවර කරති' කියල. ද්වේශයයි බියයි නිසා මං දන්නව පීටර් කෙනමන්ගෙ ලේ රත්වුණා මේ දවස්වල මොකද මම විශ්වවිද්‍යාලෙ ඒකෙ ඉගෙන ගන්න කාලෙ බොරු කේලම් කියල මට ආයි මොස්කව් යාම නැවැත්තුව. මම ආයෙත් කවදාවත් යන්න හිතාගෙන හිටියෙත් නෑ. ඇයි ඉතින් මේ ඇතිවෙච්ච තත්ත්වය යටෙත. කොහොම හරි මිනිහ අන්තිම මොහොත වෙනකම් හිතාගෙන හිටිය මූට නම් කොහොමටවත් ආයි යන්න වෙන්නෙ නෑ. පැය විසිහතරක් ගුවන් තොටුපලේ ඉඳල යයි කියල. එහෙව් මිනිහ සුමානයක් එහේ හිටිය කිව්වම දැන් ටිකක් ලේ රත්වෙල පීටර්ගෙ. මට තේරුම් ගන්න පුළුවන් (සභාවෙන් සිනා) ඇයි දෙයියනේ විප්ලවයක් කිරීම නොවෙයි නේ ප්‍රතිපත්තිය. සමාජ ක්‍රමය වෙනස් කිරීම නොවෙයි. සමාජ ක්‍රමය වෙනස් කරානම් මොකද දැන් කරල තියෙන්නෙ. අවුරුදු 40ක ඉතිහාසයක. දැන් ආයෙමත් කියනව අවුරුදු 40ක් දේශපාලනය කරල ඉවරවෙලා යූ.ඇන්.පී ආණ්ඩුව පෙරළන්න වරෙල්ල කියල. ඔය සින්දුව තමයි හැමදැම ගායනා කළේ. යූ.ඇන්.පී ආණ්ඩුව පෙරළන්න ශ්‍රී ලංකා එක එක්ක එක්කහු වෙයල්ල කීව. එක්කහු වුනා ගියපාරත්, පෙරළනව. මෙන්න ආයිමත් යූ.ඇන්.පී එක එනව. ආයිමත් පෙරළනව. (සභාවෙන් සිනා) ඉතින් හැමදාම එතන. පීටර්ලා එක්ක දුවපු දිවිල්ල ඕකයි. ඇන්.ඇම්ලා එක්ක දුවපු දිවිල්ල ඕකයි. නේද? දැන් කතු වැකියක් ලියල, කියල තියෙනව හොඳ ලස්සනට. මේ විජේවීර කියන දේවල්වලට එකඟද නැත්ද කියල අ...වං....ක, නො.....කෙ....ල..... සු.....න....... තරුණයින්ගෙන් ජනතා විමුක්ති පෙරමුණේ ඉන්න, අපි අහනවලු. ඔව්, ජනතා විමුක්ති පෙරමුණේ ඉන්නව නොකෙළසුණු තරුණයො. ඇයි මේ පීටර්ලා, ඇන්.ඇම්ලා සිරිමාවොලා, සුභසිංහලා මේ ඔක්කොම එක්කහු වෙලා 71 දී කෙළෙසුවා දහස් ගණනින් පොලිස් පොල්ලෙන් එහෙම කෙළෙසපු අයගෙන් හුඟක් අය අද ජීවතුන් අතර නෑ. කෙළෙසපු අයගෙන්ම ටිකක් ඉතුරු වෙලා ඉන්නව. අන්න ඒගොල්ලන්ගෙන් අහනව මං දන්නෙ නෑ සහෝදරවරුනි ඕන නම් අර කොටාරෝඩ් පැත්තට දාහක් දෙදාහක් ගිහිල්ල කියන්න පීටර් කෙනමන්

හම්බවෙලා කියන්න ප්‍රතිපත්තිය මොකක්ද කියල. හැබැයි එයා ඉදිරියිද දන්නෙ නෑ ඔය සහෝදරවරු පිළිගන්න. දාහක් හමාරක් යනකොට දැන් අනේ බො.....හෝ.....ම ලයා......න්විත දයාවක්, කරුණාවක් ඉපදිල. අපිත් විරුද්ධයිලු තරුණයින් ඝාතනය කරනවට. (සභාවෙන් සිනා) ඒ ගොල්ලොත් විරුද්ධයිලු තරුණයින් මර්දනය කරනවට. ඉතින් ඒගොල්ලො හැත්ත එකේ විරුද්ධ උනානෙ. සහෝදරවරු දන්නවනේ? (සිනා) පී.ඊ. කෙනමන් රේඩියෝ එකේ කථා කරල කිව්ව 71 අප්‍රේල් මාසෙදි ඔය ධනපති හමුදා කරන මර්දනයට විරුද්ධ වෙයල්ල. කියලනේ. 'ඔය කොල්ලන්ගෙ පැත්ත ගනිල්ල' කියල. එහෙම නේද පීටර් කතා කළේ? (සිනා) 71 දී අර සහෝදරය, ශිෂ්‍ය සහෝදරය පේරාදෙණියෙ, මරපු වෙලාවෙ පොලිසියෙන්, පීටර් ඇමතිකමත් දාල පැනලා ඇවිල්ල කිව්ව ''අනේ මමත් මේ මර්දනය හෙළා දකිනව'' කියලනේ? එහෙමනෙ? එහෙම නේද? ලැජ්ජ නැතිකම මහ මුදලිකමටත් වැඩිය කියල ගමේ මිනිස්සු කියන කතාවෙ තේරුමක් තියෙනව.

සහෝදරය ඊළඟට, ඊළඟට කියනව විජේවීරට මොළේ නැහැල්ලු. (සභාවෙන් සිනා) විජේවීරට ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව තේරුම් ගන්න බැරිලු. (ගමනායක සහොදරය යමක් විජේවීර සහෝදරයට කියයි) (ගමනායක සහෝදරයට) දැන් කටින්, පත්තරේ කියල නෑ එහෙම? විජේවීරගෙ වෛද්‍ය වාර්ථාව රුසියන් පිලේ ලංකා කොමියුනිස්ට් පක්‍ෂ සහෝදරයෙක් රෝහලෙදි බැලුවලු ඉතින් ඒ වාර්තාව මොළේ හා සම්බන්ධයිලු. මගේ නම් මොළේ අමාරුවක් තියෙනවයි කියල වෛද්‍යවරු කියලත් නෑ. ඇත්තෙත් නෑ. හැබැයි මේ ඇත්ත පත්තරේ සිරිවර්ධන උන්නැහේගෙ නම් මොළේ ඔල්මාදයක් තියෙනවයි කියල වෛද්‍ය වාර්තාවක් ඉදිරිපත් කරල තියෙනව උසාවියට. මේ පාරත් අපි නඩු දෑවම එහෙම කරන්නත් පුළුවන්. ඇයි වන්දි ගෙවන්න වෙනවට. මොළේ අමාරුවෙන් ලියලයි කියල. මීට ඉස්සර නඩුවකදී එහෙම කරල තියෙනව. ඊළඟට සහෝදරවරුනි, මොළේ නැහැල්ලු ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව තේරුම් ගන්න ඒක නිසාලු මේක කරල තියෙන්නෙ. කොහොමහරි මේ කතුවැකිය පෞද්ගලික අපහාස කිරීමේ කතුවැකියක්. ඒ නිසා ඒකට හොඳම වැඩේ තමයි, පෞද්ගලික අපහාසයට, මේ මුන්නැහලෙ ගෙන්නල මුන්නැහෙලගෙන් අපි ලක්‍ෂ දෙකක් තුනක් ඉල්ලනව. අපට හම්බවුණොත් අපි ඒක ගෙදර ගෙනියන්නෙ නෑ. හම්බවෙන්නෙ නෑ. මොකද දන්නවද? මේකෙ යන්ත්‍රාලය

ලියල තියෙන්නෙ වෙන එක්කෙනෙකුගෙ නමින්. ප්‍රකාශකයට මොකුත් නෑ හරිද ගෙවන්න. කාටත් මුකුත් නැහැ. එහෙමයි හදල තියෙන්නෙ. ඒක දැනගෙන අපි නඩු දානවා. හම්බවුණොත් අපිත් මුද්‍රණාලයක් අරන් ඇත්ත පත්තරේට උත්තර දෙනව. (සභාවෙන් අත්පොසන්) කොහොම වුණත් අපි නඩු කියනව සහෝදරය. මොකද අවලාද නගන තැන්වලට කියන්න මිනිස්සු නොමග යවන්න මේක ලියල තියෙන්නෙ කියල. ඊළඟට තුල්හිරියත් මතක් වෙලා, මේ කතුවැකිය ලියනකොට හොඳයි තුල්හිරිය මතක්වෙන එක. මොකද තුල්හිරිය හොල්මන් කරාවි ඔහෙලගේ පස්සෙන් හුඟක් කල් යනකන්. ඇයි? කම්කරුවො හාරදාහක් පාවල දුන්න. පාවලදීල ඉවරවෙල, දැන් සංවර්ධන වැඩටත්, විජේවීර ආණ්ඩුව පක්ෂලු (සිනාසෙමින්) සහෝදරය, අපි මේ සංවර්ධන වැඩට පක්ෂ නම් අපි ජනතා විමුක්ති පෙරමුණ තියාගෙන ඉන්න ඕන නෑනේ නේද? ජනතා විමුක්ති පෙරමුණක් මොකටද?

අපි පිළිගන්නවද ධනේශ්වර සංවර්ධනයක්, ධනේශ්වර පංතිය විසින් කරනවයි කියල සංවර්ධනය, නෑ අපේ ස්ථාවරය ඉතාම පැහැදිලියි. ගිය ආණ්ඩුවත් සංවර්ධන වැඩයි කියල කරපු ප්‍රෝඩාවට අපි විරුද්ධයි. දැන් මේ ආණ්ඩුවෙත් සංවර්ධන වැඩයි කියල කරන ප්‍රෝඩාවට අපි විරුද්ධයි එකහෙළාම (අත්පොලසන්) මගෙන් ඇහුවෙ නෑ කිසිම පත්තරකාරයෙක් සංවර්ධන වැඩ ගැන, මගෙන් ඇහුව එක ප්‍රශ්නයක් නම්. සංවර්ධන වැඩ කඩාකප්පල් කරන්න කට්ටියක් හදනවය , අපි ඒ ගොල්ල නැත්තටම නැති කරනවයි කියල, ජනාධිපති කියල තියෙනවය, ඒ කියල තියෙන්නෙ අපි ගැනද කියල. මං කිව්ව අනේ හදිසි වෙන්න එපා. කලබල වෙන්න එපා, අපේ නම කියල නෑනේ, ඒක නිසා මේ මග යන ආයුබෝවන් අපි බාරගන්නෙ නෑයි කියල (සභාවෙන් සිනා) ඕක තමයි අපි කිව්වේ අපි භාරගන්නේ නෑ කියල. ඉතින් අපි සංවර්ධන වැඩටත් පක්ෂලු. එහෙනං සංවර්ධන වැඩ කඩාකප්පල් කරනව කියල යූ.ඇන්.පී ආණ්ඩුව කියන තුල්හිරිය ස්ට්‍රයික් එකටත් විරුද්ධලු තුල්හිරිය කම්කරුවනුත් ද්‍රෝහිලු අපට. (වේගයෙන්) අපට නොවෙයි තුල්හිරිය කම්කරුවෝ ද්‍රෝහින්, තොපිටයි ද්‍රෝහින්. ඇයි? තොපි ධනපති ක්‍රමය රකිනව. අපි දන්නව සමසමාජ පක්ෂ නායකයින්ටයි කොමියුනිස්ට් පක්ෂ නායකයින්ටයි, සහෝදරවරුනි මේ ධනපති ක්‍රමය හොඳයි, මේ ධනපති ක්‍රමය ඕනැ. ඒනිසා ඒගොල්ලො ඒක තියාගෙන ඉන්නව. ඇයි දෙයියනේ ගියපාර වැඩිපුර තිබුණ ගෙවල් ගත්ත. දැන්

ඒ ගෙවල් වල හිමියො කවුද? ලස්සනයි බලනකොට, පුද්ගලිකව විමුක්තිය අත්පත් කරගෙන තියෙනව. කොමියුනිස්ට් පක්ෂයෙ ඉහළ පෙළේ තට්ටුව, ඔය විදිහෙ වැඩ කරල තියෙනව. වංචාවල්, දූෂණ, ශ්‍රී ලංකා- සමසමාජ- කොමියුනිස්ට්- යූ.ඇන්.පී ඔය හැම පාලනයක් යටතේම හැමදාම කෙරුනා. අපි ඔව්වට හැමදාම විරුද්ධයි. මේ පසුගිය ආණ්ඩු එකක්වත් යටතෙත් මේ ආණ්ඩුව යටතෙත් සංවර්ධනයක් කෙරුණයි කියල අපි පිළිගන්නෙ නෑ. ඒ නිසා තමයි අපි සමාජවාදී සංවර්ධන මාවතට එන්න ඕනැය කියල සමාජවාදී සමාජ ක්‍රමයක් ගොඩ නගන්න ඕනැයි කියල සටන් කරන්නෙ. සහෝදරවරුනි කල්පනා කරල බලන්න, මේ අපි මේකටත් විරුද්ධයි, ලියල අන්තිමට ගෙනල්ල. ගෙනල්ල කියල තියෙනව මෙහෙම. විජේවීර නිදහස් කොරේ ජේ ආරුත් එක්ක සම්මුතියක් ඇතිකරගෙනලු. එහෙම කටකතාවක් පැතිරිල ගියාලු ඒ කාලෙ. ඒක ඇත්තෙයි කියල දැන් පේන තත්ත්වයක් තියෙනව කියල ලියල තියෙනව.

අපි එක ප්‍රශ්නයක් අහනව. පීටර්! විජේවීර නිදහස් කළාට උඹ පක්ෂද විරුද්ධද කියල. කියාපන් පොඩ්ඩක්, ඉස්සරවෙල. (සභාවෙන් සිනා) එතකොට ඔය ප්‍රශ්නෙට උත්තර හම්බවෙනව නේද? එහෙනම් ඊළඟට ඒගොල්ල කියනව විජේවීර නිදහස් කළේ වමේ බලවේග සමගි කිරීම කඩන්නලු. එහෙම කඩන්න බැරි නම් අඩුගොනෙ වම ව්‍යාකූල කරන්නලු. හොඳයි එහෙනම් තව තර්කයක් පැන නගිනව. සිරිමා, විජේවීර හිරේට දැම්මෙ වමේ බලවේග සමගි කරන්නද? (සභාවෙන් සිනා) නෑ. ඒ ප්‍රශ්නෙ නිකම්ම පැන නගිනව. වමේ බලවේග, අතර ව්‍යාකූලත්වයක් නැති කරල පිරිසිදුභාවයක් ඇති කරන්නද විජේවීර හිරේට දැම්මෙ සිරිමාවොයි උඹලයි එක්කහු වෙල, මේ කතුවැකියට අනුව.

ඊළඟට සහෝදරය මේ හුඟක් දේවල් එළියට පැනල තියෙනව. ඒ කියන්නෙ දැන් නම් අමු වෛරයෙන් අර මරණාසන්න වෙච්ච එකා කෑගහන්න ගියාම මොනව කියනවද දන්නෙ නෑ. (සභාවෙන් සිනා) ඒ තත්ත්වය තමයි මේ කතුවැකියෙ නම් පේන්නෙ. ද්වේෂයයි, වෛරයයි, අම්මේ! පිරිල ඉතිරිල යනව. ඊළඟට තව ප්‍රධාන ප්‍රශ්නයක් නගල තියෙනව. සාක්ෂි දෙන්න යනවයි කියල කොමිසමට. සහෝදරවරුනි ඒකත් ටිකක් පැහැදිලි කරන්න ඕන. අපි කිසිම තැනෙක කියල නෑ මම සාක්ෂි දෙන්න යනවයි කියල. මම සාක්ෂි දෙන්න යන්න පක්ෂෙ

තීරණයකුත් නැහැ. ප්‍රධාන ලේකම් සහෝදරය ඒකට සාක්ෂි දරයි. අපේ පක්‍ෂ මධ්‍යම කාරක සභාව තීරණයක් අරන් තියෙනව සාක්ෂි දෙන්න ඊට අදාල සහෝදරවරු අරින්න. ඒ නිසා මම සහෝදරවරුන්ට පැහැදිලි ලෙස කියනව , මම එදා ධනපති පත්තරවලටත් කිව්වෙ, පැහැදිලි ලෙස මම සාක්ෂි දෙන්න යන්නෙ නෑ කියල. එකම පත්තරයක් වරද්දල දාල තියෙනව. ශීර්ෂ පාඨය විතරක් 'සන්' පත්තරේ තියෙනව මෙන්න මෙහෙම. Wijeweera to be testified befor commission (විජේවීර කොමිසම හමුවේ සාක්ෂි දෙයි) කියල. නමුත් ඇතුලෙ කෑල්ලෙ එහෙම නෑ. අපි සාක්ෂි දෙනවයි කියල තියෙනව. හැබැයි පත්තරකාරයට මතක නැති වෙලා තියෙනව. මම පැහැදිලි ලෙසම කිව්ව මගෙන් ඇහුවම මමද සාක්ෂි දෙන්නෙ කියල ඇහුවම (බරකොට) නෑ මම නොවෙයි වෙනත් අය කියල. (සභාවෙන් සිනා) ඇයි මට හොඳට එතන සාක්ෂි දෙන්න අවශ්‍ය පුද්ගලයො ඉන්නව. සහෝදරවරුනි, අපේ පක්‍ෂ 17 දෙනෙකුගෙ කකුල් කඩල නේද, එක තැන එක දවසෙ, සිරිමගෙයි ඇන්.ඇම් ගෙයි පීටර්ගෙයි ආණ්ඩුව. ඉතින් ඒ 17දෙනා කකුල් කැඩිල තාමත් බකල ගගහ යන්නෙ. ඒ ගොල්ලො ගිහින් සාක්ෂි දෙන එක හොඳයිනෙ? මම මොකටද ගිහිල්ල ඒගොල්ල ගැන කියෙන්නෙ. ඊට වැඩිය හොඳයිනේ ඒගොල්ලන්ම ගිහින් කියන එක. මොකද උනේ කියල. ඒ තත්ත්වය යටතේ වෙච්ච අයම ඒගැන සාක්ෂි දෙයි, අපේ පක්‍ෂයෙ දේශපාලන මණ්ඩල සාමාජිකයෙක් ඇතුළු සාමාජිකයන් ගණනාවක් සාක්ෂි දෙන්න අපේ පක්‍ෂ තීරණය කරල තියෙනව.

ඊළඟට ප්‍රශ්නයක් එනව මේ සාක්ෂි දෙනව ඔන්න කෑගහනව ශ්‍රී ලංකා කාරයොයි සමසමාජකාරයොයි කොමියුනිස්ට් කාරයොයි දැන් කෑගහනව කුලප්පු වෙලා, හා ............ සාක්ෂි දෙනව ඔන්න ධනපති කොමිසමේ .......ධනපති කොමිසමේ......... (සභාවෙන් සිනා) ඔව්! ධනපති කොමිසමේ උඹල කරපු වැඩ එළිදරව් කරනව අපි එච්චරයි. (අත්පොළසන්) සහෝදරවරුනි, ඉස්සෙල්ල ප්‍රශ්නයක් ගන්නව, හරිද වැරදිද කියන එක මාක්ස්වාදීන් වශයෙන්. අපි ඒක කියන්න ඉස්සර වෙලා. එක ප්‍රශ්නයක් අහනව. උඹල ධනපති කොමිසමට නැතුව අපරාධ යුක්ති විනිශ්චය කොමිසම කියන සමාජවාදී කොමිසමට අපිව ඇරියෙ (සභාවෙන් සිනා) එතකොට උඹලට මතක්වුනේ නෑ ධනපති කොමිසමකට නේද මේ මිනිස්සු ටික මේ අරින්නෙ. හොඳද නරකද මේක කියල නේද? කමක් නෑ සහෝදරවරුනි මාක්ස්වාදී ස්ථාවරයක් තියෙනව මේ ධනපති

ආයතන පිළිබඳව පාර්ලිමේන්තුවත් ධනපති ආයතනයක්. ඒ ධනපති ආයතනය ඇතුළු ධනපති සමාජයෙ තියෙන ධනපති පංතිය විසින් තමන්ගෙ එල ප්‍රයෝජන සඳහා ගොඩ නගල තියෙන හැම ආයතනයක් තුළම ධනේශ්වර පංතියට විරුද්ධව ධනේශ්වර පංතියෙ ජරමර වැඩ දේශපාලන වැඩ-යටිකූට්ටු වැඩ- කුමන්ත්‍රණකාරී වැඩ- ජනතා ද්‍රෝහී වැඩ එළිදරව් කරන්න සම්පූර්ණයෙන්ම ඒ ආයතන ප්‍රයෝජනයට ගත යුතුයි කියන එක තමයි ලෙනින්වාදී ස්ථාවරය. අන්න ඒ ස්ථාවරය උඩ ඉඳගෙන මේ ධනපති කොමිෂමක්. අපි ඒ කොමිෂම පිළිගන්නෙ නෑ. නමුත් ඒ කොමිෂම අපට වේදිකාවක් වෙනව නම්, වේදිකාවක් හැටියට අපට පාවිච්චි කරන්න පුළුවන් නම්, ශ්‍රී ලංකා නිදහස් පක්ෂයයි කියන ධනපති පංති කොටසයි අනිත් ධනපති පංතියෙ ගැත්තරයො ටිකයි එක්කහු වෙලා මේ රටේ විප්ලවවාදී ව්‍යාපාරයට විරුද්ධව කරල තියෙන තාම ජනතාවගෙන් සැඟවිලා තියෙන කරුණුවලින් සොච්චමක් හරි හෙළදරව් කරන්න අපි කියනව සොච්චමක් කියල. මොකද, සේරම හෙළිදරව් කරන්න ඔය ජයවර්ධන උන්නැහෙත් ඔතන ඉඩ දෙන්නෙ නෑ. අපි ඒක හොඳට දන්නව. (සභාවෙන් සිනා) ඒක ධනපති පංතියේ උවමනාව නොවෙයි. ඒ නිසා ඒ සොච්චම හරි එළිදරව් කරන්න අපි පුළුවන් තරම් උත්සාහ දරනව. මෙතැනදි ප්‍රශ්නෙ තියෙන්නෙ මේකයි. ධනපති ආයතන විප්ලවවාදීන්ට ඕනැ ඕනැ හැටියට පාවිච්චි කරන්න දෙනවද කියන එකයි. නෑ. අපරාධ යුක්ති විනිශ්චය කොමිෂම හැදුවෙත් අපට විරුද්ධව පාවිච්චි කරන්න. නමුත් ඒ තරම් දුෂ්කර තත්ත්වයන් යටතෙත් අපි ඒක ආපහු හැරෙව්ව එක්තරා දුරකට, සහෝදරවරුනි, ඒක මම යුරෝපයට ගියාට පස්සෙ දැක්කා (අත්පොළසන්) ඒක ඇතුලෙ ද්‍රෝහීන් ලව්ව අපිට කොච්චර අවලාද නැගුවත් අපි ගිහිල්ල අපේ ස්ථාවරයක ඉඳන් දීපු සාක්ෂි, ගනිපු ක්‍රියාමාර්ග අදත් ලතින් ඇමරිකාවෙ අප්‍රිකාවෙ යුරෝපයෙ පුරා විප්ලවවාදීන් විසින් බොහොම සාදරයෙන් පිළිගන්නව සහෝදරවරුනි, (ඔල්වරසන් හා දීර්ඝ අත්පොළසන්) සහෝදරවරුනි, මම ගිය ගිය රටේ හැම භාෂාවකටම පරිවර්ථනය කරල අපි දන්නෙ නැතිව හැම භාෂාවකින් මුද්‍රණය කරල අපේ සහෝදරවරු දීපු සාක්ෂිවල කොටස්, කරපු ප්‍රකාශවල කොටස් මං ඇහුව ඇයි මේ කියල. ඇයි අයිසෙ ධනපති ආයතනයක් මේ තරම් දුෂ්කර තත්ත්වයන් යටතේ විප්ලවයේ ප්‍රයෝජනය සඳහා තමුසෙලා ප්‍රයෝජනයට ගනිපු එකම මදෑ ඒක පරිවර්තනය කරල මෙහෙ මුද්‍රණය කරල අපිට ඉගෙන ගන්න කියල කිව්ව (අත්පොළසන්) මේ අලුතෙන්ම

තුර්කියේ පොතක් ගහල ලංකාවෙ 1971 අරගලය ගැන. සේරම පොතේ තියෙන්නෙ අපරාධ යුත්ති විනිශ්චය කොමිෂම ඉදිරියට ගිහිල්ල අපි ඒකට අභියෝග කරපුව. සහෝදරවරුනි, ඒ වගේ ධනපති ආයතන තුළ අපට ආත්ම විශ්වාසයක් තියෙනව අපි කරන්න යන දෙයින් කොටසක් හරි ප්‍රතිඵල ලබාගන්න. ඒ නිසා අපේ පක්ෂය තීරණයක් අරන් තියෙනව ඒ තීරණේ හරි. හැබැයි සමසමාජ පක්ෂෙටයි කොමියුනිස්ට පක්ෂෙටයි ශ්‍රී ලංකා එකටයි නම් දැන් දෙපා ගැහෙනව ඇති. දෙයියනේ දැන් අකුරැස්සෙ ජනතා විමුක්ති පෙරමුණුකාරයින්ගේ ගෙවල්වලටම ගිහිල්ල අල්ලල දීපුව ඔතන කියයි නේද? ඇයි ඔක්කොම මැරුණෙ නෑනෙ. දෙන්නෙක් තුන්දෙනෙක් ඉතුරුවෙලා ඉන්නව. උන් ගිහිල්ල සාක්ෂි දීල කීවොත් (සභාවෙන් සිනා) හරි වැඩේනෙ වෙන්නෙ දැන්. ඇයි දැන් රත්මලානෙ අර කාරියවසම් උන්නැහේ අල්ලල දිල මරවපු එක්කෙනා ගැන ඇවිල්ල කියයි ඒක ඇහින් දැක්ක මිනිහෙක් ඉන්නව. (සභාවෙන් සිනා) කම්කරු පංති නායකයො කරපු වැඩ කියන්න. ඇයි? එදා හංස හමුදාව හදල ධනපති හමුදා ධනපති රාජ්‍ය යන්ත්‍රය රැකපු හැටි කියන්න, මිනිස්සු ඉන්නව. අනිල් මුණසිංහල සිරිමා කරපු වැඩ ගැන විතරක් නොවෙයි මේ දෙගොල්ලො කරපු වැඩත් කියන්න. ඔන්න ඕකයි දැන් ඔය නරකයි කියන්නෙ. නරකයි කියන්නෙ වෙන මොකුත් නිසා නොවෙයි ස්ව.....යං........ දයාව නිසා, ස්ව........යං අනුකම්පාව නිසා (සභාවෙන් සිනා) අපට නෑ එහෙම හෙළන්න කඳුළු. සිරිමා වෙනුවෙනුත් නෑ. ෆීලික්ස් වෙනුවෙනුත් නෑ. ඉයන් වික්‍රමනායක හෙවත් යකඩයා වෙනුවෙනුත් නෑ. (සභාවෙන් සිනා) පිස්තෝලයක් ගහගෙන ආවයි කියල ළඟදි පත්තරවල තිබුණාලු නේද? අනෙ අම්මේ අපේ අම්මල යනකොට නංගිල යනකොට , යටඇඳුම් හිටන් ගලවල බලනව, ඔය අපරාධ යුක්ති විනිශ්චය කොමිෂන් සභාවට. මෙන්න සාක්ෂි දෙන්න ආපු දෙන්න ආපු පුද්ගලයා දැන් පිස්තෝලයකුත් ගහගෙන ඇවිල්ල තියෙනව. මොකද අපිට වැඩක් දෙන්නද? නැතිනම් කාට වැඩක් දෙන්නද පිස්තෝලයක් ගහගෙන ආවේ? සහෝදරවරුනි ඉතින් කොමිෂම ඉදිරියෙ සාක්ෂිදීම පිළිබඳ ඒකයි අපේ පැහැදිලි ස්ථාවරය. ඒක නිවැරදියි. අපි ඒක කරනව. ඒ කියන්නෙ රටේ ජනතාව ඉදිරියේ පොඩ්ඩක් හෙළිදරව් කරල කියන්න. ඇයි දෙයියනේ අපි අවුරුදු 5න් පහළ පොඩි අය මරණවයි කියල, අපි අවුරුදු 45 වැඩි මිනිස්සු මරණවයි කියල, රට සේරම කියල තියෙන්නෙ. පෙත්තක් ගහල සූර්වෙලා තමයිලු ඕක කළේ. හැත්තෑ එකේ මෙන්න අලුතෙන් ඉපදිල පීටර් කෙනමන් උන්නැහේට., 'ඇත්ත' කතුවැකිය

ලියල තියෙනව බොහොම අවංක සහෝදරවරු දැන් නොකෙලසුනු සහෝදරවරු ඉන්නවලු. දැන් නොකෙළසුනු සහෝදරවරු බේරා ගැනීම කාගෙන්ද? මේ භයානක සාතන්ලගෙන්. ජනතා විමුක්ති පෙරමුණේ නායකයින්ගෙන් සාමාජිකයෝ බේරගන්න ඉදිරිපත් වෙලා තියෙනව අලුත් ගැලවුම්කාරයෙක් පීටර් කෙනමන් කියල. (සභාවෙන් යමෙක් කිසිවක් කියයි. හරිහැටි නොපැහැදිලිය) අෑ.......... මොනවද පත්තරවල වැටෙන්නෙ, නෑ... ආ........... පත්තරවල වට්ටන්නම් කියන්න, අපි උසාවියට ආවම එහෙම කිව්වෙ නෑ කියල. (සභාවෙන් සිනා) සහෝදරය කියන්න මේව කොහෙන්ද ගත්තේ අංජනමක් බැලුවද කියල. උඹල ගියාද කියල අහන්න විජේවීර හම්බවෙන්න. දැක්කද කියලවත් අහන්න. සහෝදරය ඒක ඉතාම පැහැදැලියි දැන් ගන්නෙ ධනපති පත්තරවලින්. මේ අවස්ථාවාදීන් ඔයිට වඩා ලස්සන දෙයක් ඉස්සරත් කරල තිබුණ. මම බටහිර බර්ලිනයෙදි පුවත්පත් සාකච්ඡාවක් තිබ්බයි කියල බොරුවක් ''වීක් එන්ඩ්'' එකේ තිබුණ. ඒක මම ගෙනල්ල තියෙනව. ඒක ඊට පස්සෙ දිනකර පත්තරේ දාල තියෙනව මෙන්න මෙහෙම, විජේවීර කිව්වලු කියල. දිනකර මේව ගත්තෙ කොහෙන්ද?''වීක් එන්ඩ්'' එකෙන්. දිනකරේ ගුරුන්නාන්සේ ''වීක් එන්ඩ්'' එක තේරුණා නේද ප්‍රශ්නය. එලියෙ ගහගන්නෙ මිනිස්සුන්ට පේන්න. අරහෙ බාල්දානව නටනව. ඔක්කොම එකට වැඩ යටින්. ඇයි ඔක්කොම ධනපති. රතුපාට කමිසෙ ඇඳගත්තත් ධනපතිය ධනපතිය. කොළපාට කමිසෙ ඇඳගත්තත් ධනපතිය ධනපතිය. (සභාවෙන් සිනා) ඊළඟට කමක් නෑ. හදිසි වෙන්න ඕනනෑ. ''ඇත්ත'' පත්තරේ කර්තෘට උසාවියට ඇවිල්ල කියන්නෙ වෙව් කොහන්ද මේක ගත්තෙ කියල. එතකොට කියයිනේ ගත්ත තැන. සිකුරාදා පුවත්පත් සාකච්ඡාවක් කවුද එයාට කිව්වෙ කියල. ඊළඟට සහෝදරය අන්තිමට ඇවිල්ල මේ දයාව අනුකම්පාව උඩ, කියල තියනව මේ ජනතා විමුක්ති පෙරමුණ කියන්නෙ විජේවීරය. විජේවීර කියෙන්නෙ ජනතා විමුක්ති පෙරමුණ කියල. ඒ ගැන හෙළිදරව් කරල තියෙන්න. අපි කියන දෙයක් නොවෙයි. ඒගොල්ල හිතන දෙයක්. දැන් විජේවීරට තමයි වැඩේ දෙන්න ඕනෑ ආ........ අර ගමනායක සහෝදරය කිව්ව වගේ දැන් මිනිස්සුන්ට තර්ජනය කරන්න පටන් අරගෙන තියෙනව. එකක් අපි කියනව. බොහෝදෙනා අපට තර්ජනය කරල තියෙනව. අපි මේ ව්‍යාපාරය පටන් ගත්ත කාලෙ ඉඳලම. අපි ඕවට හුරුපුරුදු වෙලා තියෙන්නෙ. සමසමාජ පක්ෂෙ එක් පුද්ගලයෙක් භාවනාවලදිත් මගේ තට්ටෙ කෙස් ගලවන්න කථා කළා. අපි හදිසි වුණේ නෑ. මොකද අපිට

බොහොම හොඳ ශක්තිමත් ස්නායු පද්ධතියක් තියෙනව. ඒ කියන්නෙ ඕව ඔරොත්තු දීල ඉන්න පුළුවන්කමක් අපිට තියෙනව. සමහර විට මම හිතනව ඒක අපේ දුර්වලකමක් කියල ගණන් ගන්නෙ නැතිව අරීව් කියල. මේ පහුගිය දවස්වලත් කළුතර රැස්වීමේදිත් නොයෙක් කථා කියල තියෙනව පෙරේදා.

සහෝදරවරු දන්නව හවානාවලට අපි ගියපු වෙලාවෙ ලංකාවෙන් නියෝජිත පිරිස් ගියා. යූ.ඇන්.පී එක, ශ්‍රී ලංකා, සමසමාජ, කොමියුනිස්ට්, මහජන එක්සත් පෙරමුණ, ද්‍රවිඩ විමුක්ති පෙරමුණ, ජනතා විමුක්ති පෙරමුණ. අපේ පස් දෙනයි ගියේ. ඒ ගොල්ලන්ගෙ විසි ගණන් තිස් ගණන් ගියා. ඇයි ඒගොල්ල ''ලොකු පක්ෂ'' අපි ''පොඩි පක්ෂය'' නිසාලු. හවානාවල ගිහින් කිව්වෙ එහෙමයි. කොමියුනිස්ට් පක්ෂෙ උදවිය කිය කිය ගියා සමසමාජ පක්ෂෙ උදවියයි මේ ජනතා විමුක්ති පෙරමුණ, ඒක සුළු සොච්චම් පක්ෂයක් ලංකාවෙ කියල. (ඛරකොට) කොමියුනිස්ට් පක්ෂය තමයි අතදිග ඇරල මහමෙරට ඉන්නෙ ලංකාවෙ. (සභාවෙන් සිනා) සමසමාජ පක්ෂෙත් එහෙමයි. ඉතින් මේගොල්ලන්ගෙන් තිස් ගණන් විසි ගණන් ආවා. අපෙන් පහයි. ඒත් සද්ද නැතුව හිටිය, වැඩක් නෑනෙ කියල. යනකොට සිංහ කොඩියවත් ගෙනිහිල්ල නැහැ. යූ.ඇන්.පී එකේ සිංහය උජාරුවට උස්සගෙන මෙහෙ යන්නෙ ලංකාවෙ දැක්කනේ හැම තැනම ජාතික කොඩිදාල, ගිය නියෝජිත පිරිසට කොඩිය ගෙන යන්න මතක නැති වුනා. හැබැයි ලේන්සුවවත් මතක නැතුව ගියේ නෑ ඒ මහත්වරුන්ට. ඒ ඔක්කොම ගෙනිච්ච. ශ්‍රී ලංකාකාරයොවත්, සමසමාජ, කොමියුනිස්ට් කාරයොවත් ගෙනිච්චෙ නෑ. කොඩියක් නෑ. සහෝදරවරු දන්නවනේ අපි පාවිච්චි කරන්නේ දෑකැත්තයි මිටියයි කම්කරු ගොවි කොඩිය තමයි. අපි නම් අපේ කොඩිය ගෙනිච්ච. අපි ඒ විතරක් නොවෙයි අනිත් පක්ෂ වල උදවියට තම තමන්ගෙ පක්ෂෙ කොඩි එකක්වත් ගෙනියන්න නමවත් ගහගෙන යන්න මතක නැතුව ගියා. අපේ සහෝදරවරු විතරක් ඉංග්‍රීසි, ප්‍රංශ, ස්පාඤ්ඤ හැම භාෂාවකින්ම ගහල, ජනතා විමුක්ති පෙරමුණ - ශ්‍රී ලංකාවේ ජනතා විමුක්ති පෙරමුණ කියල ලොකු කොඩි ගෙනිච්ච. ගෙනිහිල්ල , අපි ඒ කොඩි දාලා තිබුණා ලංකාවේ කියල පේන්න. එකම කොඩිය තිබුනෙ, ''ශ්‍රී ලංකාවේ ජනතා විමුක්ති පෙරමුණ'' කියල තිබුණු අපේ කොඩිය විතරයි. අපි ඒක එල්ලල තිබුණ ගොඩනැගිල්ලක. ඒ ගොඩනැගිල්ල ලංකාවෙ කාන්තාවො හිටපු ගොඩනැගිල්ල. ලංකාවෙ

කාන්තාවන්ගෙන් අපේ සහෝදරියො එක්කෙනයි ලංකා සමසමාජ පක්ෂෙ දෙන්නයි, කොමියුනිස්ට් පක්ෂෙ දෙන්නයි යූ.ඇන්.පී එකේ එක්කෙනයි එහෙම හිටියෙ. ඒ සේරම හිටියෙ ඔය ගොඩනැගිල්ලෙ. එතන දැම්මම තමයි හොඳට පේන්නෙ. අපි ඒක එතන එල්ලුව.

ඉන්දියාවෙ මාක්ස්වාදී කොමියුනිස්ට් පක්ෂෙ නියෝජිත පිරිස ජනතා විමුක්ති පෙරමුණේ නියෝජිත පිරිසට නිල ආරාධනාවක් කළා දෙගොල්ල අතර සුහද දේශපාලන සාකච්ඡාවක් කරන්න ඕනැය කියල. මොකද ලංකාවෙ ඉන්න සැබෑ මාක්ස්වාදීන් අපියි කියලයි ඒගොල්ල පිළිගන්නෙ කියල. එහෙම කියලයි ඒ ගොල්ලො ආරාධනා කළේ. ඒ නිසා අපි ගියා. ගිහිල්ල අපි හැන්දෑවෙ හයට විතර පටන් ගත්ත සාකච්ඡාව. උදේ එළිවෙන්න දෙක විතර වෙනකම් කෙරුන. ඉංදියාවෙයි ලංකාවෙයි දේශපාලන තත්ත්වය පිළිබඳව, උදේ දෙකට ඇවිල්ල බලනකොට කොඩිය නෑ. (සභාවෙන් සිනා) කොඩිය කොහේද කියල අපි හෙව්ව. ජනතා විමුක්ති පෙරමුණේ සාමාජිකයො නිල වශයෙන් පස්දෙනා ගියාට ඊට වඩා වැඩියෙන් ටිකක් ගිහිල්ල තියෙනව. ඒ කියන්නෙ මේ වෙනත් පක්ෂ වල උදවියට තෝරා බේරා ගන්න බැරුව. මේ තමන්ගේම අයද කියල සමහර අය ඇරල තිබුන. ඒගොල්ලන්ගෙන් ඇහුවම අපට දැන ගන්නට ලැබුන වැඩේ වෙලා තිබුනෙ මොකක්ද කියල. වෙලා තියෙන්නෙ මොකක්ද? සමසමාජ පක්ෂයෙ මධ්‍යම කාරක සභිකයෙක් වන අතාවුද සෙනෙවිරත්නගෙ නියෝග පරිදි ඔහුගේ නායකත්වයෙන් පුරෝගාමීත්වයෙන් මැදිහත් වීමෙන් අපේ කොඩිය කපල විනාශ කරල. හොයල බැලුවම. ඉතින් බස් එකේදි ඔය ගැන කථාවක් ඇදිල ආව. බස් එකේ කථාව ඇදිල එනකොට අමරසිංහ සහෝදරයයි මායි විතරයි අපේ නියෝජිත පිරිසෙන් හිටියෙ. බස් එකේ, මගේ කෙස් ගලවන්න කථා කළා. අපි ගණන් ගන්නෙ නැතුව ආව. සමසමාජ පක්ෂෙ උදවිය බොහොම නටනව නම් වැඩියි.

දැන් එකක් කියන්නම්. ජනතා විමුක්ති පෙරමුණත් එක්ක සෙල්ලම් කරන්න එපා. තේරුණාද? ඔහෙල අපිට හුඟක් දේවල ණයයි ලේ වලින්. අපේ ඉහිලීමේ ශක්තිය අපේ දුර්වලකමක් කියල ගණන් ගන්න එපා. තේරුණාද? ඇයි? දැන් සෙල්ලම් කිරීම කෙළවරක් නැතුව ගිහිල්ල, අපි හොඳටම දන්නව සමසමාජ පක්ෂය කැපුවයි කියල. ඒ නිසා තමයි අපි සමසමාජ පක්ෂෙ කැපුවයි කියල කියන්නෙ. දැන් ඇවිල්ල අහනව නඩු දාන්නෙයි කියල. නඩු දානව අපි උඹලට විරුද්ධව දවසක.

(ගමනායක සහෝදරයා රෝහණ සහෝදරයාට යමක් කියයි) ධනපති උසාවියෙ නොවෙයි. උඹල මහජන අධිකරණයක් ඉදිරියට ගේන දවසක් එනව. අන්න එදාට ඕව සේරම පිළිබඳව විනිශ්චයක් කරනව. කළුතරදි කියල තියෙනව මේ සෙල්ලම අන්තයට ගෙනිහිල්ල. කුණුහරුපයෙන් මොකක්ද ලියල තිබිල ස්පාඤ්ඤ භාෂාවෙන්, කියුබන් කට්ටිය කපලලු. බලන්න ජඩ වැඩ කරල, ඒක ජඩ වැඩක්. කොඩිය කපපු එක. කපල ඉවරවෙලා දන් ඇවිල්ල කියනව කියුබානුවො කැපුවයි කියල. පීපල්ස් ලිබරේෂන් ෆ්‍රන්ට් ඔෆ් ශ්‍රී ලංකා කියල උඩින්ම ලියල තිබුන ඉංග්‍රීසියෙන්. ඒක භාෂා තුනෙන්ම ලියල තිබුන. ප්‍රංශ ස්පාඤ්ඤවලින්. කව්ද මේ වජිර පැල්පිට කිව්වලු කියුබානුවො කැපුවයි කියල. මං කියන්නෙ තමන් කරපු මේ තරම් අසික්කිත වැඩක් අර ශ්‍රේෂ්ඨ කියුබානු සහෝදරවරුන් පිට පටවන්නෙ. ඒ මිනිස්සු කොයි තරම් අමාරුවෙන්ද මිනිස්සු රැකබලා ගත්තෙ, ඇයි වෙරි මරගාතෙ ඇවිල්ල ඉන්නකොට. ගිලන් ඇඳෙන් උස්සගෙන ආවෙ හැන්දෑවට (සභාවෙන් සිනා) කියුබන් සහෝදරවර. ඒකටවත් ගරු කරන්න ඕන, අඩුගානෙ. ඒ මිනිස්සුන්ගෙ කර පිටින් ඇවිල්ල හැන්දෑවට, දැන් ඒ මිනිස්සුන්ට අපහාස කරනව මෙතන.

සහෝදරවරුනි, ඊළඟට දැන් මේ ගොල්ලො ඔය විදියට අවලාද ගොන්නක් ගැහුව. මේ අවලාද ගොන්න අරන් තියෙන්නෙ ධනපති පත්‍රවලින්. ධනපති පත්තරවල ඊළඟට පුවත්පත් සාකච්ඡා තියෙන එක වැරදි........යි කියල ඔන්න එක පැත්තකින් ප්‍රචාරයක් ගෙනියනව. සහෝදරවරුනි මේ ධනපති සමාජයෙ ප්‍රචාරක මධ්‍යයන් තියෙන්න ධනපති පංතිය සතුව. මේ ධනපති පංතිය සන්තක වෙලා තිබෙන ප්‍රචාරක මාධ්‍යය අපට ඕනැ හැටියට පාවිච්චි කරන්න නම් බැහැ. නමුත් අපි ඔතන අරගලයක් කරල ඩිංගක් හරි පාවිච්චි කරන්නත් උත්සාහ කරන්න ඕනැ. ඒනිසා තමයි ඒ මිනිස්සුන්ට ප්‍රශ්න තියෙනවයි කියල කථා කරන්න කැමතියි කියල කීවම, අපිට බැහැයි කියන්න බැහැ. අපි කථාකරන්න ඕනැ. ඒ නිසා අපි ඔන්න දැන් ඇත්ත පත්තරේට නඩු දානව. ජනතාවට මේ කියන්නෙ ''ඇත්ත'' පත්තරේට නඩු දානව, අපහාස කිරීමේ චෝදනාවට, එකක්. ඊළඟට බොරු වාර්තා ලිවීම පිළිබඳව ඇත්ත පත්තරේටයි, දිනකරේටයි, ඒ පත්තරවලට නඩු දානව. ඊළඟට ඩේලි නිව්ස්කාරයොයි දිනමිණ පත්තරෙයි වැරදියට විකෘති කරල පොඩ්ඩක්. අර ගොල්ල වගේ ගොඩක් සම්පූර්ණ වෙනස් එකක් නොවෙයි. පොඩ්ඩක් විකෘති කරල දැමීම පිළිබඳව හදන්නෙයි

කියල දැනට දැනුම් දීල තියෙනව. එහෙම නැත්නම් ඒ ගොල්ලන්ටත් පුවත්පත් මණ්ඩලේට නඩු දානව. දිනකරටයි, ''ඇත්ත'' ටයි වගේම. ඊළඟට අපි කියනව සහොදරවරුන්ට පැහැදිලි ලෙසම නිර්භයවම යූ.ඇන්.පී එක වෙනුවෙන් තමයි මේ ගොල්ලො මේ වැඩ කරන්නෙ. යූ.ඇන්.පී එකේ වාසියට හෙට ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට ඒගොල්ලො විරුද්ධයි කියල ඒගොල්ලො එන්න කියනව. රටේ මිනිස්සුන්ට. බිල්ලට දෙන්න. ඒ ගමන් අපට අලවනව, ලේබලයක් මෙන්න මේ ගොල්ලා නම් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට පක්ෂයි. තේරුණාද වැඩේ කරන්න හදන. ඉතින් ඒ නිසා අපි පැහැදිලි ලෙසම කියනව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට විරුද්ධ මිනිස්සු පක්ෂයි කියල කියන්න ඕනෑකම තියෙන්නේ යූ.ඇන්.පී එකට විතරයි. යූ.ඇන්.පී එකේ උවමනාව මේ ගොල්ල ඉෂ්ඨ කරනව. මේ ගොල්ලො යූ.ඇන්.පී එකේ ගැත්තො වශයෙන් තමයි ඒක ඉෂ්ඨ කරන්නෙ. මෙතෙක් කල් කරල තියෙන්නෙත් ඒ වගේ වැඩ.

මේ වැඩ සහෝදරය අහම්බෙන් වෙන දේවල් නොවෙයි. ලංකාවෙ ජාත්‍යන්තර වශයෙන් මෙන්ම ප්‍රතිවිප්ලවවාදී හැඩගැස්මක් තියෙනව. ඒ ප්‍රතිවිප්ලවවාදී හැඩ ගැසීම ඉතාමත් පැහැදිලි ලෙස පේන්න තියෙනව දැන්. පසුගිය කාලෙ අර වැන්ඩිලුබේල සමසමාජ කොමියුනිස්ට් රැස්වීම් වල ඡන්දෙ ඉල්ලගෙන ගියා. මතකද? ඒ කාලෙ සිරිමට බැන්න. කියන්න තියෙන දේවල් සේරම කියල. රදළ අම්මණ්ඩියි කීව. අරකයි කීව. මේකයි කීව. ඔක්කෝම කිව්ව. දැන් මේ පාර පූට්ටු වෙන්න කැමතියිලු, පොදු හතුරාව පරාජය කරන්න. යූ.ඇන්.පී එක නොවෙයි පාර්ලිමේන්තුවට කොහොම හරි බඩගාන්න බලන්න. ඒකයි. ගියපාර හැදුව, සමසමාජ කාමියුනිස්ට් පක්ෂෙ එල්ලිල යන්න. බැරුව ගියා. මේ පාර සාරිපොටේ හරි එල්ලිලා යන්න පුළුවන්ද කියලයි බලන්නෙ. ඉතින් ඔය වගේ අවස්ථාවාදී දේශපාලනයක් කරන කොට අපිට කේ.ජී.බී.කාරයොයි කියන්න පූළුවන්. අපට සී.අයි.ඒකාරයොයි කියන්න පූළුවන්. අපිට යූ.ඇන්.පී. කියන්න පුළුවන්. අපට තවත් දේවල් කියන්න පුළුවන්. ඒ කියන කියන දේවලට උත්තර දිදී ඉන්න අවශ්‍යතාවයකුත් නැහැ. හැකියාවකුත් නැහැ. අපට ඊට වඩා වැඩ කරන්න තියෙනව. අපි දන්නව පීටර් කෙනමන් හොඳට අඳුරනව. අපේ පරණ ගුරුන්නාන්සෙ නේ.. එයා ඒ කාලෙ කිව්වෙ මොකක්ද දන්නවද? ෂන්මුගදාසන්ට විරුද්ධව කියපු එකක් තමයි, මේ මොනව හරි අවලාදයක් දමල ගහන්න ඕනෑලු. දමල ගැහුවම ඕක අල්ලගෙන ඒකෙ

පැටලිල ඕකට උත්තර දි දී ඉන්නවලු. එතකොට ප්‍රතිපත්තිවත් කියන්න වෙලාවක් නැතිලු. තේරුණායි. ඉතින් ඕක තමයි අපටත් එයා කරන්න යන සෙල්ලම. මං ඕකට ඉස්සරත් කිව්ව පීටර් තමුසෙගෙ වල්ලෙම පොල් ගෙඩියක් තමයි, ෂන්මුගදාසන්. ඒ නිසා එක වල්ලෙම පොල්ගෙ ඩියක් නිසා ඒවට එයා උත්තර දිදී ඉඳියි. නමුත් අපි ඊට වඩා බාල වල්ලෙ බව මතක තියාගන්නව. (සභාවෙන් සිනා සහ අත්පොලසන්) ඒ නිසා අපි ඒ සෙල්ලම කරන්න යන්නෙ නෑ. මං මේ කරුණු ටික සහෝදරවරුන්ට කිව්වෙ මොකද ඕක උඩින් දාල ඇත්ත පත්තරෙනුයි දිනකර පත්තරෙනුයි අපේ සහෝදරවරුන්ට ගිහිල්ලා, ආ... ඔන්න ඔන්න ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව හොඳයිලු. අපේ සහෝදරවරු දන්නව අපි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව හොඳයි කියන්නෙ නෑ කියල. ඇයි අපේ හිතවතෙක්වත් කියන්නෙ නෑනෙ. ධනපති ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් හොඳයි කියන කෙනෙක් ඉන්නවද? ඔය කාගෙහරි සහෝදරයකුගෙන් ඇහුවම ඕනම ධනපති ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් ගැන. ඕක හොඳයි කියන කෙනෙක් ඉන්නවද? එහෙම උදවිය අපි ගාව නෑ. ඕනැනම් ඉඳිවී අර තරුණ සමිතිවලට එවල තියෙනව සී.අයි.ඩී එකෙන් ඒජන්තල කීප දෙනෙක්. අන්න ඒ ගොල්ල ඕනනම් කියයි. අපි දන්නව ඒ විතරක් නොවෙයි කොමියුනිස්ට් පක්‍ෂෙත් එවල තියෙනව. අපි ඒකත් දන්නව. ඉතින් ඒගොල්ලො අපි ඉන්දගෙන ඉන්නව. හිටියට කමක් නෑ එහෙම.

ඉතින් සහෝදරවරුනි ඊළඟට අපි ආපු වැඩේ අපි කරන්න ආපු වැඩේ කරමු. පොඩ්ඩක් පැත්තකට යන්න සිද්ධ වුනා. මොකද මේ සහෝදරවරුන්ට මේ ගැනත් යමක් කියන්න ඕන නිසා මේ ........... ජාත්‍යන්තර වශයෙන් විතරක් නොවෙයි. මෙහෙත් කරනවයි කියල. මොකද දැන් 'ඇත්ත' පත්තරෙයි ජනදිනෙයි දැම්ම නේ , ඊට පස්සෙ ඔය මාඕවාදීන් කියාගන්න උදවිය ඔන්න ඇත්ත පත්තරෙය, දිනකර පත්තරෙයි අරගෙන එතැනින් තමයි පටන් ගත්තෙ එන්න කියල. ඇයි ඒගොල්ලො යටින් යාළුයි. යටින් යාළුයි කියන්නෙ රුසියාවයි චීනෙයි එහෙ ගහගන්නව. මෙහෙ කොමියුනිස්ට් පක්‍ෂෙ, ඇත්ත පත්තරේ වෑන් එකේ කොමියුනිස්ට් සමසමාජ මැයි දින පෝස්ටර් අලවන ගමන්ම මාඕවාදින්ගෙ සහ සියලු ද්‍රෝහීන්ගෙ එක්සත් මැයි දින රැලියේ පෝස්ටර් එකත් ඒ වෑන් එකේම අලව අලව යනව. සහෝදරවරු දන්නවද මේ රහසක් මම කිව්වෙ. මගෙයි ගමනායක සහෝදරයගෙයි, බෝපගේ සහෝදරයගෙයි, තවත් සහෝදරයෙකුගෙයි ඇහැට දැකපු

රහසක් පුංචි බොරැල්ලෙ හන්දියෙ 27 අප්‍රේල්, මට මතක හැටියට. 27 වෙනිද අප්‍රේල් ඇහින් දැක්ක. ඇයි සමසමාජ පෝස්ටර් එක අලවන ඇත්ත පත්තරේ වෑන් එක, කිරිපාට වැන් එක, අලවනව වාසුදේවගෙයි සියලු මාඕවාදීන්ගෙයි එක්සත් මැයි රැලියේ පෝස්ටර් එක. සෝවියට් දේශයෙ සමසමාජ අධිරාජ්‍යයක් කියල විද්‍යාලංකාරෙ කොමියුනිස්ට් පක්ෂය ශිෂ්‍ය සංගමයෙන් පංති තියෙනව. ලස්සනයි නේද වැඩේ. මෙහෙ කේ.ජී.බී එක නැති කරන්න කතා කරන සමහර නායකයො පස්ස දොරෙන් ගිහිල්ල කොමියුනිස්ට් පක්ෂෙ සමහර නායකයො එක්ක ජනතා විමුක්ති පෙරමුණට විරුද්ධව පොදු උපාය මාර්ගයක් සැකසිය යුත්තේ සැකසිය හැක්කේ කෙසේද කියල රහස් සාකච්ඡා කරනව. පොදු උපාය මාර්ගයත් දොගොල්ලම එකට......... කෝඩිනේට් කරල එකට සම්බන්ධ කරල පහරදීමක් කරන්නෙ කොහොමද කියල.

ජනතා විමුක්ති පෙරමුණ තමයි තර්ජනේ දැන්. දැන් පීටර් කේනමන් උන්නැහේ ගේ අලුත් ලයින් එක එයාගෙ කතුවැකියෙන් සම්පූර්ණයෙන් පැනල තියෙනව. දැන් කිය කියා යනව ජනතා විමුක්ති පෙරමුණ ඇතුලෙ මතභේද, මතභේද කියල. මේ මායි ගමනායක සහෝදරයයි අතරෙත් මතභේදලු. දැන් හෝ ගාල ඇවිල්ල අහනව අපෙන්. මොකද පීටර්ට තියෙනව මානසික ලෙඩක් ඒකට කරන්නෙ මොකද දන්නවද? හැමදාම ඉතිහාසයෙ ඔහොමයි. එයා මොකක් හරි ප්‍රශ්නයක් තියෙනව නම් ඒක හැම වෙලාවෙම එයාගෙ හිතේ වැඩ කරනව. ඒක වෙන කාගෙ හරි පිටින් තියනව. එයාට ප්‍රශ්නයක් පක්ෂය ඇතුළෙ තියෙනවනෙ. පක්ෂය බෙදිල. 19-13 මධ්‍යම කාරක සභාව බෙදිල දෙකට. නෑ, 13-17 යි. එක්කෙනෙකුට , එක මධ්‍යම කාරක සභිකයෙක් තවත් මධ්‍යම කාරක සභිකයෙකුට දාමරිකයන් ලවා ගස්සවල. ඒ මධ්‍යම කාරක සභිකය පක්ෂයෙන් පිටට ගියා. ඒ අපූරු සහෝදරත්වයනේ, මධ්‍යම කාරක සභාවෙ දෙන්නගෙන් එක්කෙනෙක් එක්කෙනෙකුට ගස්සවනව, දාමරිකයන්ට කියල. ජේමන්ට් එකේ යනකොට. මොන විදිහෙ සමාජවාදයක්ද රටට හදල දෙන්නෙ කියල තේරෙනවනෙ. රට හදල දෙන්නෙ මොකක්ද කියල. මෙන්න එයා ගියාට පස්සෙ 13යි 17යි. ඔතන බෙදිල. කවුරුත් දන්නව ගහගන්නවයි කියල. ඉතින් දැන් ලෝකෙටම කියන්න ඕනෑ අයියෝ! ජනතා විමුක්ති පෙරමුණෙත් මතභේද මතභේද කියල. පත්තර දෙකකත් පීටර් ලියල තියෙනව. ෆෝවර්ඩ් පත්තර දෙකක්.

මේකටත් යමක් කියන්න ඕන. මම නැති කාලෙ වෙච්ච දේවල්. එක පත්තරේක ලියල තියෙනව, මිස්ට විජේවීර කියල කොලමක්. ඒක ගෙනිහිල්ල කියුබාවෙ බෙදුව. මොකද මේ අර ආපු විප්ලවවාදී ව්‍යාපාර අපි එක්ක සම්බන්ධකම් ඇති කර ගන්න එක නැති කරන්න. විජේවීර සෝවියට් විරෝධියෙක්:, විජේවීර කියුබන් විරෝධීයෙක්. විජේවීර මේ බොරු කයිවාරු තමයි ගහන්නෙ, රුසියාවට යනවයි කියල. පැය 24යි අරකයි මේකයි කියල. මම කොමියුනිස්ට් පක්‍ෂ තරුණ සමිති වල සාමාජික සාමාජිකාවන්ගෙන් අහනව. පීටර් ඔබලට කියල නැද්ද දැන් විජේවීරට ආයෙත් රුසියාවෙ යන්න දෙන්නෙ නෑ කියල. පැය 24ක් ගුවන් තොටුපලේ විතරක් ඉඳල එන්න පුළුවන් කියල. නෑ ඔන්න මම දවස් 7ක් හිටිය කියල සාක්‍ෂිත් තියෙනව. කොමියුනිස්ට් පක්‍ෂ හතරදෙනෙක් හිටිය ඒ කාලෙම දැන් ඉතින් පීටර්ගෙන්ම ගිහිල්ල අහන්න මොකක්ද වුණේ කියල. දැන් මොකද කියන්නෙ බලන්න.ඔය මිනිහ දැන්වත් ඔයාලට ඇත්ත කියනවද බලන්න. නායකයෙක් තමන්ගෙ පක්‍ෂ උදවියට බොරු කියනව. රටට බොරු කියන එක ගැන පුදුම වෙන්න ඕනැයැ මේ යකා (සභාවෙන් සිනා) සහෝදරවරුනි, මිනිහ ඊළඟට ඇත්ත පත්තරේ දාල තියෙනවා, මොකක්ද දන්නවද? මේ ගියපාර ෆෝවර්ඩ් පත්තරේ දාල තියෙනව ජනතා විමුක්ති පෙරමුණ ඇතුලෙ හරි කලබලලු. ජනතා විමුක්ති පෙරමුණේ උදවිය කියනවලු විජේවීර ඒගොල්ලන්ගෙ එකම ඒකායන නායකය නම් නොවේය. දේශපාලන මණ්ඩලයෙ සාමාජිකයෙකි කියල. කව්රුත් කිව්වෙ නෑ. මමවත් වෙන කවුරුවත් කවදාවත් කිව්වෙ නෑ අපේ එකම ඒකායන නායකයෙක් ඉන්නවයි කියල. මාක්ස්වාදී පක්ෂයක එහෙම අය නෑ. අපේ පක්‍ෂ මාක්ස්- ලෙනින්වාදී පක්ෂයක්. එහෙම අය කොහොමවත් හිටියෙත් නෑ. ඇත්තෙත් නෑ. එන්නෙත් නෑ මත්තටත්.

මම දේශපාලන මණ්ඩලයේ සාමාජිකයෙක් පමණයි. මං ප්‍රධාන ලේකම් ධූරයෙ හිටිය මුලදි. මම විසින්ම ප්‍රධාන ලේකම් ධූරයෙන් අස්වුනා. අස්වෙල අපේ පක්‍ෂ තමයි ප්‍රධාන ලේකම් කෙනෙක් තෝර ගන්න බැරුව, මොකද දන්නවද කව්රුවත් භාරගන්නෙ නෑ. අනික් පක්ෂ වල නම් මේකට තරඟේ බෙලි කපනව. පිහි අනිනව. (සභාවෙන් සිනා) හරිද? අපේ පක්‍ෂ එහෙම නොවෙයි. මේක වගකීම - වගකීම් උසුලන්න බොහොම අමරුවෙන් තමයි ගමනායක සහෝදරය පත් කළේ. එයාට බැරියෙයි කියද්දි. ඉතින් අපි අතර බොහොම සහෝදරත්වයක්

තියෙන්නෙ. සටන තුළින් ඇතිවෙච්ච සහෝදරත්වයක්. දුෂ්කර තත්ත්වයන් තුළින් ඇති වෙච්ච සහෝදරත්වයක්. දැන් ධනපති පත්තර හදනවලු විජේවීරට හොඳ සායමක් තවරන්න. බොහොම ලොකුවට පුද්ගාභිවාදනයක් හදනවලු. ඒකට විරුද්ධ වෙලා ජනතා විමුක්ති පෙරමුණ දැන් 'නම්' වත් ගහන්නෙ නැතිලු කථිකයන්ගෙ. - ගමනායක සහෝදරය හිනහත් වෙනව ඒක නිසා දැන් නම් නොගහ ඉන්නවලු. එහෙම කිව්වයි කියල දැන් මෙන්න මතභේද කියල රටට පෙන්වනව. මොකද මේ? මානසික යුද්ධ උපක්‍රම පාවිච්චි කරන විශේෂඥයෙක් කියල පීටර් කෙනමනුත් දැන් එළිදරව් වෙලා. ඒක ඇමරිකන් කාරයින් ගෙන් ණයට අරගෙන. ඇමරිකන්කාරයො මානසික යුද්ධ උපක්‍රම තමයි පාවිච්චි කළේ, විප්ලවවාදී ව්‍යාපාරවලට විරුද්ධව. අපේ පක්ෂයටත් විරුද්ධව එහෙම පාවිච්චි කළා. අපි ඒවා හෙළිදරව් කළා. මලයාවෙන් මලයාසියාවෙන්- ඉගෙන ගනිපුව තමයි මේ කරන්නෙ කියල, අපේ පක්ෂෙට විරුද්ධව. ඒව දැන් පීටර් මෙතන පාවිච්චි කරනව. මේ රටේ මිනිස්සුන්ට ගිහිල්ල කියන්න අයියෝ මේ ජනතා විමුක්ති පෙරමුණ ගැන විශ්වාසය තියන්න එපා. මොකද දැන් වැඩක් නෑ. උන්ගෙ නායකයො අතර සමගියක් නෑනේ. පීටර්! අපේ සමගිය අපි බලාගන්නම්. උඹ අඩුගානෙ මේ පාර ඇපේ ගියා. ලබනපාර මේ පාර ගත්ත ඡන්ද ටිකවත් ගන්න සමගියක් ඇති කරගන්න බලපන්. (සභාවෙන් සිනා සහ අත්පොළසන්) මේ විදිහෙ සහෝදරය මේව කියන්නෙ මේ හැමදාම මේව කතාකර කර ඉන්න බෑ. ඇත්ත වශයෙන්ම මගේ ලෙඩේ සනීප වෙලයි කියල මං දැනගත්තට පස්සෙ මං පක්ෂ ප්‍රධාන ලේකම් සහෝදරයටයි දේශපාලන මණ්ඩලයටයි හමුවුණු ගමන්ම කියල, අපේ සහෝදරවරු හරි සන්තෝසෙන් හිටිය. මොකද අපට හුඟක් වැඩ කරන්න තියෙනව. අපිට ඉතාම දුෂ්කර ගමනක් දීර්ඝ ගමනක් යන්න වෙලා තියෙනව. අපි මේ ගමන යන්න දැඩි අධිෂ්ඨානයකින් පටන් අරගෙන තියෙන්නෙ, අලුතෙන්. අපිට හුඟක් වැඩ කරන්න තියෙනව. අපට හැමදාම මේ ජරමරකාරයින්ගෙ අවලාද වලට උත්තර දිදී ඉන්න බෑ. අපට හුඟක් වැඩ තියෙනව. ඒ නිසා අපි සහෝදරවරුන්ට කියන්නෙ මේ වගේ ඒව ඉස්සරහට නොයෙකුත් කොතෙකුත් අවලාද නගයි. මේ අවලාද ගැන කථාකරන්නත් අවශ්‍ය නෑ. අපි අපේ වැඩ කටයුතු කරගෙන යමු. සහෝදරවරුන්ට පැහැදිලියි අපේ ප්‍රතිපත්ති ප්‍රකාශනයක් අපි දීල තියෙනව. අපේ ක්‍රියාමාර්ගය, වැඩපිළිවෙල අපි ඉදිරිපත් කරල තියෙනව. අපි පැහැදිලි මාවතක ඉදිරියට යන්න පටන් අරන් තියෙනව.

මේක ඉතාම ලේසි පහසු එකක් නොවෙයි. ඉතාම දුෂ්කර එකක්. නමුත් යා හැකි එකක්. යා යුතුම එකක්. ඒ නිසා අපි සහෝදරවරුන්ට කියන්නෙ කලබල වෙන්න ඕනෑ නෑ. මේ ගොල්ලො කියපුවාට විරුද්ධව අපි ඒ ආකාරයෙන් ක්‍රියා කරමු.

දැන් පළවෙනි ප්‍රශ්නය තියෙන්නෙ මේකයි. දැන් වියට්නාමය ආරක්ෂා කිරීම පිළිබඳ ප්‍රශ්නයක් ඇවිල්ල තියෙනව. වියට්නාමය ආරක්ෂා කිරීම වියට්නාම් නිර්ධන පංතියෙ විතරක් යුතුකමක් නොවෙයි. වියට්නාමය අපි වෙනුවෙනුයි සටන් කළේ. වියට්නාමය පවතින්නෙත් වියට්නාම් විප්ලවය ඉදිරියට යන්නෙත් අපි වෙනුවෙන්. ඒ නිසා අපි නිර්ධන පංති ජාත්‍යන්තරවාදීන් වශයෙන් තේරුම් අරං තියෙනව වියට්නාම් විප්ලවය ආරක්ෂා කරන්න, කළ හැකි, කළ යුතු හැම දෙයක්ම අපි කරන්න ඕනැය කියල. ඒ නිසා සහෝදරවරුන්ට අපි ආයාචනයක් කරනව. සහෝදරවරුනි, මේ තත්වය යටතේ අපේ පක්ෂ මධ්‍යම කාරක සභාව තිරණයක් අරගෙන තියෙනව, වියට්නාම් විප්ලවය ආරක්ෂා කිරීම සඳහා මේ රටේ නිර්ධන පංතිය විසින් කළ යුතු, කළ හැකි සියලු දෙයක්ම කරන්න අවශ්‍යයි. තානාපති කාර්යාලවල සාදවලට යන සංවිධානයක් නොවෙයි. ජනමතයක් ඇති කිරීම සඳහා නිර්ධන පංතියට වියට්නාම් විප්ලවය ආරක්ෂා කළ හැක්කේ කළ යුත්තේ මන්ද කියල පැහැදිලි අවබෝධයක් දීම සඳහා වියට්නාම් විප්ලවය ආරක්ෂා කිරීම සඳහා ඇපකැප වෙලා, ජේවෙලා වැඩ කිරීම සඳහා අවශ්‍ය සංවිධානයක් ගොඩනගන්න ඕනැයි කියල. අපි තමුන්නාන්සේල ඉදිරියට අද ආවෙ මෙන්න මේ යෝජනාවකුත් අරගෙන පක්ෂය වෙනුවෙන්. තව මොහොතකින් අපි ඒ යෝජනාව තමුන්නාන්සේලා හමුවෙ තබනව. තබල , තමුන්නාන්සේලගෙ සහයෝගය ඉල්ලනව, ඒ යෝජනාව අනුමත කරන්නෙයි කියල. මොකද වියට්නාම, 'වියට්නාම් විප්ලවය සුරැකීමේ ලංකා කමිටුව' ක් හැදීමේ අවශ්‍යතාවය අපිත් ජාත්‍යන්තර විප්ලවවාදී ව්‍යාපාරයමත් වියට්නාම් කොමියුනිස්ට් පක්ෂය ඇතුළු වියට්නාම් විප්ලවවාදී ව්‍යාපාරයත් හොඳින් අවබෝධ කරගෙන තියෙනව. වියට්නාම් සහයෝගීතා සංගම්, අර සංගම් මේ සංගම් කියල තියෙනව. සහෝදරවරු දන්නව ඒ සංගම්වල වැඩේ තමයි එක්කො මොනව හරි ටිකක් බොන්න පාටියක් හරිගස්සන එක. ඒ වගේ මොකක් හරි වැඩක් කරනව. ඒ ඇරෙන්න වියට්නාමය ආරක්ෂා කිරීමේ සැබෑ පංති උවමනාවක් තියෙන අයගෙන් සමන්විත එකක් නොවෙයි.

අන්න ඒ නිසා වියට්නාමය කියන විප්ලවවාදී රට, ආරක්‍ෂා කරන්න වියට්නාම් විප්ලවය ආරක්‍ෂා කරන්න මේ රටේ අවශ්‍ය කොටසක් ඉන්නව නම් ඒ තමයි නිර්ධන පංති විප්ලවවාදී ව්‍යාපාරය. අන්න ඒ නිර්ධන පංති විප්ලවවාදී ව්‍යාපාරයෙන් සැදුම්ලත් ලාංකික කමිටුවක් හැදීමේ අවශ්‍යතාවයක් තියෙනව. මෙන්න මේ කමිටුවක් හදල, මෙන්න මේ කමිටුවේ මෙහෙයවීම යටතේ ඉදිරියට වියට්නාම් විප්ලවයට සහයෝගීතාවය දැක්වීමක්. වියට්නාම් විප්ලවයට කුමන පැත්තකින් හරි එන තර්ජනයන්ගෙන් ගර්ජනයන්ගෙන් ආරක්‍ෂා කිරීම සඳහාත් මේ රටේ නිර්ධන පංතිය පැත්තෙන් වෙන්න ඕන......... නිර්ධන පංති ජාත්‍යන්තරවාදී යුතුකම් සම්භාරය ඉෂ්ඨකරන්න ක්‍රියා කරන්නෙයි කියල. අපි තමුන්නාන්සේලගෙන් ඉල්ලනව සහෝදරවරනි. සහෝදරවරුනි, මං මේ යෝජනාව ජනතා විමුක්ති පෙරමුණේ තාවකාලික මධ්‍යම කමිටුව වෙනුවෙන් කියවනව. ඒක දෙමළ භාෂාවටත් පරිවර්තනය කරනව ඇති පසුව.

වියට්නාම් විප්ලවය ආරක්‍ෂා කිරීම සඳහා 1978 සැප්ː 6 වෙනිදා කොළඹ නව නගර ශාලාවේදී ජනතා විමුක්ති පෙරමුණේ මෙහෙයවීමෙන් පැවැත්වූ ජන සභාවේදී අනුමත කරන යෝජනාවː,

1. යැංකි අධිරාජ්‍යවාදයත් එහි නව සගයිනුත් එකට එකතු වී වියට්නාම් සමාජවාදී විප්ලවයට එරෙහිව ගෙනයන සාපරාධි ප්‍රකෝපකාරී ආක්‍රමණකාරී ක්‍රියාදාමයට දැඩිලෙස එරෙහි වන මේ ජන සභාව, වියට්නාම් කොමියුනිස්ට් පක්‍ෂයටත්, වියට්නාම් ජනතාවටත්, වියට්නාම් සමාජවාදී ජනරජයටත් උණුසුම් විප්ලවවාදී සහෝදරාත්මක සහයෝගිතාවය පලකර සිටින අතර වියට්නාම් සමාජවාදී විප්ලවයේ ජයග්‍රහණය සුරැකීමට පෙරමුණ ගන්නා ලෙස මුළු මහත් ප්‍රගතශීලී මිනිස් වර්ගයාගෙන්ම ඉල්ලා සිටී.

2. යැංකි අධිරාජ්‍යවාදයේ නියම හුරතලුන් බවට පත්වී සිටින චීන නායකත්වයත්, කාම්බෝජ නායකත්වයත්, චීන සහ කාම්බෝජ ජනතාවද එම ජනතාවගේ විප්ලවීය උරුමයන්ද පාවා දෙමින් සමස්ත ලෝකයෝම විප්ලවීය ව්‍යාපාරයට එරෙහිව ප්‍රතිවිප්ලවයේ ජයග්‍රහණය උදෙසා ගෙනයන අන්ත ප්‍රතිගාමී ක්‍රියාදාමය දැඩි පංති ද්වේෂයෙන් හෙළාදකින මෙම ජන සභාව, යැංකි චීන ප්‍රතිවිප්ලවීය සන්ධානය බිඳ හෙළීමට දැඩි ලෙස ක්‍රියාකරන ලෙසද එය හෙළාදකින ලෙසද මුළු මහත් ප්‍රගතශීලී මිනිස් වර්ගයාගෙන් ඉල්ලා සිටී.

3. වියට්නාම් සමාජවාදී විප්ලවයේ ජයග්‍රහණයන් හා සියලු ඵල ප්‍රයෝජනයන් රැක ගැනීම සඳහා අත්‍යාවශ්‍ය වන්නා වූ නිර්ධන පංති ජාත්‍යන්තරවාදී යුතුකම් සම්භාරය සපුරාලීමේ එක් ඉදිරි පියවරක් වශයෙන් ''වියට්නාම් විප්ලවය සුරැකීමේ ලංකා කමිටුව'' ගොඩ නැගීමට මේ ජන සභාව විප්ලවීය පංති හැඟීමෙන් යුතුව තීරණය කරසිටී. (යෝජනාවේ දෙමළ පිටපත ළඟ ඇති සහෝදරයාගෙන් එය ගෙන එන මෙන් ඉල්ලීමක් කරයි)

මේ පිළිබඳව මේ යෝජනාව අපි සභාව හමුවට ඉදිරිපත් කරනව. සභාවෙ අනුමැතිය සඳහා. මේ යෝජනා තුනට පක්‍ෂ සහෝදරවරුන් කරුණාකර අත් එසවීමෙන් එයට පක්‍ෂපාතීත්වය පල කරන්නෙයි කියල මා ඉල්ලා සිටිනව. (සභාවෙන් වියට්නාම් විප්ලවය ආරක්‍ෂා කරව්! ආදී වශයෙන් සටන් පාඨ කියමින් අත්පොළසන් දෙමින් යෝජනාව අනුමත කරයි) මේ යෝජනාවට විරුද්ධව අය අත් ඔසවන්න (නිශ්ශබ්දතාවය) කව්රුත් නෑ. විරුද්ධ අය? මධ්‍යස්ථ අය ඉන්නවද? ඒත් නෑ. එහෙම නම් අපි පිළිගන්නව මේ යෝජනාව ඒකමතිකව සම්මත වූ බවට. ඊළඟට අපි (අත්පොළසන්) මේ පැමිණ සිටින සභාවේ සාමාජිකයින් සියලු දෙනාගේම අනුමැතිය ලැබුණු යෝජනාවක් හැටියට මේ යෝජනාව අපි යවනව වියට්නාම් කොමියුනිස්ට් පක්‍ෂ මධ්‍යම පුවත්පතට. ''නාන්දා'' පුවත්පතට. මොකද ''නාන්දා'' පුවත්පත මීට කලින් ජනතා විමුක්ති පෙරමුණේ වියට්නාම් විප්ලවයට සහයෝගය පළකිරීමේ යෝජනාව මහ ඉහළින් පළකර තිබුණා. පහුගිය අගෝස්තු මාසෙ 10 වෙනිද. ඒගොල්ල දන්වල එවල තියෙනව අපේ මොනවහරි වැදගත් ලියවිල්ලක් තියෙනව නම් ඒගොල්ලන්ට එවන්නෙයි කියල. මේක ජනතා විමුක්ති පෙරමුණේ යෝජනාවක් හැටියට නොවෙයි තවදුරටත් අපි යවනව මේ ජන සභාව විසින් අනුමත කරපු යෝජනාවක් හැටියට. මොකද මේ සභාව අනුමත කළ නිසා.

ඊළඟට අපි බලාපොරොත්තු වෙනව මේ පිළිබඳව මේ සංවිධාන කමිටුවට බැඳෙන්නට කැමති සියලු සහෝදරවරුන්ට මේ වියට්නාමය සුරැකීමේ කමිටුවට බැඳෙන්න කැමති සියලු දෙනාම තමන්ගේ ලිපිනය සහිතව දැනුම් දෙන්න කියල. අංක 14,කේ සිරිල් සී පෙරේරා මාවත, කොළඹ 13 කියන ලිපිනයට, තමන් මේ සංවිධානයට බැඳෙන්න කැමතියි කියල. ඒ සාමාජිකයින් බැඳුනට පස්සෙ අපි සාමාජිකයන්ගෙ රැස්වීමක් පවත්වනව මේ සංවිධානයෙ ඉදිරි වැඩකටයුතු කිරීම සඳහා. ඊළඟට

සහෝදරවරුනි, තව ටික වෙලාවකින් අපි වියට්නාමය පිළිබඳ කෙටි චිත්‍රපටියක් පෙන්වීමට අදහස් කරනව. ඊට ඉස්සෙල්ල තවත් මූලික කරුණු කීපයක් තියෙනව මට තමුන්නාන්සෙල සමග කතා කිරීමට. ඒ කියන්නෙ සහෝදරවරුනි, මම මාස කීපයක් ලංකාවෙ හිටියෙ නෑ. පක්ෂය වෙනුවෙන් ජාත්‍යන්තර වැඩ කටයුතු කීපයක යෙදිල හිටිය ලෙඩට බේත් ගන්න වගේම. ඒ අවස්ථාවෙ ඇතිවෙච්ච ප්‍රශ්න කීපයක් පිළිබඳවත් ඉදිරියට ඇති වෙන්න පුළුවන් ප්‍රශ්න කීපයක් පිළිබඳවත් යමක් කියන්ට අපට අවශ්‍යතාවය තියෙනව. මේ අවස්ථාවෙදි. සහෝදරවරුනි මේ මාසෙ 22 වනිද ප්‍රසිද්ධ රැලියක් පවත්වනව. කැම්බල් පිටියේදි. ප්‍රසිද්ධ රැලියක් සහ විප්ලවීය සංගීත සංදර්ශනයක්. ඒ රැලිය පවත්වන්නෙ අපේ පක්ෂයෙ ඉදිරි ක්‍රියාමාර්ගය පැහැදිලි ලෙස ජනතාවට ඉදිරිපත් කිරීම සඳහා, ඊට අමතරව දැන් මේ ජාත්‍යන්තර ප්‍රශ්නයක් සම්බන්ධයෙන් කතා කරපු තත්ත්වය යටතේ අපට අවශ්‍ය වෙලා තියෙනව අපේ විදේශ ප්‍රතිපත්තිය පිළිබඳව පැහැදිලි යමක් කියන්නට තමුන්නාන්සේලාට. දැන් නොයෙක් තැන් වල කසුකුසු යනව ආ................ දැන් රුසියාවෙ පැත්ත අරන් රුසියාවට ගිහිල්ල තමයි මිනිස්සු ටික. ඒ පිළිබඳවත් ප්‍රසිද්ධියෙ අපේ ප්‍රතිපත්ති අපට කියන්න පුළුවන්. අපි ඒ නිසා රැස්වීම්වලදි මේ වගේ තැන් වලදි අපේ ප්‍රතිපත්ති කියනව. සහෝදරවරුනි අපට රුසියාවෙ පැත්තට හෝ චීනෙ පැත්තට හෝ වෙනත් රටක පැත්තට යාමේ ප්‍රශ්නයක් කවදාවත් තිබුනෙත් නෑ. ඇත්තෙත් නෑ. අපට තියෙන ප්‍රශ්නය තමයි මාක්ස් ලෙනින්වාදයෙ පැත්ත ගැනීම, නිර්ධන පංති ජාත්‍යන්තරවාදී පැත්ත ගැනීම පිළිබඳ ප්‍රශ්නය. ඒ ප්‍රශ්නයෙදි වඩා නිවැරදිව ඉන්නෙ කව්ද කියන ප්‍රශ්නය උඩ අපි ඒතාක් දුරට ඒගොල්ලන් එක්ක සම්බන්ධකම් පවත්වනව.

මෙතැනදි අද පැහැදිලි ලෙසම පෙන්න තියෙනව මෙන්න මේ දේ, සහෝදරවරුනි ඇමරිකන් අධිරාජ්‍යවාදීන්ගෙ අද විදේශ ප්‍රතිපත්තියෙ ප්‍රධාන තීරණාත්මක අංගය වෙලා තියෙන්නේ සෝවියට් දේශයත් අනෙකුත් කම්කරු රාජ්‍යයනුත් විප්ලවවාදී ව්‍යාපාරයත් කොන් කිරීම සඳහා, අධිරාජ්‍යවාදී හා දියුණු ධනපති රටවලුත් අවශේෂ ප්‍රතිග ාමී ධනපති රටවලුත් යටත්විජිතවල සහ නව යටත්විජිතවල ඒ වගේම චීනයත් එකට එක්කහු කරල පළල් එක්සත් පෙරමුණක් හදන්න අර සෝවියට් සංගමයටත් අනෙක් කම්කරු රාජ්‍ය වලටත් විප්ලවවාදී ව්‍යාපාරවලටත් විරුද්ධව. මෙන්න මෙහෙම එක්සත් පෙරමුණක් හැදෙද්දි

අපට සහෝදරය පාඩුවෙ ඉන්න බෑ නිර්ධන පංති ජාත්‍යන්තරවාදීන් වශයෙන්. අපි ඒ නිසා පැහැදිලි ලෙසම කියනව මෙන්න මේ දැන් පවතින තත්ත්වයන් යටතේ ඇමරිකන්- චීන එක්සත් ප්‍රතිවිප්ලවවාදී ක්‍රියාමාර්ගයට විරුද්ධව කරන්න තියෙන, කරන්න පුළුවන් හැම දෙයක්ම ජනතා විමුක්ති පෙරමුණ දැනුවත්ව සහ ක්‍රියාත්මක කරනවයි කියල. මොකද? (අත්පොලසන්) ඒක අද ලෝක විප්ලවයේ අවශ්‍යතාවය සහෝදරවරුනි අපිට තියෙනව අපි හංගල නෑ. යම් යම් වෙනස්කම් මතවාදී, දේශපාලනමය ප්‍රතිපත්තිමය වෙනස්කම්. වෙනත් කම්කරු රාජ්‍යයන් සමග සෝවියට් සංගමය සමග. ඒ නිසා අපට පුළුවන්කමක් නෑ ඇමරිකන් අධිරාජ්‍යවාදයටත්, අනෙක් අධිරාජ්‍යවාදීන්ට හා ධනපතියන්ටත් ප්‍රතිවිප්ලවවාදී පැත්ත අරන් තියෙන චීන නායකත්වයත් එක්කහුවෙලා දැනටමත් ජාත්‍යන්තර නිර්ධන පංතිය විසින් යම්කිසි සුළු හෝ ජයග්‍රහණයක් ලබාගෙන තියෙනව නම් ඒව විනාශ කරල දාන්න ඉඩදීලා පැත්තකට වෙල ඉන්න අපට බෑ. ඒනිසා චීනයයි ඇමරිකාවයි අතර එකතුවෙලා තියෙන ප්‍රතිවිප්ලවවාදී සන්ධානය පිළිබඳ පැහැදිලි ස්ථාවරයක අපි ඉන්නව. ඒ සන්ධානයට අපි විරුද්ධයි, ඒක කඩන්න පුළුවන්. කඩන්න කරන්න තියෙන හැම දෙයක්ම අපි කරනව. ඒකට විරුද්ධව කරන්න තියෙන හැම දේකුත් කරනව. ඒ වගේම ලෝකයේ විප්ලවකාරී ව්‍යාපාරයට පක්ෂව කරන්න තියෙන හැම දෙයක්ම කරන්න අපි බැඳිල ඉන්නව. අපේ ප්‍රතිපත්ති ප්‍රකාශනයෙ විදේශ ප්‍රතිපත්තිය පිළිබඳ පැහැදිලි ලෙස අපි ස්ථාවරයක් අරන් තියෙනව.

ඒ ස්ථාවරයට අනුව මෙන්න මේ ඇමරිකන්-චීන සන්ධානයේදි අපි ඊට විරුද්ධ පැත්තෙ ඉඳගෙන විරුද්ධ පැත්තත් එකක් එක්කහුවෙල විරුද්ධ පැත්තත් එක්ක සහයෝගයෙන් ඇමරිකන් චීන ප්‍රතිවිප්ලවවාදී හවුලට විරුද්ධව රට තුළත් පිටස්තරවත් කරන්න තියෙන හැම දෙයක්ම කරනව සහෝදරවරුනි, කල්පනා කරල බලන්න. අපිත් සෝවියට් දේශයත් අතර වෙනස්කම් තියෙනව. අපි ඒක කවදාවත් හංගලත් නැහැ. නමුත් ඒ වෙනස්කම් නිසා අධිරාජ්‍යවාදීන්ට ඒකෙන් ප්‍රයෝජනය ගන්න ඉඩ දෙන්න අපිට පුළුවන්ද? බැහැ. දැන් මිනිස්සු කියනව ආ.......... ගියපාර මිග් ගෙනැවිත් දුන්නෙ නැද්ද රුසියාව උඹලට ගහන්න කියල. දුන්න. අපි දන්නව දුන්න. ගියපාර මිග් දුන්න නිසා ඒ වෛරයෙන්ද අපේ ප්‍රතිපත්ති හදන්නෙ අපි. නෑ. ජාත්‍යන්තර දේශපාලන ක්ෂේත්‍රයේ පවතින පංති බලවේගයන්ගේ ප්‍රතිවිරුද්ධතාවයත්,

ප්‍රතිබද්ධතාවයත් උඩයි අපි අපේ ප්‍රතිපත්ති හදන්නෙ. ඒ නිසා වෛරයකින් නොවෙයි. අපි චීනෙට විරුද්ධ වෙලා තියෙන්නේ චෞ-එන්ලායිගේ ලියුම නිසා නොවෙයි. චෞ-එන්ලායි රුපියල් කෝටි 15ක් දුන්න නිසා නොවෙයි. ඒගොල්ලන්ගෙ පොදු ප්‍රතිවිප්ලවීය ක්‍රියාමාර්ගය ලෝක විප්ලවයටම පරහතුරු වෙලා තියෙන නිසයි. ඉතින් සහෝදරවරුනි, ගියපාර මිග් දුන්න නිසා ආයෙත් සැරයක් මිග් දෙන විදියට වැඩ කරන්න ඕනැද? නෑ නේ. කවුරුවත් එහෙම යෝජනා කරන්නෙ නෑනෙ? නෑ. එහෙනම් අපේ ප්‍රතිපත්තිවල මූලික වෙනසක් කිසිසේත් වෙලා නෑ. ඇත්ත පත්තරකාරයනම් දානව හිටිය ගමන් ගමනායක රුසියාවට බැන්න. වාස් රුසියාවට හොඳ කිව්ව කියල. එහෙම නැත්නම් ආයෙ කියයි විජේවීර රුසියාවට හොඳ කිව්වා ගමනායක රුසියාව බැන්න, එක රැස්වීමෙදිම කියල. ඒක අමූලික මුසාවක්. අපේ පක්ෂය මේ පිළිබඳ පැහැදිලි ස්ථාවරයක ඉන්නව. ඒ ස්ථාවරයේ ඉඳන් අපි වැඩ කටයුතු කරනව.

මේ ළඟදි පත්තරේක දැක්කා අපි කියුබාවත් එක්ක එක්කහු වෙලා ජාත්‍යන්තරේ හදන්න යනව කිව්වලු. අපේ පක්ෂයේ කිසිම කෙනෙක් කියල නෑ අපි කියුබාවත් එක්ක ජාත්‍යන්තරේ හදන්න යනවයි කියල. කියුබාවට අපි සහයෝගය දෙනව. ඇමරිකන් අධිරාජ්‍යවාදීන් කියුබාවට තහංචි දාලා තියෙනව. අපි කියුබාවෙ පැත්ත අරන් ඇමරිකාවෙ තහංචිවලට විරුද්ධව ඉන්නව. ගුවන්තනාමෝ වල කඳවුරක් දාල තියෙනව අපි ඒකට විරුද්ධයි. කියුබාව කරල තියෙන සමාජ ප්‍රතිසංස්කරණවලට අපි පක්ෂයි. සමාජවාදී විප්ලවය ඉදිරියට ගෙනියනවට. ඒගොල්ලන්ගෙ නිර්ධන පංති ජාත්‍යන්තරවාදී ප්‍රතිපත්තියට අපි පක්ෂයි. කැස්ත්‍රෝ පැහැදිලි ලෙස කිව්ව, කීයටවත් නිර්ධන පංති ජාත්‍යන්තරවාදය අත්හරින්නෙ නෑ කියල. කිව්ව වගේම කරලත් තියෙනව. සමහර මිනිස්සු නම් කියනව කුලී හටයො ඇරල තියෙනවයි කුලී හටයො ආරක්ෂා කරනවයි කියල.

ඒ කියන්නෙ කව්ද? දකුණු අප්‍රිකාවෙන් කුලී හටයො ඇරිය, ඇමරිකාවෙන්, එංගලන්තෙන් ඇරිය කුලී හටයො, ඇංගෙ ෝලාවට. අපිට හම්බවුණා ඇංගෝලාව ගිහිල්ල සටන් කරපු මිනිස්සු කියුබාවෙදි. විප්ලවේ ආරක්ෂා කිරීමේ කමිටු හම්බවෙන්න අපි දවසක් රාත්‍රී ගියා. වාස් සහෝදරයයි මායි දෙන්නම ගියා. එක කමිටුවක් හම්බවෙන්න. ඒ කමිටුවෙ හිටියෙ වීදියෙන් වීදියට විප්ලවේ ආරක්ෂා

කිරීමේ කමිටු තියෙනව. එක් වීදියක අවුරුදු 14ට වැඩි සියලු දෙනාම ඒ කමිටුවෙ ඉන්නව. ඒ ගොල්ලන්ට තමයි ජනතාව සන්නද්ධ කරන්න ආවම ඒගොල්ලො 14ට වැඩි සේරටම තුවක්කු දෙනව. සහෝදරවරු දන්නව ඇති අපේ ප්‍රතිපත්ති ප්‍රකාශනයෙත් අපි කියල තියෙනව ත්‍රිවිධ හමුදා අයින් කරනවයි, ජනතාව සන්නද්ධ කරනවයි කියල. කියුබාව ජනතාව සන්නද්ධ කරන්න ඕන වුන ගමන් අවුරුදු 14න් වැඩි හැමෝම සංවිධානය වෙලා ඉන්නෙ. ඒ කමිටුවක් හම්බවෙන්න ගියාම, ඒ කමිටුවෙ හිටිය තුන් දෙනෙක් ඒ විදියෙ ඇංගෝලාවෙ ගිහිල්ල ආපු අය. කුලීහටයො නොවෙයි. අපි ඇහුව කුලියටද තමුසෙල සටන් කළේ කියල. සහෝදරය මොනවද කියන්නෙ අපිට කියල ඇහුව. අපි ගිහිල්ල මැරෙන්න ගියා, විප්ලවය වෙනුවෙන්, ලෝක විප්ලවය වෙනුවෙන් කියල අපට කිව්ව. (අත්පොලසන්) ඒ මිනිස්සු දැනුවත්ව අවබොධයෙන් යුතුව ඒක කරල තියෙන්නෙ. ඒ වගේ උදවිය ඒ වගේ ක්‍රියාමාර්ග ගන්නකොට ඒක පැහැදිලි ලෙස පෙනුන. එදා කුමකටද ඒක කළේ කියල. මොකක්ද එතන කළේ කියල. ඒ වගේ ක්‍රියාමාර්ග අපි අනුමත කරනව. අනුමත කරනව විතරක් නොවෙයි අපි ඒකට සහයෝගය දෙනව. අපි ඒක හංගල නොවෙයි කරන්නෙ. (අත්පොළසන්) මිනිස්සුන්ට ඕනෑ කෙනෙකුට කියන්න පුළුවන්.

අපි ජාත්‍යන්තරය ගොඩ නගව්! කියල සටන් පාඨයක් දාලා තියෙනව. ඒක තවමත් අපි කියනව. පැහැදිලි ලෙසම උද්ඝෝෂණ සටන් පාඨයක් පමණයි. උද්ඝෝෂණ සටන් පාඨයක් අපි දාල තියෙනව. ඒ උද්ඝෝෂණ සටන් පාඨය අපි බලාපොරොත්තු වෙනව අනාගතයෙ යම්කිසි දවසක සංවිධාන සටන් පාඨයක් බවට පත්කරන්න සංවිධානයක් ඒ වගේ ගොඩනැගීමට තරම් දුරට විප්ලවවාදී ව්‍යාපාර අතර සමගියක් ඇති කරන්න පදනමක් හරි ගැසුනාම. ඔව් අපි හංගන්නෙ නෑ. මම මාස තුනක් හිටිය. මේ මාස තුනේම ජනතා විමුක්ති පෙරමුණ වෙනුවෙන් අපි ලෝකයේ විප්ලවවාදී ව්‍යාපාර සේරම එක්ක සාකච්ඡා පැවැත්වූවා. මාක්ස්වාදී ව්‍යාපාර එක්කල. නොයෙක් මත දරන උදවිය අපට හම්බවුණා. නොයෙක් මතවාදයන් දරන උදවිය අපට හම්බවුණා. නොයෙක් විදියෙ දේශපාලන වෙනස්කම් තියෙන උදවිය අපට හම්බවුණා. ඒ අය අතර අපි එකඟතාවයකට ආව මෙන්න මේ විදියට විතරක්. අපි අතර මොන මතභේද තිබුනත් ඇමරිකන් අධිරාජ්‍යවාදය ප්‍රමුඛ අධිරාජ්‍යවාදයට විරුද්ධව අරගලයේදී අපි එකා වගේ එකට

එක්කහුවෙලා ඉන්න ඕනැයි කියල. (අත්පොළසන්) සහෝදරවරුනි, අපි හැමෝම සලකනව මේ රටේ නිර්ධන පංතියෙ ජගත් නිර්ධන පංතියේ අඛණ්ඩ වෙන්කළ නොහැකි කොටසක්. අපේ ජනතා විමුක්ති පෙරමුණත් ලෝක විප්ලවවාදි ව්‍යාපාරයේ වෙන්කළ නොහැකි කොටසක්. ඒ නිසා අපට සිද්ධ වෙලා තියෙනව ඇත්ත වශයෙන්ම ඒගොල්ලො සමග අත්වැල් බැඳගන්න. අපි අත්වැල් බැඳගන්නව. අපි ඒ නිසා ඇමරිකන් අධිරාජ්‍යවාදය ප්‍රමුඛ අධිරාජ්‍යවාදයට විරුද්ධව සටන් කරන කොයියම්ම රටක් එක්ක හරි කොයියම්ම සංවිධානයක් එක්ක හරි, ඒ සංවිධානයත් එක්ක පැවැත්විය යුතු, පැවැත්විය හැකි ආකාරයේ සහෝදරාත්මක සම්බන්ධකම් පවත්වනව. ඒක අපි හංගන්නේ නෑ.

ඒ නිසා අපි කොහොමහරි ගිහිල්ල හේත්තුවෙලා නෑ. අපි හේත්තු වෙලා තියෙනව එකම එක තැනකට පැහැදිලි ලෙසම. මාක්ස්, එංගල්ස් හා ලෙනින්ගේ ධර්මයට. අපි පැහැදිලි ලෙසම හේත්තු වෙලා ඉන්නව. (අත්පොළසන්) එතන ඉඳන් අපි නිර්ධන පංති ජාත්‍යන්තරවාදීන් වශයෙන් අපට කරන්න තියෙන, කරන්න පුළුවන්, හැමදේම අපි කරනව. ඒ නිසා අපේ විදේශ ප්‍රතිපත්තිය ගැන ඔය නොයෙක් දෙනා අරක කියයි, මේක කියයි. අපි ඊයෙ රුසියාවට බැන්නයි කියයි. අද හොඳ කියනවයි කියයි. අනිද්දා බැන්නයි කියයි. නෑ. අපි ඒ පිළිබඳව පැහැදිලි ස්ථාවරයක ඉන්නව. රුසියාව හොඳ දෙයක් කළොත් අපි හොඳයි කියනව. නරක දෙයක් කළොත් අපි කීයටවත් හොඳයි කියන්නෙ නෑ. අපේ පක්ෂය කවුරුවත් අපට හදල දීපු එකක් නොවෙයි. සහෝදරවරු දන්නවනේ. මේ රටේ නිර්ධන පංතිය විසින් ගොඩනගපු දෙයක්. දැන් කියනවලු රුසියන් රූබල්වලට පක්ෂය විකුණලා........ කියල. නෑ. වෙන වෙන සල්ලි වර්ග වලට විකුණපු උදවිය තමයි එහෙම කියන්නෙ. ඒගොල්ලන්ට පුරුද්ද තියෙන්නෙ විකුණල. දැන් මේ දේශනය ගැනත් කියල තිබුණ. දිනකර පත්තරය 'වියට්නාම් විප්ලවය රුපියලට විකුණයි' කියල. ඇයි අම්මයි, දූල දෙන්නයි, පුතයි, බෑනලයි ඔක්කොම කළේ මැරිච්ච මිනිහගේ මළකඳ විකුණං කන එක. (සභාවෙන් සිනා) විකුණං කාල, විකුණල තමයි පුරුද්ද. ඉතින් හිතන්නෙ අනෙක් මිනිස්සුත් මේ විකුණං කනව කියල. නෑ. අපි නම් විකුණන්නෙ නෑ. විකුණුවෙත් නෑ. අපි රුපියලක් සහෝදරවරුන්ගෙන් අය කළේ මෙන්න මේකයි සහෝදරවරුනි, අපට නෑ දාස මුදලාලිලා, උන්බිච්චිලා, අපට නෑ ඥානම්ල, සල්ලි දෙන්න. අපට මහාරාජාස්ල සල්ලි දෙන්නෙ නෑ. ඇයි

අනික් පක්‍ෂ දෙගොල්ලොටම දෙනව. එහාටයි මෙහාටයි දීල පාඩුවෙ ඉන්නව. ඡන්ද කාලෙ මොකා දිනුවත් උන් දිනුම. (සභාවෙන් සිනා) ඇයි? යූ.ඇන්.පී එක දිනුවත් ධනපති දිනුම්. ශ්‍රී ලංකා එක දිනුවත් ධනපතිය දිනුම්. දෙපැත්තටම සල්ලි දීලනෙ. අපි තමයි මෙහෙ මැරෙන්නේ ඡන්ද කාලෙ. ඉතින් අපිට එහෙම නැති නිසා - මේ හෝල් එකට සල්ලි ගෙවන්න ඕනැ. මේ ලවුඩ්ස් ස්පීකර්වලට සල්ලි ගෙවන්න ඕනැ. පෝස්ටර් ගහන්න සල්ලි හොයන්න ඕනැ. අපේ සහෝදරවරුන්ගෙන් සියයට 5ක් ලැබෙන අරමුදලෙන් විතරක් අපට ඔය සේරම කරන්න බෑ. අන්න ඒ තත්ත්වය යටතෙ බැලුවෙ මොකද, අපි ආධාර පත්‍රිකා විකුණුවම ආධාර පත්‍රිකා වලට සල්ලි දෙන්නෙ අපේ සහෝදරවරුයි, හිතවත්තුයි. ඒ මිනිස්සු කොහොමත් දෙනව. එතකොට මෙතන සී.අයි.ඩී එකෙන් සාමාජිකයො 100ක් විතර ඇවිල්ල ඉන්නවනෙ, ඒ ගොල්ලොත් දැන් එතකොට නිකං එනව. (සභාවෙන් සිනා) ඉතින් අපි බැලුවෙ මේක හරි අසාධාරණයි කියල. අපේ පක්‍ෂ සාමාජිකයො සල්ලි දීල එන්නයි. සී.අයි.ඩී එකේ මහත්තුරු සල්ලි නොදී නිකං ඇවිල්ල ඔත්තු හොයන්නයි. ඒක කරන්න දෙන්න බෑ. (සභාවෙන් සිනා) ඒ නිසා අපි කාටත් පොදු නීතියක් හැදුව රුපියලක් දීල කාටත් එන්න. අපේ සහෝදරවරු කොහොමත් දෙන එකනේ. (අත්පොළසන්) කල්පනා කරල බලන්න සාධාරණද? නැද්ද? (සභාවෙන් සාධාරණයි! සාධාරණයි!!,) ඉතින් ඕකට වියට්නාම් විප්ලවය විකුණුවලු.

ඉතිං මේ ටික මං කිව්වෙ සහෝදරවරුන්ට අපේ විදේශ ප්‍රතිපත්තිය ගැන පැහැදිලි ලෙසින්ම අපි පක්‍ෂ ප්‍රතිපත්ති ඉදිරිපත් කරල තියෙනව. ඒ පිළිගත්ත ප්‍රතිපත්තිවලින් ක්‍රියාමාර්ගවලින් පටහැණිව අපි කිසිදෙයක් කරල නෑ. ඇයි අපි පැහැදිලි තැනක ඉන්නව. පීටර් දවල් හීන දකිනව නම් හිතපුවාවෙ. එයා හිතාගෙන ඉන්නව විජේවීරට ගහල, වට්ටල, පැත්තකට දාල, ජනතා විමුක්ති පෙරමුණ උඩට පැනල රජ කරන්න පුළුවන් කියල. පීටර්............ ඉතිහාසය පුරාම දවල් හීන දැක්ක මිනිහෙක්. දවල් හීන දැකල නොවෙයි මේ පාර නම් දවල් තරුත් දකින්න යන්නෙ ඔය විදිහෙ කරන්න ගියොත්. ඇයි දැනටමත් මම තේරුම් අරන් තියෙනව. අපේ පක්‍ෂ සහෝදරවරු බොහොම කෝපෙන් ඉන්නව. ඇයි මේ මිනිහා හැම තැනම ගිහිල්ල කියන්නෙ කාටත් කොහොමද දන්නවද? කොමියුනිස්ට් පක්‍ෂය ගිහිල්ල කියනව ජනතා විමුක්ති පෙරමුණ අපිට බනිනවෝ............ කියල. ඉතින් දෙයියනේ අපට විරුද්ධව මේ වගේ අවලාද නගල ඒවට එයාට අයිතිය තියෙනව.

ඒවට වැරදියි කියල උත්තර දුන්නම කියනව බනිනවෝ.......... කියල. බැනල හරියන්නෙ නෑ දැන්.

දැන් මම එකක් කියන්නම්. සහෝදරවරුනි අපි තරුණ සමිති වලයි කම්කරු සමිතිවලයි තවත් ඉතුරුවෙලා ඉන්නව නම් කොටසක් ඉතුරු වෙලා ඉන්නව තව ටිකක්. ඒ ඉන්න අවංක සහෝදරවරුන්ටත් ආරාධනා කරනව. මේ රටේ වාමංශිකයන් එක්සත් කරන්න එකම ධජයක් යටතේ අපටත් ඕනැ. අපිට විතරයි ඕන ඒක. ඒක එක්කහු කරන්න මේ පීටරුයි ඈන් ඇමුයි එක්කහු කරල බෑ. කවදාවත්. පීටරුයි ඈන් ඇමුයි එක්කහු කෙරුවම වාමාංශික එක්සත් පෙරමුණක් හැදෙන්නෙ නෑ. සැබෑ වාමාංශික ටික ඕකෙ ඉතුරුවෙලා තව ඉන්න අය එළියට බැහැල එන්න. ඕගොල්ලොම සංවිධානෙම අරන් එන්න අපට කමක් නෑ. අපි ඕගොල්ලොන්ගෙ සංවිධානෙත් එකක් එක්කහු වෙන්න සූදානම්. හැබැයි පීටර්ල වගේ විප්ලවවාදී ව්‍යාපාරය දශක ගණනාවක් තිස්සේ පාවල දීපු ද්‍රෝහීන් සේරම මතක ඇතුව බේරෙ වැවේ ඔබල එන්න. (සභාවෙන් සිනා සහ අත්පොසලන්) ඒ ආයාචනය කරමින් තමුන්නාන්සේලාට නැවතත් මතක් කරනව අංක 14, කේ.සිරිල් සී. පෙරේරා මාවත, කොළඹ 13 ලිපියනට ලිපියක් එවන්න තමන්ගෙ ලිපිනය සහිතව වියට්නාම් විප්ලවය සුරැකීමේ ලංකා කමිටුවට බැඳෙන්න කැමති අය. මේ ප්‍රසිද්ධියෙ කීවෙ. රහස් පොලිසියෙ මහත්තුරුන්ටත් ඇප්ලිකේෂන් දාන්න පුළුවන්. (සිනා) හරිද? ඊළඟට සහෝදරවරුනි තව ප්‍රශ්නයක් තියෙනව කියන්න. අරං තියෙනව තීරණයක් 28 වෙනිදට වැඩ වර්ජනයක් බොහොම ඇදල ඇදල බැරි මරගාතෙ අරන් තියෙනව. අපි තාම දන්නෙ නෑ ඕක කොරයිද නැද්ද කියල මොකද උන්නැහෙල ගැන අපට හොඳ අත්දැකීමක් තියෙනවනෙ. කරනව නම් ජනතා විමුක්ති පෙරමුණ දෑතම උස්සල ෆුල් සපෝට් හරිද? (අත්පොළසන්) කරන්නෙ නැත්නම් කනෙන් අල්ලල ඔය නිලධාරි පැලැන්තියෙ නායකයො ටික, අවස්ථාවාදීන් දොට්ට දාන්නත් කම්කරු පංතිය මේ පාර වග බලාග න්නව එකට. අපි ඒකටත් ෆුල් සපෝට් (අත්පොළසන්) ඒ නිසා අපේ ස්ථාවරය ඒ පිළිබඳ ඉතාමත් පැහැදිලියි. ඒ වැඩ වර්ජනයට අපේ සියලු දෙනාම වැඩ වර්ජනය කරනව. ඒක සාධාරණ එකක්. ඉතාමත්. ඒක අපේ පක්ෂයේ ලියකියවිලි මගින් අපේ ස්ථාවරය අපි පැහැදිලි කරල තියෙනව. තවත් ඒ කියන්නෙ අපේ ඉල්ලීම් පිළිබඳව. ඒක උඩ උද්ඝෝෂණය කරන්න, සහයෝගය දක්වන්න, ක්‍රියාත්මකව. මං දන්නව අපේ සහෝදරවරු ගිය 18 වෙනිද බැංකු වැඩ වර්ජනය වෙලවෙදි

ක්‍රියාත්මක සහයෝගයක් දැක්වුව. අපේ පක්ෂයෙ තීරණයක් උඩ. මම එදා එංගලන්තයෙ හිටියෙ. එංගලන්තෙත් එක්ක ගමනායක සහෝදරයල බෝපගේ සහෝදරයල මාත් එක්ක සම්බන්ධම් තියල දැන්නුව. සහෝදරවරු ඉතාමත් විශිෂ්ට වැඩ කොටසක් ඉෂ්ඨ කළාය කියල. ඒ සඳහා අපේ පක්ෂයේ කෘතඥතාවය සියලුම හිතවතුන්ට මොකද සාමාජිකත්වයත්. වෙනුවන් හිතවතුන් කෘතඥතාවය පළකරන්න වෙලා තියෙනවනේ- හිතවතුන්ට අපි පළ කරනව.

සහෝදරවරුනි ඊළඟට තව ප්‍රශ්නයක් තියෙනව කියන්න. අපි පක්ෂ සංවර්ධන සතියක් පවත්වනව. පක්ෂ සංවර්ධන සතිය අපේ පොත්පත් අලෙවි කරන්න ගෙයින්ගෙට කැන්වසින් යන්න. හැම ගෙයක් ගානෙම අපි බලාපොරොත්තු වෙනව සැප්තැම්බර් මාසෙ මේ මාසෙ මැද හරියෙදි. ඒ සඳහා හැම සහෝදරයෙකුටම හිතවතෙකුටම අපි ආරාධනා කරනව අපි එක්ක එක්කහු වෙන්නෙයි කියල. ඒ සංවර්ධන සතියෙදි. ඊළඟට හොඳට මතක තියාගන්න දැන් ඔන්න ආයි ඇවිල්ල කියයි වැඩ වර්ජනයටත් මං විරුද්ධයි කියල හරිද? එහෙම තමයි කියන්නෙ දැන් මෙතෙන්දි කිව්වයි කියල. හෙට 'ඇත්ත' පත්තරේ තිබුනොත් පුදුම වෙන්න එපා. වැඩ වර්ජනවලට අපි විරුද්ධයි කියල. ඒ නිසා මතක තබාගන්න අපි වැඩ වර්ජනයට එක පයින් පක්ෂයි හරිද? (සිනා) ඒ විතරක් නොවෙයි මුං කරන්නෙ නැත්නං පන්නල දාල ඉදිරියට එන්නත් අපි යෝජනා කරනව. කම්කරු පංතියට. ඒ කියන්නෙ සැප්තැම්බර් 28 වෙනිදා මර්දනයට විරුද්ධව සහ අයිතිවාසිකම් උදුරා ගැනීමට විරුද්ධව සහ අයිතිවාසිකම් කප්පාදු කිරීමට විරුද්ධව. මේ සියලු කරුණු එතන තියෙන්න ඕන. ඒ සියලු කරුණුවලට විරුද්ධව තමයි කම්කරුවන්ගෙ සාධාරණ අයිතිවාසිකම් තුළින් දවසක වැඩ වර්ජනයක් මේ කරන්න හදන්නෙ සංකේත. ඒ සංකේත වැඩවර්ජනයට අපි සම්පූර්ණයෙන් පක්ෂයි. ඒ අනුව අපේ සහෝදරවරු සියලු දෙනාම ක්‍රියාත්මක වෙන්න අපේ හිතවත්තු සියලු දෙනාම ක්‍රියාත්මක වෙන්න එදාට.

ධනපති ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව ගැන ගත්තාම මේ පාර එකයි ගියපාර එකයි දෙකම එකයි හරිද? අරකෙත් මහජන ආරක්ෂක පනත්. අරකෙත් ස්ට්‍රයික් කළොත් දඩං ගාලා බැටන් පොල්ල වදිනව. (සභාවෙන් සිනා) මේකෙත් ස්ට්‍රයික් කළොත් දඩං ගාලා බැටන් පොල්ල වදිනව. හරිද? අරකෙත් සිද්ධිරස්ත කියල මොකක්ද එකක් කියල

අවසන් කරනව. මේකෙත් අවසාන කරනව එහෙමම. දෙකටම මහජන ආරක්ෂක පනත දාලා. අරකත් පුද්ගලික දේපළ ක්‍රමය රැක්ක. මේකත් පුද්ගලික දේපළ ක්‍රමය රකිනව. අරක හැදුවෙ කොල්වින් ආර් සිල්ව. මේක හැදුවෙ ජේ.ආර්. ජයවර්ධනල. ඔය වෙනස තමයි තියෙන්නෙ. ඉතින් අරකෙත් තියෙන මූලික වගන්ති මිනිස් අයිතිවාසිකම් පැහැර ගැනීම මේකෙත් තියෙනව. අරක වගේම ධනපති ව්‍යවස්ථාවක් මේකත්. අරකට විරුද්ධ වගේම අපි මේකටත් විරුද්ධයි. හැබැයි අරකට පක්ෂ වෙච්ච අය අරකට අත ඔසවපු අය අරක හොඳයි කියා නටාපු අය මේකට විරුද්ධ වෙනව. අපට තේරෙන්නෙ නෑ මොකද කියල. මටනම් තේරෙන්නෙ නෑ. කොල්වින් ඒකට පක්ෂ වුනානම් මේකට විරුද්ධ මොකද කියල. ඇන්.ඇම් ඒකට පක්ෂ වුනා නම් මේකට විරුද්ධ වෙන්නෙ මොකද කියල. පීටර් ඒකට පක්ෂ වුනානම් මේකට විරුද්ධ වෙන්නෙ ඇයි? අපට එක්කො මේ මිනිස්සුන්ගෙ තර්ක සාස්තරේ තේරෙන්නෙ නෑ. සාමාන්‍ය මිනිස්සුන්ට තේරෙන්නෙ නැති තර්ක සාස්තරයක් ඇන්.ඇම්ලට පීටර්ලට තියෙන්නෙ. සිරිමාවො ඒකට පක්ෂ වුණා. අප්පේ............. ඒකෙ අයිතිවාසිකම් ගන්න කොල්විනුයි සිරිමාවොයි තර්කත් කළා. අපේ අපේ කියල. දැන් මේකට විරුද්ධයි. ඇයි? හැබැයි එකක්.

අපි අනතුරු ඇඟවීමක් කරනව. ශ්‍රී ලංකා නිදහස් පක්ෂය ආයිත් කොටි නැටුමක් නටන්න පුළුවන් ජාතිවාදය අවුස්සල. ඒ අන්තරාවෙ ඉව අපිට දැනෙනව. විප්ලවවාදීන් වශයෙන්. ඒ ගැන ටිකක් මේ රටේ කම්කරු පංතියට පරිස්සම්වෙලා ඉන්න බිලි නොවී කියල. ඇයි? දැන් ඉස්සරහට දාන්න පුළුවන් ආයෙ 56 සෙල්ලම. භාෂා ප්‍රශ්නෙයි. ජාති ප්‍රශ්නෙයි අවුස්සන්න වාතාවරණයක් හදාගෙන යනබව පේනව. ජාතිවාදය අවුස්සල ඔක්කොම ප්‍රශ්න යටපත් කරල ජනතාවගේ දැවෙන ප්‍රශ්න යටපත් කරල ලබන පාර එන්නම් කියල. ඒක අපි වේලාසනින් අනතුරු ඇඟවීමක් කරනව. ඊළඟට විප්ලවවාදී ව්‍යාපාරයෙ වර්ධනයත් එක්ක මේ මිනිස්සුත් තවත් කරන්න පුළුවන් ඔන්න ගෙදරවල් ඉස්සරහට හොඳට බලාගෙන ඉන්න. කළුකොඩි ඔහෙල වෙනුවෙන් වෙන අය දාන්න පුළුවන්. දාල ඔහෙල ටික දවසක් පොලිසියෙ ගාල් කරල තියන්න. එතකොට මේ ජනතා විමුක්ති පෙරමුණේ වැඩ කරන්න බැරි වෙනවනේ. ඒ දේ කරන්න ඒක බොහොම අවශ්‍ය වෙලා තියෙනව. දැන්නම් කොහොමහරි ජනතා විමුක්ති පෙරමුණ නවත්වන්න ඕනැයි කියන තැනක තමයි ඉන්නෙ. අපේ පරණ සගයො ටික. ඉතින් ඒ අනතුරත් අඟවමින් අපි තමුන්නාන්සේලාට ඉල්ලීමක් කරනව. මේ සංවර්ධන

සතියට සහභාගි වෙන්න. අපි පැහැදිලි ලෙස අපේ ජයග්‍රහණය සඳහා නිර්ධන පංතියේ අපේ රටේ සමාජවාදී සමාජ විප්ලවය ජයග්‍රහණය සඳහා අපි කැපවීමකින් මෙතෙක් ආව වගේම ඉදිරියටත් යනව. ඕනැම බාධකයක් බිඳගෙන. දැන් ඉදිරියට වැඩකටයුතු වේගවත් කරන්න අපට සිද්ධවෙලා තියෙනව. මතකද හැම පැත්තකින්ම ගහන තත්ත්වය යටතේ. හැමෝම එක්කහුවෙලා දැන්. පොදු හතුරා වෙලා තියෙන්නෙ යූ.ඇන්.පී එකේ ඉඳල මාඕවාදී කල්ලි දක්වා ඔක්කොම එකට එක්කහු වෙලා. පීටර්, ඇන්.ඇම් ලත් පේනවනේ තත්ත්වය. මේක අපි ධෛර්ය සම්පන්න කරන තත්ත්වයක්. වඩවඩාත් අපට ජීව ගුණය වැඩිකරන තත්ත්වයක්. හොඳයි නරක දෙයක් නොවෙයි. අර පිදෙල් පාරක් කියල තිබුන තැනක, අපි විප්ලවවාදීන් පුරුදුවෙලා තියෙනවයි කියල ''සතුරා අපට ගහන ප්‍රමාණයේ ප්‍රතිශතය අනුව අපේ වැඩ හොඳයි කියල අපිට තේරුම් ගන්න'' ඒ කියන්නෙ අපි හරියට යනවයි කියල. ඉදිරියටත් කියන්න පුළුවන්. ඒ කියන්නෙ ඕනැම විප්ලවයක් ඒ විප්ලවයට ඕනෑම විප්ලවවාදී ව්‍යාපාරයක් ඒ විප්ලවවාදී ව්‍යාපාරයට විරුද්ධව කෙරෙන කරුණු උඩ තමයි ඒකෙ සාර්ථකභාවය රඳා පවතින්නෙ. ඒ වගේ මේ සියලුම අවස්ථාවාදීන් සියලුම ද්‍රෝහීන් එක්කහු වෙල අපට වැඩි වැඩියෙන් ගහනව නම් ඒක නරක දෙයක් නොවෙයි. ඒක හොඳ දෙයක් වෙලා තියෙනව. ඇත්ත වශයෙන්ම කියනවනම්.

ඉතින් ඒ නිසා සහෝදරවරුනි අපි තමුන්නාන්සෙලාට මේ හැන්දෑවෙ අර සුපුරුදු අපේ සටන් පාඨයෙන් සුභ පතනව දැන්. හැන්දෑවට තව ටිකකින් වියට්නාම් චිත්‍රපටියක් තිරගත කරනව. ලබන 22 වැනිදට හමුවෙමු. අපි මේ විදියට නොවෙයි රටේ දේශපාලන තත්ත්වය ගැන පළල් සාකච්ඡාවක් කරන්න. අපේ ඉදිරි ක්‍රියාමාර්ග ගැන පැහැදිලි සාකච්ඡාවක් කරන්න ලබන 22 වැනිදට බොරැල්ලෙ කැම්බල් පිටියේදි. එතෙක් අපි තමුන්නාන්සෙලාගෙන් සමුගන්නව.

**අධිරාජ්‍යවාදයට විනාශය - ජනතාවට විමුක්තිය!**

**ධනවාදයට විනාශය - සමාජවාදයට විජයග්‍රහණය!!**

(සභාවෙන් අත්පොළසන් හා සටන් පාඨ)